SLU NOVELS

UPLOADED BY ELIFE

රන් හුයක වසන්තය

පළමු මුද්‍රණය : 2000

ISBN : 955-8365-37- 8

© ප්‍රණීතා කාංචනී අබේවික්‍රම

අකුරු සංයෝජනය හා පිටු සැකසුම : සංහිඳ ග්‍රැෆික්ස්

කවර නිර්මාණය : දිනිඳු සිරිවර්ධන (Sun+Moon)

මුද්‍රණය : සංහිඳ මුද්‍රණ.

ප්‍රකාශනය : සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන
අංක : 06, විජේරාම පාර,
ගංගොඩවිල, නුගේගොඩ
☎ 827679

එකල මා ලස්සන යැයි ඔහු කියයි. එහෙත් මට නම් මා පෙණුනේ මී පැටවකු තරම් නොවැදගත් ලෙසයි.

එහෙත් එදාට වඩා මා අද රූමත් බව එඩ්වඩ් කියයි. මා ඊට වඩා පාට වැටී, කම්මුල් රත් පැහැ වී ඇති බව ද දුඹුරු වරලස සහ ඇස් දිලිසෙන බව ද ඔහුගේ හැඟීමයි. මගේ විශ්වාසය නම් වසර දහයක ප්‍රීතිමත් විවාහයක් මගින් ඕනෑම කාන්තාවක සුන්දර කරනු ඇති බවයි. එහෙත් මට නම් තවමත් මගේ විශේෂ ලස්සනක් නැත.

"මං හිතන්නේ ජේන් ඔයා හිතන එක හොඳයි ඔයා කිසි වැදගැම්මකට නැති සරළ ගැණියෙක් කියලා. නැත්නම් ඔයා පටන් ගනී සමාජෙ ඉස්සරහට ගිහින් කැපී පේන්න. එතකොට ඉතිං ඔය ශාන්ත බවත් ඉවරයි." ඔහු කියයි.

මම නිතර ම හුදෙකලාව ප්‍රිය කරමි. සෝෂාකාරී උත්සව අපට තිබුණේ නැත. ඇත්තට ම අපට ආදරය කළ මිතුරන් හා ඥාතීන් කිහිප දෙනෙකු පමණක් ඇසුරු කිරීමෙන් මම සතුටු වීමි. ෆර්න්ඩීනයේ දී අපේ අමුත්තන් වූයේ යහපත් දේවගැති තුමා වන වෙදර්ෆීල්ඩ් මහතා සහ මහත්මිය, නිහඬ දිවියක් ගෙවූ ක්‍රෙන් මෙනෙවිය, එඩ්වඩ් ගේ විශ්වාසවන්ත මිතුරකු වූ ජොන් ලයින්, මගේ ඥාති සොයුරියන් වූ ඩයනා, මේරි සහ ඔවුන්ගේ ස්වාමි පුරුෂයන් පමණි.

අප ඉතසිතින් ප්‍රාර්ථනා කළ සමාගමය එපමණකි. අප විවාහ වූ අලුත රෝගී තත්වයෙන් සිටි එඩ්වඩ් පිටස්තරයන් ගේ ඇසුර ප්‍රිය නොකළේ ය. පසු කලෙක සුවපත් වූ පසුත් අපේ ජීවිතයේ පැවති නිහඬ බවට ඔහු ඇළුම් කළේ ය.

මගේ පැත්තෙන් බලන කල, ප්‍රීතිමත් ගැහැණියකට විශාල සමාජ ආශ්‍රයක් අනවශ්‍ය බව මගේ හැඟීමයි. ඇත්තෙන් ම මට ඊට ආශාවක් ද නොවී ය. මගේ ජීවිතයේ සියලු දේ වූයේ සැමියා සහ දරුවා ය. අවංකව ම කියතොත් මගේ ම සොයුරියන් හෝ මිතුරන් දිගු කලක් නිවසේ සිටීමෙන් පවා අපේ පුංචි ලෝකයට බාධා වේ යැයි මම සිතින් තැවුණෙමි.



UPLOADED BY ELIFE

WWW.EXPRESSLANKA.TK 1

ඉඳහිට මම කතාවෙන් පිට පනිමි. අතීතය පිළිබඳව නැවත මෙනෙහි කිරීම වේදනාවක් වුව ද මා එය ඔබට කිව යුතුව ඇත.

තෝන්ෆීල්ඩ් නිවස ගැන මම කුමක් කියම්ද? එහි මහානුභාවසම්පන්න පෙනුමක් තිබුණත්, එහි ඇතුළු වූ ප්‍රථම අවස්ථාවේ මා තුළ භීතියක් වැනි හැඟීමක් ඇති විය. ෆෙයාර්ෆැක්ස් නෝනා ගේ මිත්‍රත්වය ලැබුණත්, ග්‍රේස් පූල් නම් මෙහෙකාරියගේ අමුතු හැසිරීමෙන් මම වික්ෂිප්ත වීමි. උඩ තට්ටුවේ වූ ඇගේ මැහුම් කාමරයට කිසිවෙකුට ඇතුළු වීමට ඉඩ නොදෙන ලදී. අබිරහසක් පිළිබඳ හැඟීමක් මසිත ඇති විය.

එඩ්වඩ් රොචෙස්ටර් ගේ සැර පරුෂ බව නොසළකා මම ඔහුට ආදරය කරන්නට වීමි. එය අන් අය වෙතින් පමණක් නොව මා වෙතින් ම වසන් කර ගන්නට මම නිපල තැතක් දරුවෙමි. කෙසේ වුවත් ඔහුගේ ආදරය නොලැබෙන බව දන දනත් ඔහු දකීමටත් කතා කිරීමටත් මම ආශා කළෙමි.

පුදුමයකට මෙන් ඔහු මට ආදරය කරන්නට විය. ආදරය ප්‍රකාශ වීමෙන් පසු අපි විවාහය සැළසුම් කළෙමු. ශෝකාන්තය ඇරඹුනේ ඉන් පසුවයි.

අසරණ එඩ්වඩ්! ඔහු මා රැවටුවේ ඇයි? එහෙත් ඔහු වෙන මොනවා කරන්නද? වසර ගණනාවක් ම අභිකුණ්ඨික ජීවිතයක් ගත කළ එඩ්වඩ්, සිය ඔද්දල් වූ ජීවිතය ප්‍රාණවත් කළ හැකි අන්දමේ කෙල්ලක සොයා ගත් බව කීය. එහෙත් ඔහුට මා අවශ්‍ය වුව ද මා ලබා ගැනීම නීතියෙන් තහනම් විය.

ග්‍රේස් පූල් ගේ රැකවල් යටතේ නිවස තුළ සිරකොට සිටියේ එඩ්වඩ් ගේ බිරිඳයි. ඇය උමතු, වියරු ස්ත්‍රියක් වූවා ය. අප දෙදෙනා විවාහ වීමට ඔන්න මෙන්න කියා තිබිය දී එක් පුද්ගලයෙක් ඉදිරියට පැමිණ මේ රහස එළි කළේ ය.

මා බිරිඳ කර ගැනීමට එඩ්වඩ් සැරසුණත් මා කෙසේ එය පිළිගන්නද? අසරණ වූ මම පළා ගියෙමි.



පසුව නැවත අප හමු වන විට උමතු ස්ත්‍රිය විසින් ගිනි තැබූ තෝන්ෆීල්ඩ් මන්දිරය නටඹුන් වී තිබුණි. බිරිඳ ගින්නෙන් බේරා ගැනීමට ගොස් බරපතළ තුවාල ලබා දකුණු අත අහිමිව, අන්ධව සිටි එඩ්වඩ් ෆර්න්ඩීනයට ගොස් සිටියේ ය. ඔහු සිටියේ ජීවිතයත් මරණයත් අතරයි. නැවත ඔහු හමු වූ මම ඔහු කැමති වුණත් අකමැති වුණත් ඔහු අතැර නොයන බවට ගිවිස්සෙමි. එහි දී අප විවාහ වී අලුත් දිවියක් ඇරඹීමු.

ඉතිං මෙය කියවන ඔබ සිතන්නේ මා මගේ ප්‍රීතිමත් ජීවිතය ගැන ම උදම් අනනවා කියාද? මේ ප්‍රීතිය පහසුවෙන් ළඟා වූවක් නොවේ. ඒ වෙනුවෙන් අපි නොවිඳිනා දුක් වින්දෙමු.

ඒ අතීතයයි.

ෆර්න්ඩීනයේ ගත කළ වසර දහය තුළ අප අප ගැන සිතුවේ කෙසේ ද? මා ලස්සන යැයි එඩ්වඩ් කියයි. එය ඇත්ත වුණත් බොරු වුණත්, ඔහුට මා ලස්සනට පෙනෙන තාක් කල් මම කුමට ළතවෙම්ද? මා ජීවත් වන්නේ ඔහු ගේ ආලෝකයෙනි. එය නිවී ගියොත් මා කළුවර අගාධයක ගිලී යනු ඇත.

මගේ එඩ්වඩ්! ඒ වනවිටත් ඔහුගේ දුක්මුසු පෙනුම පහව ගොස් තිබුණේ නැත. අතීතයේ මෙන් ඔහු සැර පරුෂ නොවී ය. අපේ විවාහයෙන් ටික දිනකට පසු මම මේ වෙනස ගැන ඔහුගෙන් ඇසීමි.

"හැම මිනිහෙක්ම මං වගේ සතුටින් ඉන්නවනම් එහෙම තරහ යන්නෙ නෑ"

අපේ ගෙය කුඩා වූ නිසා මේරි, ජෝන් සහ ජෙරමි හැරුණු කොට අපට මෙහෙකරුවෝ නොවූහ. එහෙයින් ඉතා සුළු එහෙත් ප්‍රයෝජනවත් රාජකාරි බොහොමයක් මගේ අතින් ම ඉටු කෙරිණි. මම පුතා බලා ගත්තෙමි. මා වඩාත් ඇළුම් කළ බඩු මා අතින් ම පිරිසිදු කළෙමි. මේ වැඩට මම ඉතා ආශා කළෙමි.

අපේ ගෙවත්ත සැළසුම් කොට එහි විශාල ප්‍රමාණයක පැළ සිටවූයේ ද මමයි. පුතා පියවර නගන කාලයේ මම ගමේ පුංචි

UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 2

පාසලක් ඇරඹුවෙමි. ක්‍රේන් මෙනෙවියත් මමත් මාරුවෙන් මාරුවට එහි ඉගැන්වීමු. පාසලේ ළමුන් අධ්‍යාපනයෙන් ආලෝකය ලබනු දැකීම මට ඉමහත් තෘප්තියක් විය.

විවාහයේ මුල් දිනවල අපි ඉතා සතුටින් සිටින මොහොතක මගේ අත් සියුම් ලෙස පිරික්සූ එඩ්වඩ් මහන්සි වී වැඩ නොකරන්නැයි ඉල්ලා සිටියේ ය.

"අනේ එඩ්වඩ් ඔයා කියන්නෙ මට පුටු රත් කර කර නිකං ඉන්න කියලද? මට ලැබිල තියෙන මේ සතුට තවත් වැඩි වෙනවා මොකක් හරි පොඩි වැඩක් කළා ම. හැබැයි ඔයා කියනවානම් මම....... ඔයා හිතනවානම්......." මට ගොත ගැසිණි. මට අලුත් ජීවිතයක් දුන් ඔහු ගේ හිත රිදවීදැයි මම තැති ගතිමි.

එහෙත් මඳ සිනාවක් නැඟූ ඔහු කීවේ මෙපමණකි.

"මගෙ වස්තුව ඔයා හරි. ක්‍රියාශීලි වුණාම සතුට වැඩියි"

"ඔයා හිතන්නෙ මං ඔයාව ගණං ගන්නෑ කියලද?"

"ජේන්!" ඔහු සන්සුන් ය. "ඔයා තමයි මගෙ ඇස් දෙක. කාළකණ්ණියෙක් වගේ මැරෙන්න ගිය මාව බේරගත්තෙ ඔයා. දැන් මගෙ ඇහැත් හුඟක් හොඳයි. ඒ හින්දා ඔයා මං ළඟම දවටි දැවටි සාත්තු කරන්න ඕන නෑ. මං ඒකට ආස වුණත් ඒක අවශ්‍ය නෑ. රොචෙස්ටර්ලා කොහොමත් මුරණ්ඩුයි. ඒ පරම්පරාවෙ අන්තිමයා වෙන මමත් එහෙම තමයි. ජේන්, මම ඔයාව බැන්දෙ නර්ස් කෙනෙක් ඕන නිසා නෙවෙයි. ජේන්, ඔයාට කැමති දෙයක් කරන්න මට ඔයා වහලෙක් හැටියට තියාගන්න ඕනෙ නෑ".

මගේ නෙත් තෙත් විය. ඉස්සර නම් මම ඔහුට තරමක් බිය වීමි. බොහෝ දුක් විඳීම නිසා පෙරට වඩා හොඳ මිනිසෙකු වී ඇති ඔහු දැඩි ආත්ම ශක්තියකින් මෙන් ම මෘදු සිතකින් ද යුක්තය.

තවමත් හරිහැටි නොපෙනෙන ඇස් වලින් ඔහු මා දෙස බලන බව මට දැණුනි.



"ඔන්න ඉතිං අඬනවා. හිතනවද වයසක අන්ධ මිනිහෙක්ගෙන් ඒක හංගන්න පුළුවන් කියලා?"

"එඩ්වඩ් ඔයා කොච්චර ඉක්මනට සනීප වෙනවද?!"

ඇත්තෙන් ම අධිෂ්ඨාන ශක්තිය නිසා ඔහු ඉක්මනින් සුවපත් විය. දෑසේ පෙනුම පෙර පරිදිම තියුණු විය. දකුණත සේ ම හුරුවට වමත පාවිච්චි කිරීමට ඔහු ඉවසීමෙන් උගත්තේ ය. අතීතය සෙමින් වැළලී ගියේ ය. එඩ්වඩ් නිතර ම කී තමා රොචෙස්ටර් පවුලේ අන්තිමයා ය යන්න වෙනස් කරමින් ඔහු පුතකු ගේ පියෙකු වූ විට අතීතය සහමුලින් ම වැළලී ගිය බව මම විශ්වාස කරමි.

අන්‍යෝන්‍යාවබෝධය නිසා අතීතය අමතක කිරීම අපට ඉතා පහසු විය. එහෙත් එසේ අතීතය අමතක කොට දැමීම වෙනුවෙන් වන්දි ගෙවීමට සිදු වන අවස්ථා ද ඇත. ඒ අමිහිරි අත්දැකීම් අමතක කිරීම නිසා නැවත ප්‍රශ්නයක් මතු වූ කල එයට මුහුණ දීමේ හැකියාව අඩු වේ.

ඒ ඉතා අමිහිරි අඳුරු අතීතය අමතක කොට සතුටින් ජීවත් වීමට අප ගත් තීරණය නිවැරදිද? අප මුහුණ දිය යුතුව තිබූ ඒ අතීතයට පිටුපා අප ලැබූ අසීමාන්තික සතුට දශකයකට පමණක් සීමා වීද?



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 3

# 2

**ව**සර පන්සීයක පමණ සිට තෝන්ෆීල්ඩ් හි රොචෙස්ටර්වරු ජීවත් වී ඇත. වසර දෙසීයක සිට ම ඔවුන් ජීවත්ව ඇත්තේ ගින්නෙන් විනාශ වූ නිවසේ ම ය. අපේ විවාහයේ මුල් වසර දහය තුළ ම ඒ නිවස අත්හැර දමා තිබුණි. එහෙත් ගිම්හානයේ එක් දවසක් අප උදය අහාර ය ගනිමින් සිටිය දී එඩ්වඩ් තරමක් බැරෑරුම් ලෙස මෙසේ ඇසී ය.

"ජේන් ඔයා මට උදව් කරනවද?"

මට සිනා ගියේ ය. ඔහු කිසි දිනක මෙලෙස උදව් ඉල්ලා නැත. ඔහු නිතර ම කීවේ බිරිඳගෙන් උදව් ඉල්ලීම ඔහුට තරම් නොවන බවයි.

"නෑ ඇත්තමයි. මට ඔයාගෙ උදව් ඕනෙ. සහයෝගය කිව්වොත් වැඩිය හරි. මට තොන්ෆීල්ඩ් ගෙදරට යන්න ඕනෙ. ඔයත් එනවද...?"

මා ඇතුළතින් වෙව්ලා ගියේ ඇයි දැයි නොදනිමි. තෝන්ෆීල්ඩ් යන වචනය ඇසීමෙන් පමණක් අසුන්දර මතකයන් රැසක් මගේ හදවත දෙගොඩ තලා ගියේ ය.

"අයියෝ ඕකද උදව්ව? සුළු දෙයක්නෙ. මම එන්නම්. කවදද ඔයා යන්න හිතං ඉන්නෙ?"

"මේ දැන්. මට හිතුණා දැන් ම යන්න ඕනෙ කියලා."

"එහෙනම් ජේරම්ට කියන්නම් අශ්වයො ලෑස්ති කරන්න කියලා"

"හොඳ ජේන්, එහෙනම් අපට කන්නත් මොනව හරි ගන්න. අපි පරණ වත්තෙ සවාරියක් යමු."



එක් සඳ ඇති රැයක ඔහු මට ආදරය පළ කළේ ද මේ කියන උයනේ දී ය.

අප තෝන්ෆීල්ඩ් වෙත ළඟා වන විට මද්දහන පසු වී තිබුණි. කලින් තිබූ නිල් තණ පිටිය පුරාම උසට තණකොළ වැවී ඇත. නිවස සම්පූර්ණයෙන් ම දැවී අළු වී ගොසිනි. සිදු වී ඇති විනාශයත්, ජන ශූන්‍ය බවත් දීප්තිමත් හිරු එළිය නිසා වඩාත් ශෝක ජනක විය. අපි කලක ඇවිද ගිය කාමර, කොරිඩෝර දැන් මිනිසකු තරම් උසට ගොඩ ගැසූ සුන්බුන් පමණක් විය. දුමෙන් කළු වී ගිය සුන්බුන් හැම තැන ම විසිරී තිබුණි. අවසන් වරට මා මේ දර්ශනය දකින විට මා ඊට වඩා සිතුවේ එඩ්වඩ් ගැනයි. අනික් අතට එකල විනාශය සිදු වූ අලුතම ය. එහෙත් දශකයකට පසුව දැන් තොන්ෆීල්ඩ් හි දර්ශනය වඩාත් ශෝක ජනක විය. මා මේ නිවසේ කිසි දිනක සතුටින් ජීවත් නොවූවත්, එහි වත්මන් තත්ත්වය මා සසල කළේය.

එසමයෙහි කුඩා ඇඩිලේ ප්‍රීතියෙන් දිව ගියේ මේ කාමර අතරිනි. මා වැඩිහිටි කාන්තාවක සේ සමාජයට පිවිසෙන්නට තැත් කළේ ද මේ කාමර අතරිනි, මගේ ආදරණීය එඩ්වඩ් හැදී වැඩුණේ ද මේ නිවසේ ය. හැඬුමක් වළකා ගැනීමට තදබල ප්‍රයත්නයක් දරමින් කඳුළු පිරි දෙනෙත් නටබුන් වූ නිවසින් මෑත් කර ගත් මම ගෙඋයන දෙස බැලීමි.

තාප්පය කැඩී ගොස් ය. සමහර විට කව්රු හෝ තාප්පය කඩා ගඩොල් සොරකම් කරන්නට ඇත. හැම තැන ම වල් බිහි වී ඇත. කුඩා ක්‍යුපිඩ් ප්‍රතිමාව කිළිටි වී ගොස්ය. කෙසේ වෙතත්, ගෙඋයනට එපිටින් වූ ගස් නම් හරිත වර්ණයෙන් සැරසී ඉදුණු ඇපල්, පෙයාර්ස් දරා සිටිනු පෙණිනි.

"අර බලන්න එඩ්වඩ්. වත්තෙ ඇපල් ඉදිලා නේද?"

ඔහු සිනාසුණේ ය.

"මං දැක්කා ඔයාගෙ කඳුළු. ඔයා මගෙන් හංගන්න හැදුවට වැඩක් නෑ. අපි වත්ත අතෑරල දැම්මත් ඔය ගස් හැමදාම පල



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 4

ගන්නවා. ඒ වත්තෙදි නේද අපේ හිත්වල තිබ්ච්ච ආදරේ එළියට ආවේ? ඒ කාලෙ ඔයා සතුටින් නේද හිටියෙ ජේන්?"

"අනේ ඔව් එඩ්වඩ්" ඔහුගේ උණුසුම් බැල්මත් මෘදු සිප ගැනීමත් සිහි කරමින් මම කීමි. පසු කලෙක අත්විඳීමට සිදු වූ වේදනාවන් මම සිහිපත් නොකළෙමි.

ඔහු සිනාසුණේ ය.

"ඔයා තොන්ෆීල්ඩ් ගැන හිතලා අඩන්න ඕනෙ නෑ. ඔයාට තියෙන්නෙ වචනෙ දෙක එක විතරයි."

ඔහුගේ තුරුලේ එතරම් සමීපව සිටි මට ඔහු ගේ අරමුණ වහා වැටහිණ. ඔහුට අවශ්‍යව ඇත්තේ සිය පාරම්පරික නිවස නැවත ඉදි කිරීමටයි. එය පෞද්ගලික ආශාවක් පමණක් නොව පවුලේ වගකීමක් ද වෙයි. එහෙත් මා කිසිසේත්ම නැවත තෝන්ෆීල්ඩ් වලට පැමිණීමට අකැමති බව මගේ යටි සිත දන සිටියේ ය. එඩ්වඩ් මට දක්වූ අසීමිත ආදරය නිසා තොන්ෆීල්ඩ් නැවත ඉදි කිරීම වැළැක්වීමට ද මට හැකියාව තිබුණි.

"ඔයා ආසද ආපහු මෙහෙ එන්න?"

"ඇත්තෙන් ම ඔව් එඩ්වඩ්. ඔයාගෙ ආසාව ඒක නම් මම කැමැති යි."

"නෑ සුදූ. මගෙ ආසාව නිසා නෙවෙයි. ඔයත් කැමති වෙන්න ඕනෙ නැත්නම් අපට සතුටින් ඉන්න බැරි වෙයි."

ඔහු කියන්නේ ඇත්තකි. ඔහු ගේ සතුට මා ය. ඔහුගේ සැළසුමට මා අකමැති නම් ඊට හේතු දක්වීමට අපේ වළ දමූ අතීතය නැවත ගොඩ දැමිය යුතු ය. එහෙත් දන් එඩ්වඩ් එය අමතක කොට දමා ඇති නිසා තවත් එය ම සිහි කරමින් ඔහු පෙළන්නට මම අකමැති වීමි. මා තෝන්ෆීල්ඩ්හි ජීවත් වූයේ කෙතරම් බියෙන් හා ශෝකයෙන් දැයි ඔහුට කෙලෙස වටහා දෙන්නද? කෙසේ වෙතත් ඔහු මා කියන්නක් කරනු ඇත. එහෙත් එවිට ඔහු දුක් වේවි! මගේ විරුද්ධත්වය හිතුවක්කාර කමක් ලෙස ඔහුට



පෙනේවි. මා ඔහුගේ පවුලේ ගෞරවය රැක ගැනීමට සහය නොදෙන බිරිඳක ලෙසත්, පුතුගේ උරුමය පැහැර ගන්නා මවක ලෙසත් ඔහු සලකාවි.

ක්ෂණයකින් මම මේ සියල්ල දක්කෙමි. සියල්ලට වඩා මම එඩ්වඩ් අසතුටු කිරීමට අකැමති වීමි. අකැමැත්තෙන් හෝ නිවස නැවත සෑදීමට සහය දිය යුතු ය. එහෙත් ඔහුට බොරු කීමට ද බැරිය. ඔහුගේ බඳ වටා වූ දෑත් තවද තව කළ මම කළුවන් දෑසට එබුණෙමි.

"ඔයා ඉන්නෙ කොතනද, එතන තමයි මගෙ ගෙදර"

"හොඳ ජේන්, ඔයා ඉතිං කවදාවත් ඔයාට ම කියලා මුකුත් ඉල්ලනවද"

"ඔයාගෙ ආදරේ විතරක්"

අන්තිමේ එය සිදු වුණි. සැළසුම් ඇඳුණි. දක්ෂ ශිල්පීන් ගෙන්වා උපදෙස් දෙන ලදී. වසරක දී සියලු වැඩ නිම විය. සියල්ල අවසන පැරණි නිවසට සෑම අතින් ම සමාන නිවසක් ඉදි විය.

ඒ වසර අවසාන වීමට ප්‍රථම තෝන්ෆීල්ඩ් හි රොචෙස්ටර්වරුන් ලෙස උසස් සමාජයේ ජීවත් වීමට අවශ්‍ය සියල්ල සූදානම් කෙරිණි. ඇත්තෙන් ම, ගිම්හානයත් සරත් සමයත් අතර කාලයේ දී ෆර්න්ඩීනයේ ගොයම් කපා අස්වනු ගෙට ගත් මොහොතේත්, ගෙවත්තේ ඉදුණු පළතුරු කඩද්දීත් මගේ හදවත එන්න එන්නම දුකෙන් බර විය.

තෝන්ෆීල්ඩ් ගැන මා තුළ වූයේ භීතිය හා ශෝකය මුසුවූ මතකයන් ය. මා කෙලෙස නම් තෘප්තියෙන් ඒ දිවිය දෙස බලන්නද? කෙසේ වෙතත් මගේ සුන්දර විවාහ දිවියේ අඩිතාලම වූයේ ඒ කටුක මතකයන් ය. එහෙත් අහෝ! අතීතයේ විඳි වේදනාව!

සියලු කුණාටු නිම වී තිබුණ ද තොන්ෆීල්ඩ්හි පදිංචියට යාම පිළිබඳ අස්ථාන භීතියෙන් මම පෙළුණෙමි. එහෙත් ඒ හැඟීම් එඩ්වඩ්ගෙන් සඟවා ගැනීමට මා දරූ තැත සාර්ථක විය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 5

ගෙයි බිත්ති අහලෙන් අහල ඉහළ යද්දී අතීතය නැවත නොනැගිටින බවත් මේ පැරණි නිවස ම නොවන බවත් මම මට ම කියා ගතිමි. සෑම අතින් ම පැරණි නිවසේ ආකෘතියක් වුව ද එහි හැම ගලක් ම ගඩොලක් ම අලුත් ය. මුළු නිවසම නැවුම් ය. මගේ කැමැත්තට තෝරා ගත් ගෘහ භාණ්ඩ පැරණි ඒවාට වඩා වෙනස් ය. පුස්තකාලයේ පොත් පවා වෙනස් වනු ඇත. නිවස ගිනි ගත් මොහොතේ පැරණි අණ වින කොඩිවින සියල්ල විනාශ වී යන්නට ඇතැයි මම මට ම කියා ගතිමි.

මම අලුත් නිවසේ හොඳ පමණක් සිහි කිරීමට වෑයම් කළෙමි. නව ගෘහ භාණ්ඩ, දොර රෙදි, බිතු සිතුවම් තෝරා ගැනීමට මට අවස්ථාව ලැබෙනු ඇත. වල් බිහිව ගිය උද්‍යානය අලංකාර කිරීමට ද මට හැකි ය. කෙසේ වුවත් මගේ හදවත මා දුර්වල කරවී ය.

අඩු තරමේ ගෙළයනට එපිටින් ඇති තෝන් කැළය විනාශ කිරීමට බැරිදැයි මම බැගෑපත් ලෙස එඩ්වඩ්ට යෝජනා කළෙමි. තෝන්ෆීල්ඩ් මන්දිරයට ඒ නම ලැබුණේ ද මේ තෝන් කැළය නිසාය. වසන්තයේ දී පෙණ වැනි පොහොට්ටු වලින් වැසෙන මේ ගස් ගිම්හානයේ දී තද කොළ පාටක් ගනී. එහෙත් ශීත ඍතුවේ දී ඒවායේ දරදඬුව ඇඹරී ගිය අතු, සම්පූර්ණයෙන් ම කොළ වලින් තොර විය. ඇඹරුණු අතු සඳ එළියේ අවතාර සේ දිස් විය. සිහින් අතු කෙනෙකුට දොස් පැවරීමට දික්වූ ඇඟිලි සේ විය. නිවසේ එක් පැත්තක ජනෙල් කිහිපයකින් පෙණුනු මේ දසුන මට නම් සිත පාරවන සුළු විය.

එහෙත් මගේ යෝජනාවට ඔහු එක්වර ම විරුද්ධ විය. ඔහුගේ හඬ කාරුණික වුවත් ස්ථිර විය.

"ඒ ගස් කැතයි වෙන්න පුළුවන්. ඒත් ඒවා තමයි මේ තෝන්ෆීල්ඩ් වල ආත්මය. මේ ගෙදරට නම ලැබුණෙ ඒ ගස් හින්දයි. ඉස්සර මිනිස්සු කිව්වලු තෝන් ගස් විනාශ වුණොත් ඒක අපේ පවුලෙත් අවසානය කියලා. අපි අමතක කරන්න හොඳ නෑ, අපේ පරම්පරාවෙ සංකේතය තමයි මේ ගස්...



දන්නවනෙ ජේන්. උසස් පවුලක සිරිත තමයි අතීතය අමතක නොකරන එක. ඒ නිසා මම තෝන් ගස් ටික මෙහෙමම තියා ගන්නවා හොඳේ."

එසේ කියමින් ඔහු මා උණුසුමින් වැළඳ ගත්තේ ය. ඔහු පෙන්වා දුන් හේතු මා තුළ තදින් කා වැදීම නිසා තෝන් ගස් කපා දැමීමේ අදහස මම ඉවත දැම්මෙමි. එහෙත් අඩු තරමේ තොන් කැළය පැත්තේ ඇති ජනෙල්, ඝණ තිර වලින් වසා දැමිය යුතු ය.

එඩ්වඩ් ගේ පරම්පරාව ජීවත් වූ, පසුව ජොනතන්ට අයිති වන නිවසේ නැවත පදිංචියට යාමට එඩ්වඩ් තුළ වූ නොඉවසිල්ල මම හොඳින් දුටුවෙමි. එහෙයින් තෝන් කැළය හා නිවස පිළිබඳ මගේ අදහස් පිට වීමට ඉඩ නොදුන්නෙමි. ඔහු වෙනුවෙන් මා තොන්ෆීල්ඩ් නිවසේ ගෘහණිය බවට පත් වී මගේ ස්ථානයට ගරු කළ යුතුය. ආදරණීය ෆර්න්ඩීනයේ ගත කළ අවසන් දින කීපයේ මා සිතුවේ මට ලැබී ඇති සතුට වෙනුවෙන් සුළු ගෙවීමක් කිරීමට ඇති බවකි.

මනසින් පමණක් ආදර එඩ්වඩ් සමග ෆර්න්ඩීනයේ උණුසුම් නිවසේ රැඳී සිටින්නට මට ඉඩ හරින්න. කුරුල්ලන් කැදලි කරා යන වේලේ ඔහු ගේ අතින් ගෙන හිරු එළියේ තනි වන හැටි මට තවමත් මැවී පෙනේ.

දැන් මා ඔබ ගෙන යන්නේ, මා එවකට දැන නොසිටි පුද්ගලයන් හා මා ඇතුළත් නොවූ සිදුවීම් හමුවටයි. පසුගිය මාස කීපය තුළ මම මහත් වේදනාවෙන් මේ කතාව ගොතා ගතිමි. අපේ ජීවිත වලට දරුණු ලෙස බලපෑ එක්තරා කාන්තාවන් දෙදෙනෙකුගේ එංගලන්ත සම්ප්‍රාප්තිය මා දැසින් නොදුටුවත්, එය දුටුවාක් සේ විස්තර කිරීමට දැන් මට පුළුවන.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 6

# 3

සැප්තැම්බරයේ එක් රාත්‍රියක ප්‍රංශයේ සිට එංගලන්තය බලා යාත්‍රා කළ නැවකි. එහි කාමරයක එක්තරා කාන්තාවෝ දෙදෙනෙක් තනි වී සිටියහ. මුහුදු ගමන රළු විය. නැව උස් පහත් වන වේගය දරා ගත නොහැකි එක් කාන්තාවක් රතු විල්ලුද කච්චියක ඉතා සුදුමැලි ලෙස ඇළ වී, විශාල රතු කැට බැඳි මුදුව සහිත අත නළලේ තබාගෙන සිටියාය. තද කළු පැහැ කැරලි ඇති ඇගේ කොණ්ඩය මත කුඩා ලේස් කැප් එකක් විය. ඇය කළු සිල්ක් රෙද්දෙන් කළ අගනා ගවුමක් ඇඳ සිටියා ය. දිගටි මුහුණේ වූ දිගු ඇසි පිහාටු සහිත කළු පැහැ ඇස් අනෙක් කාන්තාව වෙත එල්ල වී තිබුණි.

ඇගේ නළල පිරිමදිමින් සිටි දෙවන කාන්තාව, ඇය සනසමින් "දන් ළඟයි ජස්ටින්" යයි ප්‍රංශ බසින් කීවා ය. රතු දුඹුරු පැහැ ඇගේ කොණ්ඩය ලිහිල්ව දෙවුර මත වැටී තිබුණි. තද රතු පැහැ වැඩ දමූ ලිහිල් ගවුමක් ඇඳ සිටි ඇය වර්ණවත් කිරිල්ලියක් බඳු විය.

පළමුවන කාන්තාවට මේ මුහුදු ගමන දරුණු ලෙස බලපා තිබුණද, දෙවන කත නම් ඉතා උනන්දු සහගතව ඉන්නාක් සේ පෙනුණි. ඇගේ කම්මුල් මද රත් පැහැ වූ අතර, සුන්දර දිගටි මුහුණේ වූ දිගටි දෑස් දීප්තිමත් විය. ඇය මිතුරියගේ හිස ඔසවා වතුර උගුරක් පෙව්වා ය.

සේවිකාවක් පැමිණ යමක් කීවා ය.

"ඇහුණද ජස්ටින්? මේරි කියනවා තව පැයකින් අපි ඩෝවර් වලලු" රතු ඇඳි කත කීවා ය.



"දෙවියන්ට ස්තුති වේවා"

නැගෙනහිර අහසේ මඳ ආලෝකය දුටු ඇයට නැව් තට්ටුවට යාමට තරම් සුවයක් දැණිනි. ලෝම ප්‍රාවරණයක් පොරවා ගත් දෙදෙනා නැව් තට්ටුව දෙස බලමින් පියගැට පෙළ අසළ සිට ගත්හ.

"අර බලන්නකො", කළු ඇඳගත් ගැහැණිය - ජස්ටින් කෑ ගැසුවා ය. ඇගේ සුදු දිග අත එදෙසට යොමු කරන විට රතු ගල් ඇල්ලූ මුදුව අඳුරේ දිළිසිණ.

"අර බලන්න. අර පේන්නෙ ඩෝවර් නේද?"

"තව ටිකකින් අපි එංගලන්තෙ. මට නම් හිතා ගන්නත් බෑ මේ අලුත් රට අපේ ඉරණමට කොහොම බලපායිද කියලා"

"ඔයාට නම් එංගලන්තෙදි කීර්තිය ලැබේවි. ඒක නම් මට විශ්වාසයි. ඒත් මම නම් එංගලන්තෙදි බලාපොරොත්තු වෙන්නෙ යුක්තියයි." කළු හැඳි ස්ත්‍රියගේ වචන හැඟීම්බර විය.

අනෙකා ලෝම ප්‍රාවරණය ඇද දෙදෙනා ම හොඳින් වැසෙන සේ සකස් කළා ය.

"හොඳයි. ඒත් මට නම් දුක හිතෙනවා. ඔයා යුක්තිය හොයන්නෙ ඔයාට ලොකු වැරැද්දක් කරපු කෙනෙක්ට විරුද්ධවනෙ. මං ඔයාට වැඳලා කියන්නම්. පළිගැනීමෙන් නම් යුක්තිය ඉෂ්ට කර ගන්න හදන්න එපා."

පහත් ස්වරයෙන් යුතුව ඇය කීවේ අවවාදාත්මක ස්වරූපයකිනි. "සමහර විට මට හිතෙනවා ඒ දෙක අතර තියෙන්නෙ පොඩි වෙනසයි කියලා" කළු හැඳි කත පිළිවදන් දුන්නා ය.

ඈත ගොඩ බිම සිට වේගයෙන් හිරු උදා වන අයුරු ඔවුහු දුටුවෝ ය. ලන්ඩනයේ දී දෙදෙනා වෙන් වූ හ. එකියක් ලන්ඩනයේ දී ජයග්‍රාහී වකවානුවක් ගත කිරීම සඳහා වෙන්ව ගියා ය. අනෙක් තැනැත්තිය උතුරු දෙසට ගොස් තෝන්ෆීල්ඩ් මන්දිරයට සැතපුම් දෙකකට එහා පිහිටි "හේ" නම් ගමේ පදිංචි වූවා ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 7

# 4

ඒ මාරක මුහුදු ගමන සනිටුහන් කළේ, භයානක වසංගතයක් පැතිරෙන්නාක් සේ අප වෙත ආ අඳුරු කාල පරිච්ඡේදයක ආරම්භයයි.

අප ෆර්න්ඩීනයේ සිටිය දී දිනක් එඩ්වඩ් ව්‍යාපාරික කටයුත්තක් සඳහා මැන්චෙස්ටර් බලා ගියේ ය, මා අසා තිබුණු දුර්ලභ රෙදි වර්ගයක් ගැන ද සොයා බලන ලෙස මම ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. තෝන්ෆීල්ඩ් හි ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹුණු පසු එහි නොගිය මා, එහි යාමට තීරණය කළේ මේ අවස්ථාවේ දී ය. මා ගියේ මා කැමති නිසා නොව යා යුතු වූ නිසා ය.

අප එහි පදිංචි වීමට පෙර මා සතු සියලු ධෛර්යය කැටි කොට ගෙන එහි ගොස් බැලිය යුතු බව මම දැන සිටියෙමි. නිවසේ පළමු දැක්මෙන් ම මා පසුබට වීමට ඉඩ තිබූ නිසා මා මේ අවස්ථාවට තනිව මුහුණ දිය යුතු විය. මගේ, සියලු මනෝභාවයන් එඩ්වඩ් කෙතරම් හොඳින් වටහා ගත්තේ ද යත්, ඔහුට දිවැස් ඇති බව කියමින් මා ඔහුට සරදම් කළ අවස්ථා ද වෙයි. එහෙයින් නව නිවසේ පළමු දැක්මෙන් ම මගේ මුහුණේ සතුටක් මිස අන් කිසිවක් දැකීමට එඩ්වඩ්ට ඉඩ නොතැබිය යුතුය.

පසුගිය වසර දහය ඇතුළත මම මේ නිවස දෙවරක් දැක තිබුණි. පළමු වතාව වූයේ මා එඩ්වඩ් සොයා එහි ගිය ගමනයි. ගින්නෙන් විනාශ වී ගිය නිවස දුටු මම, එඩ්වඩ්ගේ ජීවිතය බේරුණේ අනූ නමයෙන් බව ද දැන ගතිමි.

දෙවන අවස්ථාව වූයේ නිවස නැවත සෑදිය යුතු බව එඩ්වඩ් මට කී දිනයයි. දැන් නිවස සාදා අවසන් වීමට ද ළඟය.



ඒ උදෑසන කරත්තය සූදානම් කරන්නැයි ජෙරමිට අණ කළ මම, පුතු සිප සනසා, සියලු ධෛර්යය කැටි කොට ගෙන මගට බැස්සෙමි. අප නිවසට ළඟා වත් ම, මේ පැරණි නිවස ම නොවේ යැයි මම මට ම කියා ගතිමි. මේ නව නිවස ජේන් ඇගේ සැමියාත් දරුවනුත් වෙනුවෙන් පිළියෙළ කරන නිවසක් වේවි. නිවස අසළ දී රියෙන් බට මම විශාල තණ පිටියේ උසට වැවුණු තණ බිස්සේ නැවතුණෙමි.

ඇඩිලේ ගේ ගුරුවරිය ලෙස ඉතා බියාදු හැඟීමෙන් මා ඇතුළු වූ ඒ නිවසත්, දැන් ඉදි වී ඇති මේ නිවසත් එකක් ම බව මට හැඟිණ. වෙනස් වූ තැනක් ඇද්දැයි මා පරීක්ෂා කළද එවැන්නක් නොපෙනේ. මෙය පැරණි තොන්ෆීල්ඩය ම විය. මගේ පැමිණීම අනතුරක් ලෙස දැණුනු නිසාදෝ එල්ම් ගස්වල ලැග සිටි කපුටු රංචුවක් කෑ ගසමින් පියඹා ගියහ.

ගෙඋයනේ ගස් වල කොළ හැලෙමින් තිබිණ. නිවසින් සැතපුමක් පමණ ඈතට දිස් වූ තණ පිටි ද දුඹුරු පැහැයට හැරෙමින් තිබුණි. සුළඟක් හමා ආ බැවින් මම කබාය ඇඳ හොඳින් පෙරවා ගතිමි.

නිවස ඇතුළත මුළුමනින් ම පාහේ තනා අවසන් විය. එහෙත් මගේ සැළසුම් වලට අනුව නිවස ඇතුළත සැහැල්ලු බව හා නවතාව ඇති වී ඇත්දැයි බැලීමට යාමට මම මැළි වුණෙමි. පැරණි තොන්ෆීල්ඩ් නිවස සුන්දර වුවත් භයානක විය. එහි වූ පරිසරය දරුවන්ගේ නිරෝගී වර්ධනයට බාධාවක් විය. ඒ මළානික ස්වභාවය නැති කිරීමට එවකට ෆෙයාර්ෆැක්ස් නෝනා ගත් උත්සාහය ගඟට කැපූ ඉණි සේ විය. උමතු ස්ත්‍රිය රහසේ රැක බලා ගැනීමට යෙදූ මෙහෙකාරිය වූ ග්‍රේස් පූල් ද එකල එහි සිටියා ය. විශාල රහසක් සඟවා ගෙන ජීවත් වූ එවන් අද්භූත ගැහැණියක් සිටින නිවසක් කෙසේ නම් සැපවත් තැනක් වේද?

නිවසේ තෙවන මහල වෙත මගේ ඇස් නිරායාසයෙන් ඇදී ගියේ ය. නිවසේ අනිත් මහල් වලට වඩා කුඩා වුවත් එය කෙසේවත් සොල්දරයකට සම කළ නොහැකි විය. එහි කාමර එතරම් ම



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 8

විශාල ය. එක් පසෙක වැඩකාරයන්ගේ කාමර වූ අතර අනෙක් පැත්තේ ග්‍රේස් පූල් ගේ නිදන කාමරය සහ මැහුම් කාමරය විය. මැහුම් කාමරයේ එක් තැනක ආවරණය කරන ලද දොරකින් වැසුණු තවත් කාමරයක උමතු ස්ත්‍රිය රඳවා තිබුණි. ඒ කාමරයේ කිසියම් රහසක් වූ බව වැඩකාරයන් දන සිටින්නට ඇතත්, ෆෙයාර්ෆැක්ස් නෝනා එය නොදන සිටි බව මම ඉඳුරා දනිමි.

මම ළඟ දී ඇයට ලිව්වෙමි. ඈ දනට එඩ්වඩ් විසින් සපයනු ලබන කුඩා විශ්‍රාම වැටුපෙන් ජීවත් වෙයි. නැවතත් තොන්ෆීල්ඩ්හි පාලිකාව වන ලෙස මම ඇගෙන් ඉල්ලීමි. ෆර්න්ඩීනයේ සිටියදීට වඩා අප මෙහි දී උත්සවාදිය පවත්වන නිසා, මේ විසල් නිවස පාලනය සඳහා මට ඇගේ සහය ඇවැසි වේවි. තවත් වැදගත් හේතුවක් ඇත. ලබන වසන්තය වන විට මා දනට වඩා කාර්ය බහුල වේවි. ජොනතන්ට සොහොයුරෙකු හෝ සොහොයුරියක ලබා දීමට එඩ්වඩුත් මමත් සූදානමින් සිටිමු.

ෆෙයාර්ෆැක්ස් නෝනා ඇගේ හුදෙකලා වාසය අතැර අප වෙත එනු ඇතැයි මම විශ්වාස කළෙමි. එඩ්වඩ් නිවසින් බැහැර ගිය කල මට ඇගේ සමාගමය ඇවැසි වනු ඇත. මගෙන් වෙන්ව සිටීමට එඩ්වඩ් අකැමති වුවත්, ව්‍යාපාර කටයුතු සඳහා මැන්චෙස්ටර් හෝ සමහර විට ලන්ඩන් බලා යාමට ද ඔහුට සිදු වේ. මේ නිවසේ පෙර වූ බිය මට මතකය. දන් එය සම්පූර්ණයෙන් ම පහව ගොස් තිබුණ ද මා තුළ වූ කිසියම් මිත්‍යා හැඟීමක් නිසා එඩ්වඩ් නොමැති අවස්ථාවල මට මිතුරියක ගේ සහය අවශ්‍ය විය.

නිවස තුළ ශබ්දයක් ඇසිණ. ඉණිමඟක් ඔසවා ගත් මිනිසුන් දෙදෙනෙක් ඉදිරි දොරින් පිටතට පැමිණියහ. ඔවුන් මා දක හිස වනා සුබ පැතුහ. මා නොහඳුනන ඔවුන් සිතන්නට ඇත්තේ මා නිවසේ ඉදිකිරීම් බැලීමට පැමිණි අමුත්තකු බවයි. මම ද හැඳින්වීමක් නොකළෙමි. මා පැමිණියේ නව නිවස දක ඊට හුරු වීම සඳහා ය. දන් එය ඉටු විණි. එය ප්‍රමාණවත් ය.

පාත මාලයේ ජනේලයක් වෙත ඉණිමග තැබූ මිනිස්සු දෙදෙනා එහි නැග බිත්ති පාට කරන්නට වූහ. සීත සුළඟක් හමා ගියේ ය.



ගල් ගැසී ගිය මම, උඩ තට්ටුවේ දුක්මුසු පෙනුමැති ජනෙල් කවුළු දෙස බැලීමි. මට විශාල වේදනාවක් ගෙන දුන් ඒ ගැහැණිය රඳවා සිටියේ එහි ය. ඈ තුළ වූ දුෂ්ට කම තවත් සුළඟක් සේ මා වටා හමන්නාක් මෙන් මට දැණුනි. ඈ මිය ගියත් ඈ පිළිබඳ කිසියම් දෙයක් තවමත් තෝන්ෆීල්ඩ්හි රැඳී ඇති සේ ය. ඈ කොහේ වළ දම්මාදැයි මට මෙතෙක් කල් සිතී නොතිබුණි. ඈ විසින් ගිනි තැබූ නිවස ම ඇගේ චිතකය වන්නට ඇත.

මේ හැඟීම් කෙතරම් ප්‍රබල වී ද යත් මම වෙව්ලන්ට වීමි. හමා ආ සීත සුළඟ ද ඊට හේතු වන්නට ඇත. හැකි ඉක්මනින් ආරක්ෂා සහිත ෆර්න්ඩීනය වෙත යන්නැයි මසිත බල කළේ ය.

අළු මතින් නැඟී සිටි මේ විශාල නිවස කිසිදු සුහදත්වයක් ඉසිලුවේ නැත. හදිසියේ මට හැඟුණේ එය මා වෙත කඩා පැනීමට සැරසෙන බියකරු සතකු බවයි. ජේන්! ජේන්! මම මට ම අවවාද කර ගත්තෙමි. මේ ගෙදර අතීතය දන් සිද්ධ වෙලා ඉවරයි. ඒකෙ අනාගතය නිර්මාණය කරන්නෙ තනිකර ම ඔයා. එලෙස ධෛර්යවත් වූ මම, ඔව්! මම මේ අලුත් ගෙය මට ඕන විදියට හදනවා යි සිතුවෙමි. මෙම හැඟීම් ඇති කර ගත් මම, කිසිවකු විසින් හඳුනා ගනු ලැබීමට පෙර රථය වෙත ගියෙමි.

මා යා යුතු තවත් තැනකි. ජෙරමිට මදක් රැඳෙන සේ අණ කළ මම, වම් පැත්තට වන්නට විහිදෙන රළු පාර දිගේ මඳ දුරක් ගොස් තෝන් ගස් දෙස බැලීමි. තැනින් තැන හුදෙකලා වූ ඒ ඇඹරී ගිය ගස් හතළිහ ම තවමත් හරිත වර්ණයෙන් බැබළුණි. කුරුල්ලකුගේ සෙළවීමක් වත් නැත. සුළඟින් ගස් වල අතු වෙව්ලවීය. ස්ථානයේ පාළුව තවත් වැඩි කිරීමට දෝ වලාකුළක් පැමිණ හිරු මුවා කර ගත්තේ ය.

ශීත සෘතුවේ තෝන් ගස් වල දර්ශනය මට මැවී පෙනුණි. අඳුරු අහසත් වියළී ගිය තණකොළත් අතර වූ තෝන් ගස් වල සුදු පැහැ කඳනුත් අතුත් ඇඹරී උල් වී, කොළ වලින් තොර වෙයි. මම කිළිපොලා ගියෙමි. අතීත රොචෙස්ටර්වරයෙකු මේ ගස් කපා දම්මා නම් කොපමණ හොඳද? මා ආපසු හැරී රථය වෙත ගියේ



UPLOADED BY ELIFE

WWW.EXPRESSLANKA.TK 9

සතුටින් නොවේ. එහෙත් නිවස හා ඉපැරණි තෝන් වනය යන්තමින් හෝ අවබෝධ කරගත් නිසාදෝ මා තුළ නිර්භීත ගතියක් ඇති විය.

බොහෝ වේලා පුතු ගෙන් වෙන්ව සිටීම මට එකල අසීරු වුව ද, සැතපුම් දෙකක් එහා ජීවත් වූ "හේ" ගමේ පූජක තැන බැහැ නොදක ආපසු යාම මට තරම් නොවී. අප බොහෝ කලක සිට දන හැඳින ගෙන සිටියත් ඔහු මුණ ගැසීමට මම එතරම් ප්‍රිය නොකළෙමි. ඔහු කීප වරක් ෆර්න්ඩීනය වෙත පැමිණ තිබුණත් ඒ මුණ ගැසීම් එතරම් ප්‍රිය ජනක නොවී ය. මට ඔහු පෙනුණේ වගකීමෙන් තොර කෙනෙකු ලෙසයි. තරබාරු මිනිසකු වූ ඔහු පිරිසිදු ඇඳුමින් නිතර සැරසී සිටියේ ය. ඔහු නිතර දක්ක හැකි වූයේ දිළිඳු පැල්පතක නොව ධනවත් නිවසකය. අවිවාහකයකු වූ ඔහුගේ සම්පූර්ණ සැපපහසු නිවසේ වගකීම දරුවේ ප්‍රධාන මෙහෙකාරිය වූ විලෝස් මහත්මියයි.

එහෙත්, ඇත්ත වශයෙන් ම ටොඩ් පූජක තැන පිළිබඳ මා තුළ වූ උදාසීන සිතිවිලි කෙසේ හෝ වළකා ගත යුතුව තිබුණි. මගේ අවාසනාවන්ත පළමු විවාහයට වූ හදිය ඔහු කලින් සිටි පූජකයාගෙන් අසා ඇතුවාට සැක නැත.

මේ නිසා මේ මිනිසා හමු වීම අනිවාර්යයෙන් කළ යුතු විය. කෙසේ වුවත් දන් අපි ආපසු තෝන්ෆීල්ඩ් හි පදිංචියට ඒමට සූදානම් ය. ඒ නිසා තොන්ෆීල්ඩ් හි හිමිකාරිය වශයෙන් ගමේ පූජකවරයා බැහැ දකීම යුතුකමක් විය.

තොන්ෆීල්ඩ් සිට හේ දක්වා වූ පාර කිසිසේත් ම ධාවනයට සුදුසු නොවී ය. ශීත කාලයේ නම් එය අඩි පාරකටත් අන්ත විය. භූමියේ නැග්ම සහිත ප්‍රදේශයේ වූයේ දිළිඳු ගොවි පොළවල් කීපයක් හා මිනිරන් පතල් කරුවන්ගේ පැල්පත් ය. භූමිය වඩා පැතලි මෙන් ම සාරවත් වූ පාරේ අනිත් පස කොටස ගමේ හොඳම කොටස විය. ඒ හරහා නැවත තොන්ෆීල්ඩ් වෙත රවුමෙන් යා හැකි අශ්ව ලාඩමක හැඩැති පාර දෙපස තරමක් වැදගත් ගෙවල් ද, පූජක තැන ගේ ගෙය හා පල්ලිය ද විය. තෝල්ෆීල්ඩ් සිට



පල්ලියට යාමට පාරවල් දෙකකි. එකක් ප්‍රධාන පාර ය. අනෙක කුඹුරු මැදින් වැටී ඇති අඩි පාර යි. මම දෙවන පාරේ නොයාමට තීරණය කළෙමි. මගේ ප්‍රථම විවාහ දිනයේ අප ගියේ ඒ පාරෙනි. පැරණි මතකයන් අවදි කරන්නේ කුමට ද?

අපේ රථය හේ වෙත ළඟා වීමත් සමඟ ගමේ ගැහැණු මිනිස්සු නිවෙස් වලින් එබී බැලුවේ මහත් කලබලයෙනි. අප තෝන්ෆීල්ඩ් වෙත යන ගමනේ ද ඔව්හු එසේ ම කැළඹුණහ. අපිරිසිදු ළමයි දෙදෙනෙක් කටේ ඇඟිලි රුවාගෙන අප යන දෙස බලා සිටියහ. කිකිළියක කකුල් දෙකෙන් එල්ලා ගත් ගැහැණියක් නිවසේ දොරකඩ සිට අප දෙස බැලුවා ය. ඈ අසළ මඩ සහිත පොළවේ කුඩා දරුවෝ කීප දෙනෙක් වූහ. රථය තානායම පසු කරත් ම ඉන් පිටත සිටි මිනිසෙක් බිමට කෙළ ගැසී ය. සුන්දර තණ බිම් ඇති හේ හි පහත් කොටසට අප ළඟා වන විට මට සතුටක් දැණිනි. ඉතා හොඳින් පවත්වාගෙන යන ගොවි ගෙවල් කීපයක් පසු කළ අපි තැපැල් කාර්යාලයක් සහ කුඩා වෙළඳ සැලක් ඇති පහළ හේ වෙත ළඟා වීමු. ඉතා හොඳින් රැක බලා ගන්නා උද්‍යානයකින් වට වූ දේවස්ථානය ඉදිරිපස උසස් නිවාස කීපයකි. දේවස්ථානයත් සමඟ ම පූජක නිවස විය.

ඒ විශාල නිවස ඉදිරියේ විශාල උද්‍යානයකි. නිවස පිටුපස ද අක්කර බාගයක තරම් ප්‍රයෝජනවත් ඉඩමක් වූ බව මම දන සිටියෙමි. අප එහි ළඟා වත් ම මා දුටුවේ උයන් පල්ලාට යම් උපදෙසක් දෙමින් සිටි පූජකවරයාගේ ස්ථූල සිරුරයි. මගේ රථය දුටු වහා ම ඔහු එදෙසට ආවේ ය. ජෙරමි රථය නවතා මට බැසීමට උදව් කරනු බලා සිටි ඔහුගේ රත් පැහැ මුහුණේ නිල් දෙනුවන් විශාලව ගියේ ය. මුල දී නම් ඔහුට දෙනෙත් අදහා ගත නුහුණු බව මට පෙනී ගියේ ය. පසුව මා හඳුනා ගත් ඔහු "ඔහ්! හඬක් නැඟීය. ඉන්පසු ඔහු කලෙක තොන්ෆීල්ඩ් නිවසේ ගුරුවරිය වූ බියසුළු කුඩා ජේන් අයර් සහ දන් එඩ්වඩ් රොචෙස්ටර් මැතිණියට ආචාර කිරීමට පෙරට ආවේ පොපියන මුවින් යුතුව දැත දිගු කරගෙනයි. මට හැකි උපරිම ශාන්ත ලෙස සිනාසෙමින් ඔහු වෙත ගියෙමි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 10

"රොචෙස්ටර් නෝනා, රොචෙස්ටර් නෝනා! මේක නම් අදහන්නත් බෑ. කොච්චර ගෞරවයක් ද? යමු ගේ ඇතුළට. අයියෝ අපි ඔබ වෙනුවෙන් කිසි ම සූදානමක් නෑ. ඔබ මට පොඩ්ඩක් කලින් දන්නුවානම්. ඒකට කමක් නෑ. ඔබ මාව හමු වෙන්න ආපු එක ලොකු සතුටක්. මට සහතිකයි ඔබ අපේ අඩුපාඩු ගණන් ගන්න එකක් නෑ. එන්න ඇතුළට - කරුණාකරලා" යි කියූ ඔහු සම්පූර්ණ යටහපත් පහත් කමින් යුතුව, ආචාරශීලී ලෙස මා නිවස තුළට කැඳවාගෙන ගියේ ය. ඔහුගේ සුන්දර ආලින්දය හරහා විසිත්ත කාමරය වෙත යද්දී ඔහුගේ මුවින් රසවත් චාටු වදන් ගලා ආවේ ය.

තොන්ෆීල්ඩ්හි හිමිකාරිය වශයෙන් මගේ අනාගත වගකීම් ඉටු කිරීමට අවශ්‍ය නම් ගමේ පූජක තැන සමඟ හොඳ සම්බන්ධතාවක් පවත්වා ගත යුතු විය. මගේ ගමනේ අදහස වූයේ එයයි. ඒ නිසා මම හැකිතාක් ප්‍රිය මනාප ලෙස ඔහුට උත්තර දුන්නෙමි.

හේ හි පවතින කාලකණ්ණි ස්වභාවය දකිමෙන් මා නොසැළුණා යයි නොසිතන්න. තොන්ෆීල්ඩ් වලට වී සුර සැප විඳීමට මම බලාපොරොත්තු නොවීමි. ෆර්න්ඩීනයේ මා ඇරඹූ පාසල ක්‍රේන් මෙනෙවිය ගේ වගකීම යටතට පවරා මා ඒමට මට සිදු වේ. එහෙත් රොචෙස්ටර් මැතිණිය වශයෙන් මා සතු බලය පාවිච්චි කොට මම දිළිඳු ජනතාවට සේවය කරමි. ටොඩ් මහතා මා අසුනක ඉන්දවී ය. ඔහු කේක් සහ බිස්කට් ගෙනෙන ලෙස දන්වුවත් මම තේ කෝප්පයක් පමණක් ඉල්වීමි. දිවා ආහාරය සඳහා නවතින්නැයි ආයාචනා කළ ඔහු, අතීතය පිළිබඳ කිසිදු සඳහනක් නොකොට "ඔබ දැන් ජීවත් වන තත්ත්වය දකීම මට ලොකු සතුටක්" යැයි කීවේ ය. අප තොන්ෆීල්ඩ් හි පිදිංචියට එන බව අසා ඔහු අධික සතුටට පත් විය.

ටොඩ් මහතා අප දෙදෙනාට ම සෑහෙන සේ කතා කළ නිසා මම අතරින් පතර හූ මිටි තැබුවෙමි. ඔහු මගේ මිතුරකු නොවූ බැවින් මා ඔහුට පෙන්වූයේ ආචාරශීලීත්වයක් පමණි. මිතුරන් අතර මා බලාපොරොත්තු වූ විශ්වසනීයත්වය සහ අවංක කම ඔහු වෙත නොවී ය.



ටොඩ් මහතා තෝන්ෆීල්ඩ් හි රාත්‍රී භෝජනයක් සඳහා පැමිණීමට ආශාවෙන් සිටින බව වැටහුණු මම ඔහුට ආරාධනා කළෙමි. ඔහු ප්‍රීතියෙන් බැබළුණේ ය. පෙරළා සිනාසුණු මම, මගේ කුහක හැසිරීම ගැන සාප කර ගත්තෙමි.

මා ඔහුගෙන් සමු ගැනීමට ඔන්න මෙන්න කියා තිබිය දී මෙහෙකාරියක් එහි පැමිණියේ මහත් කැළඹීමෙනි.

"සමාවෙන්න මහත්තයා බාධා කළාට. විලෝස් නෝනා කිව්වා ඔබට කියන්න කියලා. ගමේ මිනිස්සු ඕල්ඩ් හවුස් පැත්තට දුවනවා."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ. හරි පුදුමයිනෙ. ඔය ගේ අවුරුදු දහයක් ම හිස් වෙලයි තිබුණේ. මං මේ ගැන මුකුත් දන්නෑ"

දොර දෙසට ඇවිද ගිය ඔහු සිතින් ඕල්ඩ් හවුස් හි සිටින බව මට පැහැදිලි විය. ඔහු ආපසු හැරුණේ හිතකින් නොවේ.

"ඕල්ඩ් හවුස් කියන්නෙ ඉස්සරහ ගෙදර. ඒ ගෙදර මහත්තයා සනීප ගන්න ඉතාලියට ගිය දවසෙ ඉඳන් ගේ වහලයි තිබුණේ"

මම නැගී සිටියෙමි.

"එහෙනම් මාත් ගිහින් එන්නම්. ඔබව හමු වීම සතුටක්. අපි තෝන්ෆීල්ඩ් වලට ආවහම නිතර ම හමුවෙන්න ලැබේවිනෙ."

"මම ඒක බලාපොරොත්තු වෙනවා"

ඔහු කීවේ බාගෙට නැමෙමිනි. එහෙත් ඕල්ඩ් හවුස් හි සිදු වන දෙය බලා ගැනීමට ඔහු තුළ වූ නොතිත් ආශාව මම දුටුවෙමි. එය හරියටම කුඩා දරුවෙකු එක් සෙල්ලම් බඩුවක් ඉවත දමා අලුත් එකක් අතට ගැනීමක් බඳු ය. ආගම දහම පිළිබඳ කිසිදු දැනුමක් නැති මිනිරන් පතල් කරුවන් වෙත යාම ඔහුගේ වගකීමයි. එසේත් නැතිනම් හේ හි නිරාවරණ දෙපා ඇති දරුවන්ට සපත්තු රැගෙන දීම සඳහා අරමුදලක් එකතු කිරීමට ඔහුට හැකිය. එහෙත් ටොඩ් මහතා ඒවා ගණනකටවත් නොගත්තේ ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 11

ජෙරමි සහ තවත් බර කරත්ත රියදුරෙකු අතර ආරාවුලක් හට ගෙන තිබුණි. ඒ මිනිසා ඔහුගේ රථය ඕල්ඩ් හවුස් හි පිටත නැවැත්වීමට උත්සාහ කරමින් සිටියේ ය. ජෝර්ජියානු මෝස්තරයට සැදූ විශාල නිවසක් වූ "ඕල්ඩ් හවුස්" යනු පෝටිකෝ සහිත දොරටුව දෙපස වූ දිගු ජනෙල් වලින් අලංකෘත වූ නිවසකි. ඒ වන විටත් එක් බර කරත්තයක් නිවසින් පිටත නවත්වා තිබුණි. දෙවන කරත්තකරුවාට ද අවශ්‍ය වූයේ පළමු කරත්තය තිබූ තැනට යාමටයි. එහෙත් මගේ රථය ඊට බාධාවක් විය. ටොඩ් මහතාට ඉක්මනින් සමු දුන් මා රථයට ගොඩ වූයේ මේ ආරාවුල නිමාවට පත් කරමිනි. මා රථයට නගින විටත් ටොඩ් මහතා මගේ උරහිසට උඩින් ඉස්සී බැලුවේ ඕල්ඩ් හවුස් දෙසයි.

අප නැවත හේ දෙසට සැතපුම් කාලක් පමණ ගමන් කරත්ම පාරේ එක් වංගුවක දී අශ්වයන් දෙදෙනෙකු යෙදූ පිටුපස විවෘත ලස්සන රථයක් අධික වේගයෙන් අප දෙසට පැමිණියේ ය. ජෙරමි විස්මයෙන් කෑ ගැවේ ය. මට නම් වඩාත් පුදුම සහගත දසුන වූයේ ඉතා දක්ෂ ලෙස කසය ලෙළවමින් අසුන් මෙහෙයවූ රියදුරා ය. මට පෙණුනු හැටියට ඒ කාන්තාවකි! සම්පූර්ණයෙන් ම කළු ඇඳ සිටි ඇය තොප්පියක් වෙනුවට සුදු පැහැ ලේස් රෙද්දක් හිස වටා බැඳ සිටියා ය. ඇය ඉදිරියට එත් ම එය සුළඟේ ළෙල දිණි. ඇගේ ඍජු ශරීරය රථය සමග මඳක් වැණුනත්, රථයේ අධික වේගය නිසා ඇය කිසි සේත් ම අපහසුතාවයට පත් වූ බවක් නොපෙණිනි. මා යන්තම් දුටුවේ ඇගේ දිගු ඍජු නාසය පමණි. ඊළඟ මොහොතේ ඇය නොපෙනී ගියා ය.

කාන්තාවගේ රථයට ඉඩ දීම සඳහා අපේ රථය පාර අද්දරට ම ගැනීමට ජෙරමිට සිදු විය. රථයේ පැද්දීමත් සමග මා හැරී බලද්දී, දූවිලි වලාවක් අතර නොපෙනී යන ආගන්තුක රථය පෙණිනා. මේ නිර්භීත කාන්තාව, ඕල්ඩ් හවුස් කුලියට ගත් තැනැත්තිය දෝයි මම සිතුවෙමි.

මෙලෙස මම නැවතත් ෆර්න්ඩිනයේ ආරක්ෂාව වෙත ගියෙමි. එහෙත් එය තව දුරටත් මට කෙම් බිමක් නොවීය.





**මා** රථයෙන් බසින විට ෆර්න්ඩීනය අඳුරේ ගිලී තිබුණි. එඩ්වඩ් තව ම පැමිණ නැති නිසා දුකක් දැණුනත්, ඔහු පැමිණෙන විට නිවසේ සිටීමට හැකි වීම ගැන මම සතුටු වීමි. මේරි දොර ඇරියාය.

"ඔබට කෑම ලෑස්තියි නෝනා"

"ජොනතන් කෝ"

"දවස තිස්සෙ ම ඇති වෙනකම් දඟ කළා. දැන් අන්න හොඳට නිදි"

එඩ්වඩ් පැමිණෙන තෙක් මා ආශාවෙන් බලා සිටියේ තරුණියක සිය පෙම්වතා එන තෙක් බලා සිටින්නාක් මෙනි. වසර දහයක් එකට ජීවත් වූ ස්වාමියා එන තෙක් මෙලෙස බලා සිටීම විහිළුවක් වුවත් මම සෑම දිනක ම එසේ කළෙමි.

තව පැයකින් ඔහු එන බව සතුටින් සිහි කළ මම පුතුගේ කාමරයට ගියෙමි.

සිනිඳු අතක් මෘදු කම්මුලට තබා ගෙන ජොනතන් නිදයි. ඔහුගේ මුහුණ හරහා වැටී තිබූ රන්වන් කෙහෙ රොදක් මම සෙමින් ඉවත් කළෙමි. අඳුරු පැහැ මගේත් එඩ්වඩ්ගේත් දරුවාට රතු පාට කම්මුල්, රන්වන් කෙස් සහ නිල් ඇස් ලැබීම කෙතරම් පුදුම සහගත ද? ඔහු ගේ එකේ අතක වූයේ ඔහු වඩාත් ආදරය කරන පුංචි ලී අශ්වයෙකි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 12

පුතු දෙස බලා සිටි මගේ සිත සතුටින් පිරී ගියේ ය. ලබන වසරේ ජොනතන්ට නංගියෙක් හෝ මල්ලියෙක් ලැබෙනු ඇත. එඩ්වඩ්ට තවත් පුතෙක් හෝ දුවක්! කිසි ම කාන්තාවක් මා තරම් පින් කර ඇත්ද? නිදන දරුවා දෙස තවත් වරක් බැලූ මම කාමරයෙන් පිට වූයෙමි.

එඩ්වඩ් ගේ කටහඬ ඇසුණාක් සේ දැනී මම හිටිවන නැවතුණෙමි. මා පුතුගේ කාමරයේ සිටිද්දී ඔහු නිහඬව ම පැමිණෙන්නට ඇති. එහෙත් ඔහු ගේ සාමාන්‍ය පුරුද්ද නම් මගේ නම කියා කෑගසමින් සුළි සුළඟක් සේ නිවසට පැමිණීමයි. එහෙත් අද ඒ වෙනුවට ඇසුණේ "මම ඔබගේ කෝට් එක ගන්නම් සර්" යැයි මේරි පහත් හඬින් කියන හඬත්, ඔහු ඊට කෙඳිරීමකින් පිළිතුරු දෙන හඬත් ය. පුදුම වූ මම "එඩ්වඩ්, එඩ්වඩ්" යි කෑ ගසමින් තරප්පු පෙළ දිගේ පහළට බසින්නට වීමි.

එහෙත් මට ඇසුණේ ඔහු ගේ හඬ වුවත් සාලයේ අඩ අඳුර අතරින් මෑත් වී පඩිපෙළ පාමුලට පැමිණි මළ මිනියක වැනි දෙනෙතින් මා දෙස බැලුවේ ඔහු නොවේ. දෙවියනේ ඒ ඇස් මට කොතරම් හොඳින් මතක ද? මා අධික කම්පනයෙන් යුතුව පහළ බලත් ම එහි සිටියේ අතීතයේ සිට ම දැක පුරුදු දරුණු පුද්ගලයෙකි. මගේ විවාහයේ මුල් වසර කීපය තුළ ඒ රුව සිහිනෙන් පවා මා බිය ගැන්වී ය. අන්තිමේ ඒ බිය මගෙන් තුරන් කළේ එඩ්වඩ්ගෙන් ලැබුණු ආදරයත් ආරක්ෂාවත් විසිනි.

ඇය දිස්වූයේ කෙතරම් බියකරු ලෙස ද? ඇගේ කිළිටි සිරුර යන්තමින් වැසී තිබුණේ හණ රෙද්දෙන් කළ ඇඳුමකිනි. ඇඳුමේ අපිළිවෙල වාටිය නිසා වැරහැලි වූ මේස් සහ කැඩී ගිය සපත්තු මනාව පෙණිනි. ඇගේ දෙවුර වැසුණේ කාළකණ්ණි පෙනුමැති ඉරී ගිය ටාර්ටන් රෙද්දකිනි. ගෙල මුලට වන්නට බැඳ තිබූ කොණ්ඩයෙන් විසිරුණු කෙස් ගස් කීපයක් දෙවුර මත එල්ලෙමින් තිබුණි. ඇය සම්පූර්ණයෙන් ම සිහන්තියක වූවා ය. ඇගේ සුදුමැළි පාණ්ඩු පාට මුහුණේ වූ අනුකම්පාවෙන් තොර ඇස් ගිනි අඟුරු සේ දැවෙමින් තිබුණි. ඇය මට වෛර කරන බව මම දක්කෙමි.



මගේ හිස කරකැවුණේ ය. මා බය කිරීමට ඇය ආපසු ආවේ ඇයි? ෆර්න්ඩීනයේ මගේ ම නිවසේ එසේ සිටියේ ග්‍රේස් පූල් ය. හිස කැරකී මම ඇද වැටුණෙමි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 13

# 6

ඉන්පසු ගෙවී ගිය මාසයක කාලය තුළ මට සිදු වූයේ අසාධ්‍ය ලෙස රෝගාතුර වී ඇඳටම වී සිටීමටයි. වෛද්‍යවරයා පැවසුවේ මගේ දරුවා පමණක් නොව මගේ ජීවිතය ද නැතිවීමේ අවදානමක් වූ බවයි. සති දෙකක කාලයක් තුළ මට දැනුණේ වරින්වර මේරි සහ හෙදිය ගේ උටවැන් ලබන අයුරුත්, ආදරණීය එඩ්වඩ් ඉතා ඉවසීමෙන් යුතුව මා පසෙක සිටින අයුරුත් ය. සාලයේ සිටගෙන ගිනි ගන්නා දෑසින් මා දෙස බලා සිටින ග්‍රේස් පූල් ගේ බියකරු දසුනින් මගේ රාත්‍රීන් පීඩාවට පත් විය. ඒ දසුන සැබෑවක් නොව මගේ රෝගයේ පෙර නිමිත්තක් හැටියට පෙණුනු දෙයක් පමණ කැයි සිතීමට මම උත්සාහ කළෙමි. එහෙත් එය හුදෙක් හිතළුවක් පමණක් නොවී ය.

කෙමෙන් කෙමෙන් දුර්වලකමත්, බියත්, නපුරු හීනත් අඩු වී ගියේ ය. එක් උදෑසනක මම තරමක සුවදායී බවකින් යුතුව අවදි වීමි. පහත මාලයේ දෛනික කටයුතු සිදුවන ශබ්දය මට හොඳින් ඇසුණි. මම එඩ්වඩ් ගැන සිතුවෙමි. මා රෝගී වී හුන් කාලය තුළ ඔහු මහත් ළැදියාවකින් මා ළඟ ම සිටියේ ය. සුවය ලැබීම පිළිබඳ හැඟීමෙන් මම උද්දාම වීමි. මමත් දරුවාත් දැන් සුවෙනි. එතකොට ග්‍රේස් පූල්? ඒ ප්‍රශ්නය මා මගෙන් ම අසා ගනිත් ම දොරට තට්ටු කරන හඬ ඇසිණි. මගේ උදේ ආහාරය රැගෙන කාමරයට පිවිසියේ ග්‍රේස් පූල් ය. ඇගේ සුදුමැළි කෘශ පෙනුමේ වෙනසක් නොවූවද, දැන් ඇය වාම් ඇඳුමක් ඇඳ සිටියා ය. සුදු වේගෙන එන කොණ්ඩය පිළිවෙලකට සකස්කර තිබුණි. මගේ හිස කැරකුණේ ය. කොට්ටයේ හිස ඔබා ගත් මම දෑස පියා ගතිමි.



තෝන්ෆීල්ඩ් නිවසේ හොල්මන් කළ ඒ භයංකර, දුෂ්ට රුව පිළිබඳ පිළිකුල් සහගත හැඟීමෙන් මසිත පිරී ගියේ ය.

ඇගේ දෑඩි, පැතලි හඬ නැඟුණේ ය.

"ඔබට අද හොඳයි වගේ නෝනා. කෑම කනවද?"

"නෑ නෑ.. යන්න. මට පාඩුවෙ ඉන්න දෙන්න"

"හොඳයි" අනුකම්පාවිරහිත ලෙස පැවසූ ඇය ආපසු ගියා ය. දෙවියනේ ඇය මෙහි මොනවා කරනවාද?

පසුව එඩ්වඩ් ආවේ ය. පුරුද්දට මෙන් ඔහු ආවේ මා අසාධ්‍ය තත්ත්වයේ සිටිනු දැකීමේ අරමුණින් විය යුතු ය. සිනාසෙමින් සිටි මා දැකීම ඔහුට මහත් විමතියක් විය. මා වෙත නැඹුරු වී නළල සිප ගෙන, මගෙ අත ගනිමින් ඇඳේ පසෙකින් හිඳ ගන්නා විට ඔහුගේ දෑස කඳුළින් බර වී තිබුණි.

"ඔයාට සනීපයි ද ජේන්. එහෙනම් අමාරු ම කාලෙ ඉවරයි නේද?"

"ඔව් මං හිතන්නෙ"

ටික වෙලාවක් අපි පුතා ගැන කතා කළෙමු. මං ලෙඩ වී සිටි කාලයේ සිදු වූ සුළු සිදුවීම් ඔහු මට විස්තර කළේ ය. එඩ්වඩ් සමග නැවතත් හදවතින් ම එක්වීමට ලැබීම නිසා අධික ප්‍රීතියට පත්ව සිටි මම ග්‍රේස් පූල් ගැන ඇසීමට හිත දුන්නේ නැත. ඇත්තෙන් ම මට ඇය සිහි වූයේ වත් නැති තරම් ය. අනතුරුව හෙදිය පැමිණ එඩ්වඩ් පිටතට යැව්වා ය.

"මිසිස් පූල්ට මං ළඟට එන්න දෙන්න එපා. මේරි විතරක් හිටියම ඇති"

"ඒකට නම් මේරියි ජෝනුයි දෙන්නමත් කැමති වෙයි. මොකද මේරි කිව්වා වෙන කව්රුවත් නෙවෙයි එයයි ඔබට සාත්තු කරන්න ඕනෙ කියලා. ඒත් මිසිස් පූල් ඒකට ඉඩ දෙන්නෙ නෑ" හෙදිය මට සෙමෙන් කීවා ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 14

"එහෙනම් මේ දවස් ටිකේ ම මා ළඟ හිටියෙ මිසිස් පූල්?" මම භීතියට පත් වීමි.

"ඔව් වරින් වර ආවා. ඒත් ඔබට සිහිය තිබුණු වෙලාවට එයා මෙතන හිටියෙ නෑ"

"මීට පස්සෙ මේරිට විතරක් එන්න දෙන්න" යයි අණ කළ මම දැඩි දුර්වල කම නිසා නින්දට වැටුණෙමි.

පසුව දොස්තර පැමිණ මට සනීප බව කී ය. එහෙත් තවමත් මා දුබල වූ නිසා බොහෝ විවේක ගත යුතු විය. කොට්ට උසට තබා ඔසවා තබන ලෙස බල කළ මම පුතා ළඟට ගෙන සුරතල් කළෙමි. පසුව එඩ්වඩ් නැවතත් ආවේ ය. මෙහෙකාරියකටත් වඩා උසස් ලෙස අනිත් අයට අණ දෙමින් ග්‍රේස් පූල් මේ නිවසේ කුමක් කරන්නේදැයි ඇසීමට අවශ්‍ය වුවත් මම එයට බිය වීමි. නිසැකයෙන් ම ඇය ආවේ ඔහු අණ කළ නිසා ය. ඒත් ඇයි? මම මගෙන් ම අසා ගතිමි. ඒ ගැහැණිය දකීමෙන් අතීතයේ අඳුරු මතකයන් ඇවිස්සීම හැර ඔහු වෙන කුමක් බලාපොරොත්තු වන්නද?

අපි තොන්ෆීල්ඩ් ගැන කතා කළෙමු. එය දැන් සම්පූර්ණයෙන් ම වාගේ සූදානම් බව ඔහු කීය. ජෝනතන් ගේ තක්කඩිකම් ගැන ද අපි කතා කළෙමු. එහෙත් එඩ්වඩ් ග්‍රේස් පූල් ගැන කිසිවක් නොකී ය. මම අන්තිමේ දී බියසුළු ලෙස,

"එඩ්වඩ්, ඇයි මිසිස් පූල් අපේ ගෙදර ඉන්නෙ" යි ඇසීමි. ඔහුගේ පිළිතුර ඍජු විය.

"ජේන්, මට ඔය ගෑණිව හම්බ වුණේ මැන්චෙස්ටර් වල පාරක් අයිනෙ හිඟාකන කොටයි. අපේ ගෙදරින් අස් වුණාට පස්සෙ එයාව පාරට වැටිල තියෙනවා. මම පාරෙ යනකොට දැක්කා මහ වැස්සෙ ඒ ගෑණි බොහොම අමාරුවෙන් යන හැටි. මම නැවැත්තුවෙ නිකං හිඟන්නෙක් කියලා හිතල. හිතන්න, මගෙ පරණ වැඩකාරයෙක් ඒ වගේ බඩගින්නෙ අසරණ වෙලා ඉන්නවා දැක්කම මට මොනව හිතෙන්නැද්ද කියලා. ඇත්ට ම ජේන්, ගින්නෙන් පස්සෙ මං හොඳට ම තුවාල වෙලා ඉන්නකොට ග්‍රේස් පූල්ගෙ



ඉරණම ගැන මම හිතලා තිබුණෙ නෑ. ඉතිං ජේන් මං වෙන මොනව කරන්නද එයාට ගෙදර ගේනවා ඇරෙන්න."

"මං දන්නෑ. ඒත් එයා ඔයාගෙ වැඩකාරි වෙලා ඉඳිද්දි විශ්වාසෙන් හිටියෙ නෑ නේද? එයාගෙ නොසැළකිල්ල නිසානෙ ඔක්කොම කරදර වුණේ"

ඒ අඳුරු අතීතය නැවත සිහි නොකිරීමට අප දෙදෙනා අතර නිසගයෙන් ඇති වී තිබූ සම්මුතිය නිසා මම තවත් කිසිවක් නොකීවෙමි. එහෙත්, ග්‍රේස් පූල්ගේ මත්පැන්ට ඇති කැදරකම නිසා බර්තා මේසන්ට කීප වරක් සිය කාමරයෙන් එළියට පැන ගැනීමට හැකි වූ බව අපි දෙදෙනා ම දැන සිටියෙමු. ඇත්තෙන් ම, තොන්ෆීල්ඩ් වල ගින්නටත් මගෙ සැමියා තුවාල වීමටත් බලපෑ හේතුව ඇයයි. මන්ද, ඇය උමතු ස්ත්‍රියට පැන යාමට ඉඩ නොදුන්නා නම් ගින්නක් ඇති නොවනු ඇත. එසේ නම් එඩ්වඩ්ට තුවාල වන්නේ ද නැත. එඩ්වඩ් ඇයට සමාව දුන්නත් මට එය කළ නොහැකි ය.

"මේ බලන්න ජේන්. ඔයා සාමාන්‍යයෙන් ඔයිට වඩා සමාව දෙන කෙනෙක්නෙ"

"ඔයාට තුවාල වෙච්ච නිසයි මට සමාව දෙන්න බැරි. එයා එයාගෙ රාජකාරිය හරියට කළා නම්...."

ඔහු මගේ වචන නැවැත්වූයේ සිප ගැනීමකිනි.

"දැන් ඔය පරණ කතා වැඩක් නෑ. කොහොම හරි දැන් අපි සතුටින්නෙ"

මොනවද ඔහු මේ කියන්නෙ. අපේ සතුට ලැබුණෙ ග්‍රේස් පූල්ට පිං සිද්ධ වෙන්නද? තර්කානුකූලව බැලුවොත් ඒක නම් ඇත්ත. ගින්නක් ඇති වුණේ නැත්නම් බර්තා මේසන් ජීවත්ව ඉඳියි. එහෙනම් අපට බඳින්න වෙන්නෙත් නෑ. ඇත්ත! සම්පූර්ණ ඇත්ත! ඒත් ඒක පිළිගන්න ආස නොහිතෙන ඇත්තක්.

"ග්‍රේස් පූල්ට මොකද කරන්නෙ කියන එක ඔයාගෙ තීරණයක්. ඔයා දන්නවනෙ, මං කවදාවත් ඔයාගෙ තීරණ වලට ඇඟිලි ගහන්න



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 15

එන්නෙ නෑ. ඒත් මට නම් පේන්නෙ අවුරුදු ගාණක් අපට හිතවත්ව හිටපු මේරිටයි ජෝන්ටයි ඉහළින් ඔයා මිසිස් පූල්ව පත් කරලා වගෙයි"

මෙවර මට අසන්නට ලැබුණේ භයානක දෙයකි.

"ඔයාට තෝල්ෆීල්ඩ් වලට පාලිකාවක් ඕනැනෙ, ජේන්. ගේ ලොකු නිසා ඔක්කොම දේවල් ඔයාට තනියම බලන්න බෑ."

"ඒත් මං ෆෙයාර්ෆැක්ස් නෝනට ලිව්වනෙ."

"ජේන්, ඔයා ඉඳහිට මෝඩ කතාත් කියනවා. ෆෙයාර්ෆැක්ස් වයසයි. එයා කොච්චර කැමති වුණත්, ඒ ගෙයි වැඩ කරට ගන්න එක එයාට බර වැඩියි. ඔයා කැමති නම් මම එයාට ලියන්නම්."

"හා, හා" මම එකඟ වීමි. මට අවශ්‍ය වූයේ තනි වීමට ය. මගේ කඳුළු අතර තනි වීමට ය.

ඔහු කාමරයෙන් පිටව ගිය විගස මම හඩන්නට වීමි. එඩ්වඩ් මගෙන් නොවිමසා ග්‍රේස් පූල් පත් කළේ ඇයි? ඇය තබා ගැනීමට මා කෙතරම් අකැමති දැයි දන දනම? දැන් ඇය කළු වළාවක් පරිදි නිවස වසා ගෙන හිඳියි. ඇය තොන්ෆීල්ඩ් හි පාලිකාව ලෙස ද අප සමග හිඳිනු ඇත. එය අතිශයින් ම භයංකරය.

මා හඬද්දී කිසිවෙක් දොරට ගැසී ය. එහි සිටියේ කළු ඇඳුමින් සැරසුණු ග්‍රේස් පූල් ය.

"නෝනා ඔබට අසනීපයක් ද? මම මහත්තයට කියන්නම්. ඔහු දොස්තර මහත්තයට කතා කරයි" කියූ ඇය පිටව ගියා ය.

පැය භාගයක් යන්නටත් පෙර වෛද්‍යවරයා පැමිණ මට නිදි බෙහෙතක් දුන්නේ ය. තද නින්දට වැටුණු මා දැන සිටියේ ග්‍රේස් පූල් උදේ සවස පැමිණ මට බෙහෙත් දුන් බව පමණි. ඇගේ අනුකම්පා විරහිත මුහුණ දෙස බලාගෙන ඇගේ සීතල දිගු අත් වලින් බෙහෙත් ගන්නා මම ඒවා බිව්වේ ඇය මට වස දෙන්නේය යන හැඟීමෙනි. එහෙත් මම වෙන කුමක් කරම්ද? වෛද්‍ය අණට



අකීකරු වුවහොත් මා මහත් ආශාවෙන් බලාපොරොත්තු වූ දරුවා නැති වී යාමට ඉඩ තිබුණි. නිදි බෙහෙත් නිසා දින දහයක් ම මම රැයේත් දවාලේත් නිදා ගතිමි. අන්තිමේ දී බෙහෙත් නැවැත්වීමට අණ ලැබුණි.

"රොචෙස්ටර් නෝනා, ඔබත් දරුවාත් දැන් අනතුරුදායක තත්ත්වයෙන් මිදිලයි ඉන්නෙ. ඒත් ඉස්සරහට ඔයා වග බලා ගන්න ඕනෙ අධික ලෙස හිතත් කයත් වෙහෙස නොකර ඉන්න. මම මේක රොචෙස්ටර් මහත්තයටත් කිව්වා. ඔයා හොඳට පරිස්සම් වුණොත් ඔක්කොම හරියයි".

"මම පොරොන්දු වෙනවා". මම උද්‍යෝගිමත් ලෙස තහවුරු කළෙමි. තවත් උපදෙස් කීපයක් දුන් වෛද්‍යවරයා මට සුබ පතා පිටව ගියේ ය.

කෙසේ වුවත් වෛද්‍ය උපදෙස් නිසා මා ලද පීඩනය දරා ගත නොහැකි තරම් විය. එඩ්වඩ් දිගට ම වෙන ම කාමරයක නිදා ගත්තේ ය. විවාහයට පසු එක ම රාත්‍රියකදු අප දෙදෙනා වෙන්ව සිටියේ නැත. දුකට හේතු වූ අනිත් කරුණ වූයේ රෝගී බව නිසා මට ගෙදරදොර කටයුතු වලින් ඈත්ව සිටීමට සිදු වීමයි.

එක් සැන්දෑවක එඩ්වඩ් මා වෙත පැමිණියේ එක්තරා තෘප්තියකින් යුතුව ය.

"ඔන්න ජේන්, දැන් අලුත් ගෙදරට යන්න ඔක්කොම ලෑස්තියි". තොන්ෆීල්ඩ් වෙත පදිංචියට යාම මට එහෙම පිටින් ම අමතක වී තිබුණි.

"අපට නත්තල් පහු වෙනකම් ඒක කල් දාන්න බැරිද?" මම ආයාචනා කළෙමි.

"මේ දවස්වල කාළගුණෙත් හොඳයි. ඒ හින්දා දැන් ම වැඩේ කර ගන්න එක හොඳයි. සීත කාලෙ ගෙවල් මාරු කරන එක ඔයාට තියා හොඳින් ඉන්න කෙනෙකුටවත් ඔරොත්තු දෙන්නෙ නෑ. දැන් ම ඉඳන් ඔයා වෙනුවෙන් ගේ උණුසුම් කරනවා. මිසිස් පූල් අණ දීලා තියෙන්නේ දැන් ම ඉඳන් උදුන් පත්තු කරල තියන්න.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 16

කිසි බාධාවක් නැතුව ඔයාට විවේක ගත්තැහැකි. ඔයාට තියෙන්නෙ බඩු ඔක්කොම ගෙනිච්චට පස්සෙ වෙලාවට පෙනී ඉඳලා ගෙදර අයිතිකාරි වෙන එකයි".

මට ඇවැසි වූයේ එය නොවේ. සියල්ල මගේ භාරයට ගෙන ක්‍රියා කිරීමටත්, සියලු භාණ්ඩ මට අවශ්‍ය පරිදි පිළියෙල කිරීමටත්, මට ඇති අවශ්‍යතාව එඩ්වඩ්ට කෙසේ තේරුම් කරන්නද? මොන මිනිහද මේක තේරුම් ගන්නෙ? හේතු සහගත වෙයං ජේන්. අඩුගානේ බොරුවට ඒ වගේ පෙන්නපන්. මම සිතුවෙමි.

"මගේ අසනීපෙ මේ වෙලාවෙ ඔයාට බරක් වුණා නේද එඩ්වඩ්?"

"අනේ කෙල්ලෙ මොනවද මේ කියන්නෙ. මං බලන්නෙ ඔයාගෙයි දරුවගෙයි සනීපෙ ගැන විතරයි. ඔයාට කරදර වෙන්න කිසි දෙයක් නෑ. මිසිස් පූල්ගෙ අතේ සේරම තියෙන්නෙ".

අපේ ගෙවල් මාරුව සම්පූර්ණයෙන් ම පාලනය කරන්නේ අර දැඩි, සීතල ගැහැණිය බව ඇසීමෙන්, ආදර ෆර්න්ඩීනය දමා යාමේ ශෝකය තවත් වැඩි විය. මම ඇය පිළිකුල් කළෙමි. මගේ ඉතා වටිනා බඩු බාහිරාදිය පවා අසුරන්නේත්, ඒවා තබන තැන් තීරණය කරන්නේත් ඇයයි.

පසුදින ෆෙයාර්ෆැක්ස් නෝනා ගේ ලිපිය ලැබුණි. මා අසනීපව සිටි කාලයේ එඩ්වඩ් ලියූ ලිපිය ලැබුණු බව ඈ ලියා තිබුණා ය. තොන්ෆීල්ඩ්හි අමුත්තකු වශයෙන් පැමිණීමට එඩ්වඩ් ඇයට ආරාධනා කර තිබුණි. ඇය මගේ රෝගය පිළිබඳව ද දැඩි සැලකිල්ල යොමු කොට තිබුණි. තමා ග්‍රේස් පූල්ට ගරු කරන බවත්, ඇය මට හොඳ සහායිකාවක් වනු ඇති බවත්, ඇය මහත් ආරක්ෂාකාරී ස්වරූපයකින් ලියා තිබුණි.

මේ කරුණාවන්ත වදන් දැකීමෙන් මගේ හදවත කිඳා බැස්සේ ය. එඩ්වඩ් කර තිබුණේ මා රෝගීව සිටි කාලයේ කළ යුතු දේ ය. එහෙත් ඉතා දුක්මුසු ලෙස මා සිතුවේ ග්‍රෙස් පූල් මටත් වඩා ඉහළ තැනක වැජඹෙන බවයි.



ෆෙයාර්ෆැක්ස් නෝනා මිසිස් පූල් ගැන ලියා තිබූ විලාසය අවධානයට ගත් මගේ බිය දෙගුණ තෙගුණ වී ගියේ ය. එහෙත් මට තවමත් සිතා ගත නොහැකි එක් දෙයක් ඇත. මෙම ගැහැණිය නිසා තම ජීවිතය විනාශ වීමෙන් පසුවත්, එඩ්වඩ් ඇය මෙතරම් සමීප කර ගන්නේ ඇයි?



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 17

# 7

අපි තෝන්ෆීල්ඩ්හි පදිංචියට ගියෙමු.

කොළ හැළෙන ඔක්තෝබරයේ එක් වැහිබර දිනයක අපේ බඩු කරත්ත ෆර්න්ඩීනයෙන් පිටත් විය. එහෙත් ඒ කරත්ත සැතපුම් තිහක් ඈත පිහිටි තොන්ෆීල්ඩ් වෙත යද්දී මට සිදු වූයේ කාමරයට ම වී සිටීමටයි. මා ඉතා ප්‍රවේශමෙන් ආරක්ෂා කළ වස්තුව වූ පුටු, පිඟන් බඩු සහ කුඩා ලියන මේසය පිටතට ගෙන යන ශබ්දය අසමින් මම කාමරයට ම කොටු වී සිටියෙමි. එම බඩු පැටවීමට අණ දෙන්නේ ග්‍රේස් පූල් ය. අනතුරුව රෝද කැරකෙන හඬ ඇසී පසුව සියල්ල නිශ්ශබ්ද විය. එය හිස් වූ නිවසක පවතින බියජනක නිශ්ශබ්දතාවකි.

මම උඩු මහලේ මගේ පුටුවේ හිඳ, මා බෙහෙවින් ආදරය කළ උද්‍යානයත් තණ පිටියත් දෙස බැලීමි. උයනේ මායිම් වැටවල් කැඩී ගොසිණි. ප්‍රමාද වී පිපුණු එක ම එක රෝස මලක් මා දෑස සැනසී ය. තව ටිකකින් එඩ්වඩ් පැමිණ මා නව නිවස වෙත රැගෙන යනු ඇත. ඒ අතරේ මම, පසුගිය වසර දහයක නටබුන් රැඳි ඇති පහල මාලයේ කාමර සිතේ ඇඳ ගතිමි. මගේ සැමියාටත් පුතාටත් දැනට වඩා පුළුල් ජීවිතයක් ලැබෙන තෝන්ෆීල්ඩ්හි නව ජීවිතය දෙස සුබවාදීව බැලීමට මම මට ම බල කර ගත්තෙමි.

මේ මුළු කාලය තුළ දී ම නිවසේ රැඳී තිබුණේ අර බියකරු නිහඬතාවයි. මට ඇසුණේ සුළඟ සුසුම්ලනු පමණි.

මොහොතකින් එඩ්වඩ් ගේ රථයේ හඬ ඇසිණි. ඔහු කාමරයට ඇතුළු වූයේ ප්‍රීතියෙන් ඔකඳ වෙමිනි.



"එහෙ ඔක්කොම හොඳට කෙරෙනවා. දැන් තියෙන්නේ ගෙදර අයිතිකාරිව ගෙනිහින් තියන එක විතරයි". ඔහු ඉතා මෘදු ලෙස මා වටා තුවායක් ඔතමින් කීවේ ය.

"දැනටමත් ජොනතන් හැම තැන ම දුවනවා. හරියට ම මං පොඩි කාලෙ වගේමයි. ඔව් රත්තරන්! හරියට ම ඒ වගෙයි."

තරප්පු පෙළ බැසීමට එඩ්වඩ් සහ හෙදිය මට උදව් කළහ. මා කාමරයට කොටු වී සිටි කාලය මාසයක් පමණ වී තිබුණි. කිසි ම ගෘහ භාණ්ඩයක් නැති සාලය පහළින් පෙණිනි. සෙමින් අපි නිවසින් පිට වීමු. මම එඩ්වඩ් ගේ අතට වාරු වී සිටියෙමි. ෆර්න්ඩීනයේ දොරටු අවසන් වරට වැසී ගියේ ය. මම නිහඬව ම නිවසට ආයුබෝවන් කීමි. අහස නිල් පැහැති විය. සුළඟ නැවුම් විය. ගස්වල කොළ සුළඟේ නටමින් බිම පතිත විය. අපි තෝන්ෆීල්ඩ් බලා පිටත් වීමු.

ජෙරමි අසුන් දක්කද් දී මට හැඟුණේ කිසිදු හැඟීමකින් තොරව සිහිනයක් දකින්නාක් මෙනි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 18

# 8

**තෝ**න්ෆීල්ඩ් දක්වා වූ මුළු ගමනේ දී ම මා තුළ වූයේ අමුතු ධ්‍යානගත ස්වභාවයකි. සරුකෙත් ඉපනැලි පසු කරමින් අපි සෙමින් සෙමින් කඳුකරය බලා ගමන් කළෙමු. අන්තිමේ දී උස් එල්ම් ගස් අතරින් වැටුණු මාවත කොණේ තොන්ෆීල්ඩ් මන්දිරය දිස් විය. නිවසේ ඉදිරි දොර අප පිළි ගන්නට බලා සිටියේ ය.

එඩ්වඩ් මගේ අත ගත්තේ ය. රෝගී බව නිසාදෝ මා තුළ වූයේ විස්තර කළ නොහැකි අන්දමේ මනෝ භාවයකි. මා මේ නිවසින් පිටව ගියේ ජේන් අයර් ලෙසිනි. දැන් නැවත පැමිණියේ නිවසේ හිමිකාරිය ජේන් රොචෙස්ටර් ලෙසිනි. මේ සිහිනයක්ද?

පෝටිකෝව යටින් ආලින්දයට ගොඩවත් ම මම එඩ්වඩ්ට වාරුවීමි. සියල්ල මා නියම කළ පරිදි විය. කළු ඇඳුමින් සැරසී දෑත් බැඳගෙන මා ඉදිරියේ හුන් ග්‍රේස් පූල් හැරුණු කොට අන් සියල්ල මගේ සතුටට හේතු විය. නිවසේ අලුත් යතුරු කැරැල්ල, ඇගේ ඉණේ එල්ලිණ. ඇගේ හිස කෙස් මනාව සකසා තිබූ අතර මුහුණ සුදුමැළි විය. දැස් සුපුරුදු පරිදි දයාවෙන් තොර ය.

මගේ හදවත කිඳා බැස්සේ ය. මා බොහෝ දුර්වල ය. එහෙත් මගේ ම නිවසේ ඉතා ශක්තිමත් ලෙස මිසිස් පූල් සිටියේ අමුත්තකු පිළිගැනීමට බලා සිටින නිවසේ හිමිකාරිය මෙනි. ඇය ඉදිරියට එත් ම මම තව තවත් එඩ්වඩ්ගේ උරහිස තුළට ඇකිළී ගියෙමි. ඔහු වහා මා වටහා ගත්තේ ය.

"දුර ගමනක් නිසා නෝනට මහන්සියි. අපි කෙළින් ම උඩට යනවා මිසිස් පූල්".



ඇය මඳක් පස්සට වූවා ය. අපි විශාල තරප්පු පෙළ නැග මගේ විශාල, සුන්දර නිදන කාමරයට පිවිසියෙමු. මා එවකට දැන නොසිටියත් ඊළඟ මාස කිහිපය තුළ ඉතා දුක්බර හුදෙකලා රාත්‍රීන් ගණනාවක් ගත කිරීමට නියමිතව තිබූ කාමරය මෙයයි. කාමරය ගෙයි මුල්ලක පිහිටි නිසා දෙපසකට යෙදූ ජනෙල් තුළින් සුන්දර භූමි දර්ශන දෙකක් දිස් වේ.

එඩ්වඩ් මා කවිච්චියේ සතපවත් ම සුපුරුදු කඩිසරකමින් යුතුව ග්‍රේස් පූල් කාමරයට ආවා ය.

"මොනව හරි කනවද ජේන්?" ඔහු ඇසුවේ ග්‍රේස් පූල් දෙස නෙත් හෙළමිනි.

තේ බොන අතරේ අපි දෙදෙනා සුපුරුදු විශ්වාසයෙන් හා නිදහසින් සල්ලාපයේ යෙදුණෙමු.

"ඔක්කොම ඔයාට ඕන විදියට තියෙනවද ජේන්?" ඔහු ඇසුවේ තෝන්ෆීල්ඩ් වෙත පැමිණීමේ ප්‍රීතිය මා හා බෙදා ගැනීමට මෙනි.

"ඇත්තෙන් ම ඔව්. හැම දෙයක් ම පිරිසිදුයි, නැවුම්. මට දැන්ම පහළට ගිහිල්ලා ගේ බලන්න ඕනෑ"

"ඔයා නම් හරි ම හිතුවක්කාරයි. අපි අහල බලමු" ඔහු පසෙක සිටි හෙදිය ගේ උපදෙස් පැතුවේ ය. කෙස් හෝ ඇගේ විරෝධතාව නොසළකා මම පහළට ගියෙමි. මා ඔසවා ගෙන යාමට ඉස්තාලයේ සිට ජෙරමි කැඳවන ලදී.

"පිරිම වැඩකාරයො ගත්තෙ නැද්ද?" මම ඇසීමි.

"මං හිතන්නෑ අවශ්‍ය වෙයි කියලා".

විශාල සාලයේ දර්ශනය මා සිතුවාටත් වඩා චමත්කාර ජනක විය. එඩ්වඩ් මා වැළඳ ගත්තේ අධික ප්‍රීතියෙනි.

"දෙයියනේ ජේන් ඔයා මේ ගේ සැළසුම් කරලා තියෙන විදිය රජෙකුට වුණත් ගැලපෙනවා, මේ වගේ තැනක යාළුවො එක්ක විනෝද වෙන එක කොච්චර සතුටක් ද? යං බලන්න කැම කාමරේ කොහොමද කියලා".



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 19

එහෙත් මම මහන්සි බව කියමින් අසළ වූ කවිච්චියක සැතපුණෙමි. එඩ්වඩ් නිවසේ ඉතිරි කොටස පරීක්ෂා කිරීමට ගිය අතර, මගේ හිතුවක්කාරකම නොඉවසූ හෙදිය බෙහෙත් ගෙන ඒමට දිව ගියා ය. අධික තෙහෙට්ටුවෙන් වැතිර සිටි මට සිහිවූයේ පැරණි ජේන් ය. හදිසියේ ග්‍රේස් පූල් පැමිණ මගේ දුහැන බින්දේ ය.

"ඔක්කොම ඔබට කැමති විදියට තියෙනවද නෝනා?"

"ඔව් ඔව් මිසිස් පූල්. කිසි වරදක් නෑ".

එඩ්වඩ් නැවත ආවේ ය.

"මේක නම් අදහන්නත් බෑ. මේ ගේ ඉස්සර තිබුණා වගේමයි. ඒත් ඊටත් වඩා හොඳයි වගේ"

මට සිනා ගියේ ය. ගැහැණියකට ඕනෑකම තිබේ නම් කළ නොහැක්කක් නොමැත.

"පුස්තකාලෙ නම් තාම හදා ගන්න බැරි වුණා. මෙහෙ පොත් ගන්න තැනක් නෑනෙ".

"එහෙනම් අපට ම පොත් තෝරලා පුස්තකාලෙ හදා ගන්න පුළුවන්"

"ඉඩම කලින් තත්වෙට ගේන්න ඔයාට සෑහෙන්න මහන්සි වෙන්න වෙයි නේද?" මම මෘදු ලෙස මතක් කළෙමි. අප නැති අතරේ ඉඩම අත්හැර දමා තිබුණි. පතල් කරුවන් නිසා ද ප්‍රශ්න ඇති වී තිබුණි.

"ඒක නම් ඇත්ත. දන් මේකෙ හිවල්ලු අරක් ගෙන. අපට දඩයමේ යතැකි."

එඩ්වඩ් වේගයෙන් අසු පදිනු දකීමට මම බිය වෙමි. තනි අතින් වේගයෙන් අසුන් හැසිරවීම අනතුරුදායක ය. ඊටත් මේ කඳුවල!

"හිවල්ලු පස්සෙ එළවන්න ගියොත් ඔයාට පුස්තකාලෙ හදා ගන්න වෙලා නැති වෙයි".



"නෑ එහෙම වෙන්නෑ".

බෙහෙත් රැගෙන මා වෙත ආ හෙදිය ග්‍රේස් පූල් වෙත හැරී "ඇත්තට ම දවල් කෑම කීයට ද ආ?"යි ඇසුවා ය.

මෙලෙස තෝන්ෆීල්ඩ් හි ගිනි උදුන අසළ ප්‍රීතියෙන් සල්ලාපයේ යෙදී සිටිය දී මා පැතුවේ ඉක්මන් සුවයයි. අපේ ප්‍රීතිමත් නව ජීවිතයක ආරම්භය එසේ සනිටුහන් විය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 20

# 9

**නො**බෝ දිනකින් මා සුවය ලැබූ නිසා හෙදිය ආපසු යමන ලදී. එහෙත් වෛද්‍ය උපදෙස් පරිදි මා තව දුරටත් ප්‍රවේශම් විය යුතු ය. වෙනදා මෙන් උදෑසන අවදි වී එඩ්වඩ් හා ජොනතන් සමඟ උදේ ආහාරය ගෙන එදිනෙදා වැඩ කටයුතු වල යෙදීම දැන් කළ නොහැකි ය. මා දවල් වන තුරු ඇඳේ සිට විවේක ගත යුතු ය. ජොනතන් පාසලට ඇරලීම ද නතර විය. ළඟපාත සුදුසු පාසලක් නැති නිසා ඔහු වෙදර්ෆීල්ඩ් නිවසේ නැවැත්වීමට තීරණය කෙරිණි.

පිරිමි දරුවකු කුඩා කල සිට ම නිවසින් පිට කළ යුතු වුවත් මේ වෙන් වීම මට දරා ගත නොහැකි විය. එහෙත් එඩ්වඩ්ට නම් එය ගණනක් නොවී ය.

"එයාට දැන් අවුරුදු හතක්. අනික හැතැප්ම තිහක් ඈතටනෙ යවන්නෙ. ඔය වයසෙදි මාව යැව්වෙ හැතැප්ම සීයක් එහා ඉස්කෝලෙකට".

හැන්දෑවේ උයනට නොගොස් විවේක ගත යුතු විය. මා අවදි වූයේ රාත්‍රී ආහාරය සඳහා පමණි. මේ නිසා එඩ්වඩ්ට සිදු වූයේ මුළු සන්ධ්‍යාව පුරා ම හුදෙකලා වීමට ය.

එක් ඉරිදාවක පල්ලියට යා යුතු යැයි මම යෝජනා කළෙමි. ජොනතන් ද ගෙදර සිටි නිසා අපි තිදෙනා දේවස්ථානය බලා පිටත් වීමු. වායුගෝලය සිහිල් වුවත් වැහිබර නොවී ය. ගම්මානය පුරා නිහඬතාවක් පැතිරී තිබුණි.

දේවස්ථානයට ඇතුළු වෙත් ම සියල්ලෝ මහත් උනන්දුවෙන් අප දෙස බැලූහ. මම එඩ්වඩ්ගේ අතගත් අතර ජොනතන් අප



පසුපසින් ආවේ ය. ආසන පේළි පසු කළ අපි ඉදිරියෙන් ම වූ රොචෙස්ටර් පවුලේ අසුනේ ඉඳ ගතිමු. බොහෝ කලකට පසු මේ අසුන පිරී තිබෙනු දැකීම මට සතුටක් විය. මගේ පළමු විවාහ දිනට පසු මා මෙහි ආවේ අදයි. හිතුවාට වඩා සන්සුන් ලෙස හැසිරීමට මට හැකි විය. ස්ථානයේ වූ ශාන්ත බව මගේ වේදනාබර මතකයන් සුවපත් කළේ ය.

පළමුවන ගීතිකාව ගැයෙන අතරේ පිරිස අතර නොසන්සුන් බවක්, ඇති විය. මම හැරී බැලුවෙමි. පසු පස පේළි වල අය ද හැරී බැලූහ. දේවස්ථානයේ දොර අසළ සිටි කළු හැඳි උස් සැපු කාන්තාව ඕල්ඩ් හවුස් හි නව පදිංචිකාරිය බව මම හැඳින්නෙමි. තම ප්‍රමාදය ගැන නොතැකූ ඇය ළඟ ම වූ අසුනේ හිඳගන්නා අදහසින් අඩියක් පෙරට තැබුවා ය. පළමු දැක්මේ දී මා ඇගේ මුහුණ යන්තම් දුටුවා පමණි. එහෙත් ඒ සැපු නහයත්, සුදුමැලි දිගටි මුහුණත්, බල සම්පන්න පෙනුමත් මා තුළ තදින් කා වැදී තිබුණි.

මේ සිතිවිලි රැඳුණේ නිමේශයකට ය. ආපසු හැරුණු මම එඩ්වඩ් ගේ මුහුණ දැක ත්‍රස්ත විමි. ඔහු ගීතිකා ගැයීම නවතා කළු හැඳි ස්ත්‍රිය දෙස බලා හුන්නේ ය. මුහුණේ වූ දැඩි බව පළ කළේ කිසියම් ප්‍රබල හැඟීමක් පාලනය කර ගැනීමට උත්සාහ දරන බවයි. ඔහුගේ මේ පෙනුම අඳුර අතීතයට අයත් වූවකි.

මගේ ඇස් කාන්දමකට මෙන් නැවතත් අර ස්ත්‍රිය වෙත ඇදී ගියේ ය. දැන් ඇය දොර ළඟ ම අසුනේ හිඳ සිටියි. ඇය මා දෙස බලා සිටී? නැත! මා පසුකොට ඇය බලන්නේ එඩ්වඩ් දෙසයි! ඒ බැල්ම නොනැවෙන සුළු විය.

නළලට අතගසා ගත් එඩ්වඩ් එක් වර ම සමාව ඉල්ලමින් අසුනින් ඉවත් විය. සන්සුන් මුහුණෙන් යුතුව බිම බලාගෙන ම ඔහු දේවස්ථානයෙන් පිට විය. අර ස්ත්‍රිය ඔහු යන දෙස බලා සිටියා ය.

මේ සම්පූර්ණ සිදුවීමට විනාඩියකට වඩා ගත නොවී ය. ඒ අතර ඊළඟ ගීතිකාව ඇරඹී තිබුණි. තාත්තාගේ හදිසි අතුරුදන්



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 21

වීම නිසා වික්ෂිප්තව සිටි ජොනතන් සැනසෙන පරිදි සිනාවක් පෑ මම ඔහු හා එක්ව ගීතිකා ගයන්නට වීමි. මේ කාලය තුළදී හැකිතාක් සන්සුන් වීමට මම වග බලා ගතිමි. බොහෝ දෙනා මෙය දකින්නට ඇත. රොචෙස්ටර්වරුන් දේවස්ථානයට ආ පළමු දිනයේ ම ඕපාදූපවලට ගොදුරු විය යුතු නැත. එඩ්වඩ්ගේ හදිසි අතුරුදහන් වීමට හේතුව අර අබිරහස් ස්ත්‍රිය ගේ පැමිණීමද? එසේ නම් ඇය එඩ්වඩ්ගේ කව්ද? ප්‍රශ්න රැසක් මට වද දුන්නත් මම සන්සුන් වීමට උත්සාහ කළෙමි.

අන්තිමේ දේව මෙහෙය නිමා විය. අර ස්ත්‍රිය ගේ ලකුණක්වත් නොවී ය. අප පිටතට පැමිණීමට පෙර ඇයට පිටව යන්නට ඕනෑ තරම් වෙලා තිබුණි. ඕල්ඩ් හවුස් අලුත් තීන්ත ගා ඇත. උද්‍යානය ද පිරිසිදු කොට තිබේ. ඇය ටික කලක් මෙහි නවතිනු ඇතැයි මම අනුමාන කළෙමි.

අප නිවසේ ගේට්ටුව වෙත ළඟා වත් ම, නිවසේ සිට පල්ලිය දක්වා වැටී ඇති කෙටි පාර දිගේ අද්භූත ගැහැණිය සමග ග්‍රේස් පූල් එනු දැක මම මවිත වීමි. නිවසට ඇතුළු වූ මා එඩ්වඩ් කොහිදැයි අසන විට මෙහෙකාරිය පැවසුවේ ඔහු තවමත් නොපැමිණි බවයි.

දිවා ආහාරය සූදානම් වුවත් මට කෑමට සිතක් නොවී ය. වික්ෂිප්ත වූ මා කළේ නැවතත් පාර දෙසට දිව යාමයි. එහෙත් එඩ්වඩ්ගේ හෝ කාන්තාවන් දෙදෙනාගේ ලකුණක්වත් නොවී ය.

උදේ අහස වළාකුළින් බර විය. ඉබාගාතේ ඇවිද ගිය මට පෙණුනේ, ඉතා උනන්දුවෙන් කතා කරමින් මට පිටුපා ඇතට ඇවිද යන කළු හැඩි රූපකායන් දෙකයි. මට ඔවුන් පෙනුණේ විශාල තණ පිටියේ පැන පැන යන කපුටන් දෙදෙනෙකු ලෙසයි.

මම ආපසු හැරුණෙමි.

මා ආපසු එන විටත් එඩ්වඩ් පැමිණ සිටියේ නැත. ඔහු කොහි ගියා ද? මට පණිවිඩයක් නොඑව්වේ ඇයි? පුතු සිප සනසා වෙදර්ෆීල්ඩ් වෙත පිටත් කළ මම ඔහු එන තෙක්



නොඉවසිලිමත් වීමි. රාත්‍රී නවයටත් පසු මිල්කෝට් වල සිට පැමිණි මිනිසෙක් එඩ්වඩ්ගේ පණිවිඩයක් මා අත තැබී ය. හදිසි ව්‍යාපාර කටයුත්තක් සඳහා ඔහු මැන්චෙස්ටර් ගොස් තිබුණි. ආපසු ඒමට දින කිහිපයක් ගත වනු ඇත.

මම විස්මිත වීමි. වසර දහයක විවාහ දිවිය තුළ කිසිම දිනක ඔහු මට නොකියා නිවසින් පිටව ගොස් නැත.

සැකයෙන් බියෙන් පිරි හුදෙකලා දිගු සතියක් ගෙවී ගියේ ය. ග්‍රේස් පූල් සහ ආගන්තුක ස්ත්‍රිය අතර ඇති සම්බන්ධය කුමක්ද? එඩ්වඩ් ඇගේ කව්ද?

මේ ගැන පූල්ගෙන් ඇසිය නොහැක. ඇය සේවිකාවකි. අනික ඇය කිසිසේත් විශ්වාසවන්ත නොවී ය.

එඩ්වඩ් නැති දිනවල ග්‍රේස් පූල්ගේ හැසිරීමේ කිසිදු වෙනසක් නොදක්නා ලදී. අද්භූත ගැහැණිය පිළිබඳව ඇය දැන සිටියත් මට ඒ ගැන කළ හැකි කිසිවක් නොවී ය.

මේ කාලයේ දී ම නාඳුනන මිනිසෙක් විසින් ගෙනෙන ලද ලිපියක් විවර නොකොට ම එඩ්වඩ්ගේ මේසය මත තබා තිබුණි.

මෙලෙස ආරම්භ වූයේ මා වටා සිදුවන බොහෝ දෑ පිළිබඳව අවබෝධ කරගත නොහී ගෙවුණු කාලයකි. අතීතයේ තෝර්න්ෆීල්ඩ්හි ජීවත්වූ කාලයේදීවත් අවට පරිසරය ගැන මෙතරම් අවිනිශ්චිතව නොසිටියෙමි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 22

## 10

**මා** දැන් ඔබ කැඳවා ගෙන යන්නේ ලන්ඩන් නුවරටයි. හදිසියේ නිවසින් පිට වී එඩ්වඩ් ගියේ එහි ය. තේම්ස් ගඟේ ජනාකීර්ණ වරායට ඇතුළු වූ ඔහු "ග්‍රොවර් සහ සිම්ස්" නැව් සමාගමට අයත් "ජේනස්" නම් නැව කුළියට ගත්තේ ය.

එදා ම සවස වරාය අසළ වූ අතුරු සිදුරු නැතිව සෙනගින් පිරුණු තානායමකදී ඔහු නැවේ කපිතාන් වරයා හමු විය.

"මොන ම හේතුවක් නිසාවත් ජැමෙයිකාවෙ කිංග්ස්ටන් වල නවත්තන්ට එපා. මගෙ යාළුවො කියලා තියෙනවා එහෙදි හරියට කරදර වෙනවලු. කිංග්ස්ටන්වල නැවැත්තුවොත් නැවටයි, බඩු වලටයි, සේවකයන්ටයි ලොකු තර්ජනයක් වෙයි. ඒ නිසා මම ඔබට අණ කරනවා ජැමෙයිකාව සම්පූර්ණයෙන් ම අතෑරලා යන්න කියලා.

කපිතාන් එකඟ විය.

"ඔබ කියන විදියට කරන්නම් රොචෙස්ටර් මහත්තයා".

එලෙස සිය ව්‍යාපාර කටයුත්ත අවසන් කළ එඩ්වඩ් ආපසු ගෙදර ආවේ ය.



## 11

**සි**තියකට පසු රාත්‍රී කෑමට ඔන්න මෙන්න කියා තිබිය දී එඩ්වඩ් ආපසු ආවේ ය. බර අඩි තබමින් පැමිණි ඔහුගේ කණස්සලු මුහුණ මා තැති ගැන්වී ය. මා සිප ගත් ඔහු මහත් තෙහෙට්ටුවකින් පුටුවක් මත වැටුණේ ය.

"බොන්න මොනව හරි ගේන්නද?" මම නැගී සිටියෙමි.

"ඉඳගන්න ජේන්. වැඩකාරිට කතා කරන්න. ඔයා මගෙ අතට පයට සේවය කරන්න ඕන නෑ".

සීනුව නාද කළ මම සන්සුන් බවක් මවා ගනිමින් යළි හිඳ ගතිමි. කිසිදු පැහැදිළි හේතුවක් නොදන්වා ඔහු දින ගණනක් නිවසින් පිට වී ගියේ ය. දැන් කිසිදු හේතුවක් නැතිව මා හා කෝප වී සිටී.

"උණු රම් එකක් කන්තෝරු කාමරේට ගේන්න" සේවිකාවට අණ කළ ඔහු වහා නැගිට කාමරයෙන් පිට විය.

කෑම මේසයේ දී එඩ්වඩ් කෑව නොව අතගෑවා පමණි. ඔහු වචනයක්වත් කතා කළේ ද නැත. නිවසට ඇතුළු වූ අවස්ථාවටත් වඩා දැන් ඔහුගේ මුහුණ අඳුරුය. කුතුහලය කෙතරම් ප්‍රබල වුවත් මේ වෙලාවේ ප්‍රශ්න අසා ඔහු වෙහෙස කිරීම නොමනා ය. එහෙත් සේවිකාව පිටතට ගිය අතරේ මම ඊට අවස්ථාවක් සොයා ගතිමි.

"මොකක්ද එඩ්වඩ් ප්‍රශ්නෙ? ඔයා හරි නිශ්ශබ්දයි. මොනව හරි තියෙනව නම් මටත් කියන්නකො".

මුලින් මුණිවත රැකි ඔහු පසුව ගුගුළේ ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 23

"ඔයා හරි නං අහන්න ඕනෙ මොනවද වෙලා තැත්තෙ කියලා. හොඳයි මේක කියවන්න".

ඔහු සාක්කුවෙන් ගත් ලිපියක් මා වෙත දිගු කළේ ය. මෙය අර නාඳුනන මිනිසා හේ සිට ගෙනා ලිපිය නොවූවත්, ඔහු නැති අතරේ ආ තවත් එකකි. අඩිලේ ගේ අත් අකුරු මම වහා හැඳින්නෙමි කලක් මා යටතේ උගත් ඇය මේ වන විට ස්විස්ටර්ලන්තයේ පාසලක උගත්තාය. ආදරණීය යෙදුම් සහිතව ලියා තිබූ ලිපියේ සඳහන් වූයේ තමා දැන් දහ අට හැවිරිදි තරුණියක බැවින් පාසලෙන් අස්ව ගෙදර ඒමට තීරණය කර ඇති බවයි.

ඇඩිලේ හා මා අතර වූයේ දියාරු සම්බන්ධතාවකි. වසර ගණනක් නිවසින් බැහැර පාසලක උගත් ඇය සොළොස් වියේ දී ස්විස්ටර්ලන්තයට යවනු ලැබුවා ය. ඇය උගත් පාසල, සිසුන් ගේ ආකල්ප වර්ධනය මෙන් ම ඔවුන් මනාව සමාජගත කිරීම අතින් ද අපේ රටේ කිසිදු ආයතනයකට සම කළ නොහැකි තරමේ කීර්තියක් ඉසිලී ය.

ඇඩිලේ වෙනුවෙන් කළ හැකි හැම දෙයක් ම කර ඇත. එහෙත් දැන් තරුණියක ගේ වගකීම කරට ගැනීමට සිදු වීම මට දරාගත නොහැකි තරම් විය. කෙසේ වුවත් මා පැවසුවේ මෙපමණකි.

"එයාට බැරිද අපේ දරුවා ලැබෙනකම් එහෙ ඉන්න?"

"ඔයාට ඕනෙ නම් අපි එහෙම කියලා යවමු".

"නෑ එඩ්වඩ් ඔයාට ඕනෙ නම් එහෙම කියලා යවමු. මම නිකං යෝජනාවක් කළා විතරයි".

"හොඳයි. එහෙනම් ඔයාම ඒ ගැන ලියලා යවන්න".

"එයා ලිවුම එව්වෙ ඔයාටනෙ. ඉතිං ඔයා ම ලියන එක නේද හොඳ?"

"මට බෑ. ඔයා ලියන්න".

ඔහු නැඟී සිටියේ ය.



"සමාවෙන්න ජේන්. මම දැන් කන්තෝරු කාමරේට යනවා. වැඩ ගොඩ ගැහිලා. සුබ රාත්‍රියක්"

මම තනි වීමි. ඔහු ගේ ස්වරයේ වූ උදාසීන බව මා වෙව්ලවී ය. ෆර්න්ඩීනයේ දී ඔහු කොතරම් ආදරයෙන් සිටියා ද? දැන් මෙහි ආ හැටියේ ම සැර පරුෂ පැරණි රොචෙස්ටර් නැවත අවදි වී ඇත.

කෑම කාමරයෙන් පිටවූ මට පඩිපෙළ පා මුල දී මිසිස් පූල් හමුවිය.

"කෑම හොඳට තිබුණ ද නෝනා?"

"ඔව් මිසිස් පූල්. බොහොම ස්තුතියි".

"එත් අද ඔබලා දෙන්න ම හරියට කෑවෙ නෑ"

"මහත්තයට අද මහන්සියි. මටත් ටිකක් අසනීපයි වගේ. ඒ මිසක් කෑම වල වරදක් නෙවෙයි. ස්තුතියි මිසිස් පූල්. සුබ රාත්‍රියක්"

"සුබ රාත්‍රියක් නෝනා"

මා පඩිපෙළ නගිත් ම ඇගේ ඇස් මා ලුහුබඳින බව මට දැණිනි. තමන් ගේ ම නිවස තුළ සතුරෙකු තබා ගෙන සිටීම කෙතරම් භයානක දෙයක්ද?



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 24

# 12

පසුදා උදේ මට කෙසේවත් ඇඳට වී සිටිය නොහැකි විය. එඩ්වඩ් සමග කතා කොට මෙහි අගක් මුලක් දැකිය යුතු ය. ඔහුගේ ප්‍රශ්නය දැන ගෙන මට හැකි උපරිමයෙන් ඔහුට උදව් කිරීමට මම තීරණය කළෙමි.

මම ඉක්මනින් සූදානම් වී උදේ ආහාරය සඳහා ගියෙමි. එඩ්වඩ් වතු කළමනාකරු සජන් මහතා සමග වත්ත බැලීමට ගිය බව ග්‍රේස් පූල් මට දැන්වූවා ය.

"තාම උදේ වැඩියිනෙ නෝනා. මෙච්චර උදෙන් නැගිටින එක ඔබට හොඳයි ද?"

සුළං සහිත අඳුරු දිනයකි. කඩින්කඩ වැටෙන වැස්ස ජනෙල් පියන් අතරින් කඳුළු බිඳු සේ දිස් විය. සාලයේ හිඳගත් මම ඇඩ්ලේට ලිවීමි. අනතුරුව මැහුමක් අතට ගත්තත් කුතුහලය මට වධ දුන්නේ ය. එඩ්වඩ් මා මග හරිනවාවත්ද?

දහවල තිර රෙදි වල අඩුපාඩු සකස් කිරීමට හේ සිට මැහුම් කාරියක් ආවා ය. ඇගේ කතාවෙන් ඇහැවුණේ හේ හි අප පිළිබඳ කිසියම් ඕපාදූපයක් පැතිර ඇති බවකි. එය ගණන් නොගත් මම හේ හි පාසලක් නැති අඩුව ගැන ඇසුවෙමි.

"මෙහෙ කවදාවත් ඉස්කෝලයක් තිබුණෙ නෑ. මිනිස්සු හරි ම දුප්පත්නෙ"

"තෝන්ෆීල්ඩ් වල ගොඩක් දේ වෙනස් වෙලා. ඒත් සමහර දේ තියෙනවා, සමහර මිනිස්සු ඉන්නවා කවදාවත් වෙනස් නොවෙන"



අප උඩුමහලට යන අතරේ ඈ කීවේ සරදමට මෙනි.

මා දවස පුරා ම මග බලා සිටියත්, අන්තිමේ ඔහු ආවේ මා සේවකයන් ද නින්දට යැවීමෙන් පසුව යි.

"ජේන් මා හිතුවා ඔයා නිදි ඇති කියලා. ඔයා විවේක ගන්න ඕනැ නේද?"

"මට දැන් ටිකක් හොඳයිනෙ. කෝ දෙන්න ඔයාගෙ කෝට් එක. අයියෝ හොඳට ම තෙමිල නේද?"

"හරි ම මහන්සියි. දැන් නම් කන්නත් බෑ"

"වාඩිවෙලා කන්න. මෙන්න කෑම ඇරලයි තියෙන්නෙ"

"ජේන්, මට මහන්සියි. ඇඳට යන්න ඕනෙ"

"වාඩිවෙලා කන්නකො. ඔහොම සීතලේ නිදා ගත්තොත් ඔයා අසනීප වෙයි".

ඔහු නිහඬව කන්නට විය. කෑම පිඟාන අඩක් පමණ හිස් වත් ම මම මාතෘකාවට බැස්සෙමි.

"එඩ්වඩ් මට දෙයක් අහන්න තියෙනවා. ඔයා ඒකට උත්තර දෙනවද?"

"මට පුළුවන් දෙයක් නම්" ඔහුගේ හඬ දුර්වල විය.

"ගිය ඉරිදා ඇයි ඔයා අච්චර හදිසියෙ පල්ලියෙන් ගියේ? ඊට පස්සෙ අපට කතා කරන්න වුණේ ම නැනෙ".

"මට හදිසියෙ අසනීපයි වගේ දැණුනා. ඒත් පස්සෙයි මට තේරුණේ මට ලෙඩක් නෑ කියලා. ඒක එච්චර පුදුමයක් නෙවෙයිනෙ. ඇයි ජේන් ඔයා මේ කවදාවත් නැතිව මට වද දෙන්නෙ?"

"මං හිතුවෙ ඔයා හදිසියෙ ගියෙ ඔල්ඩ් හවුස් වල ගෑණු කෙනා හින්දයි කියලා".

කෑම නැවතූ ඔහු ගොත ගැසී ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 25

"ගෑණු කෙනා? මොන ගෑණු කෙනාද? ආ... ඒ ගෑණු කෙනා. ආ... එයාව නම් මං අඳුන ගත්තා තමයි. ඒත් මං පලලියෙන ගියේ ඒක නිසා නෙවෙයි. ජේන්! මට මහන්සියි. දැන් ඔයාගෙ කරදරේ නිසා කැමත් එපා වුණා".

"එහෙම කියන්නෙපා එඩ්වඩ්. මං ඔයාට කරදර කරන්න හිතුවෙ නෑ".

"හරි හරි" ඔහු නැවත කන්නට විය.

මිනිත්තු කීපයක නිහඬතාවක් පැතිරිණ.

"ඒ කියන්නෙ ඔයා එදා ඒ ගෑණු කෙනාව අඳුන ගත්තා නේද?" මම නැවතත් පීල්ලට වැටුණෙමි.

එඩ්වඩ්ගේ මුහුණ කෝපයෙන් බැබළුණේ ය. "මං නිදා ගන්න යනවා" කී ඔහු කිසිදු වැළඳ ගැනීමකින් හෝ සමුගැනීමකින් තොරව පිටව ගියේ ය.

කාමරයට ගිය මම නොනිදා රැය පහන් කළෙමි. අප දෙදෙනා අතර ඇති වෙමින් තිබෙන මේ පරතරයට හේතුව කුමක්ද? දුක්බර, රුදුරු රැයක් ගෙවී ගියේ ය. කෙසේ වුවත් තෝන්ෆීල්ඩ් මන්දිරයේ දී මා අත්දුටු අවසාන රුදුරු රැය එය නොවී ය.





තවත් අඳුරු දිනයක්! උදේ වරුව ම මම ඇඳට වී සිටියෙමි. අපේ දුරස්වීම මා අප්‍රාණික කළේ ය. නිවස නිහැඬියාවේ ගිලී ඇත. වැස්ස නොනැවතී ඇද හැළේ. දිවා ආහාරයට පෙර තෙමීගෙනම ගෙට ආ එඩ්වඩ් ඇඳුම් මාරු කර පැමිණ මා කෑමට කැඳවා ගෙන ගියේ ය.

"ජේන් මට සමාවෙන්න. ඊයෙ රෑ මං ටිකක් කලබල වුණා".

"වැරැද්ද මගෙයි. මමනෙ ඔයා මහන්සි වෙලා ඉන්න වෙලාවෙ කරදර කළේ".

අප එකිනෙකා දෙස බලා සිනාසෙත් ම ග්‍රේස් පූල් ආවා ය.

"මහත්තයව හමුවෙන්න කව්ද නෝන කෙනෙක් ඇවිත් ඉන්නව.

"ඇයි මිසිස් පූල් කන වෙලාවට කරදර කරන්නෙ? කව්ද ඇවිත් ඉන්නෙ?"

"එයා කිව්වෙ නෑ".

"එහෙමනම් ටිකක් වෙලා ඔහෙ හිටපුවාවෙ"

"මහත්තයා දැන් ම එයාව හමුවුණොත් හොඳයි". ඇගේ ස්වරය අවවාදාත්මක ය.

"මොන විකාරයක් ද මේ! කව්ද ඔය නෝනා?"

මඳක් පසු බා සිටි ඇය පහත් හඬින් කොඳුළා ය.

"රෝලන්ඩ් නෝනා"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 26

ඔහුගේ මුහුණ වෙනස් වනු මට දැණිනි. ඊළඟ මොහොතේ ඔහු පිටව ගියේ ය.

"මොකක්ද මිසිස් පූල් මේ වෙන්න යන්නෙ? කව්ද ඔය රෝලන්ඩ් නෝනා?"

"ඒක ඔබ නොදන්න තරමට හොඳයි නෝනා"

"මිසිස් පූල් උඹට ඔච්චර හයියක්! මිසිස් පූල්!" මා ගුගුරද්දී ඇය ද පිටව ගියා ය.

සැණෙකින් මම කන්තෝරු කාමරය දෙසට ගියෙමි. ඔවුන් උස් හඬින් බැණ ගන්නා හඬ ඇසුණත් වචන පැහැදිලි නොවී ය.

එක් වර ම දොර ඇරී කාන්තාව එළියට ආවා ය.

"ඔබට මේක කරන්නම වෙනවා රොචෙස්ටර් මහත්තයා. මං දැන් යනවා. හැබැයි ආපහු එනවා. ඒක දෙයියො බලා ගනීවි"යි ගිගිරූ ඇය මා නොදැක ම ගෙයින් පිට වූවා ය. කාමරය තුළ පුටුවක් පෙරළී ගියේ ය. මා සාලය වෙත යත් ම මිසිස් පූල් එහි දොර හැර දුන්නා ය. ඇගේ දෑස් විජයග්‍රාහී විය.

පුටුවකට බර දුන් මට තදබල අසනීප ගතියක් දැනෙන්නට විය. අනේ දෙයියනේ මගෙ දරුවා!

මේ ගැහැණිය එඩ්වඩ්ගේ පැරණි පෙම්වතියක්වත්ද? මෙතෙක් අප ගත කළ ප්‍රීතිමත් ජීවිතයට කණ කොකා හැඬුවේ ඇය නිසා ය. සමහර විට ඇය එඩ්වඩ් ගේ දැන් පෙම්වතිය වන්නට ඇති. ඔවුන් මැන්චෙස්ටර් වල දී හමුවුණා වන්නට බැරිද? එසේ නම් ග්‍රේස් පූල් මෙහි සිටින්නේ ඒ සියලු රහස් දන්නා නිසාද? එඩ්වඩ් ඇය රැගෙන ආවේ ද මැන්චෙස්ටර් සිට ය.

මෙවන් සැකයක් මා තුළ කිසිදා ඇති වී නැත. දෙයියනේ මා කෙසේ එඩ්වඩ් සැක කරන්නද? පසුගිය වසර දහය තුළ ඔහු කෙතරම් අවංක වීද? මම අවුලෙන් අවුලට පත් වීමි.

හදිසියේ එඩ්වඩ් ආවේ ගමනක් යාමට සැරසීගෙන ය.



"ජේන් දැන් මට මැන්චෙස්ටර් යන්න තියෙනවා. මට සමාවෙන්න. ඊට පස්සෙ මට ලන්ඩන් යන්න වෙනවා". ඔහුගේ මුහුණේ දුක මෙන් ම ආදරය ද පිරී තිබුණි.

"මම බඩු ලෑස්ති කරන්නම්".

"මිසිස් පූල් ඔක්කොම ලෑස්ති කළා. ජේන්, මං දැන් යන්න ඕනෙ" ඔහු මා වැළඳ ගත්තේ ය. ඔහුගේ දෑස් කඳුළින් පිරී තිබුණි.

"මං කැමැත්තෙන් ඔයාව දාලා යනවා නෙවෙයි ජේන්, ඒත් මොනව කරන්නද? හොඳින් ඉන්න පැටියො. අපේ දරුවා ගැන පරිස්සම් වෙන්න"

ඔහු නික්ම ගියේ ය.

මට මේ කිසිවක් නොතේරෙයි. මේ ගැහැණිය එඩ්වඩ්ගේ පැරණි පෙම්වතියක් වුවත්, දැන් පෙම්වතිය වුවත් වැඩි වෙනසක් නැත. කෙසේ වුවත් ඔහු තවම මට ආදරය කරයි. එසේ නම් අප දෙදෙනාට එක් වී සියලු ප්‍රශ්න විසඳා ගත හැකි ය. ඔහු මට ආදරේ නම් අපට කිසිදු කරදරයක් සිදු නොවනු ඇත.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 27

# 14

පසුදින මා අවදි වූයේ හිත හදාගෙනයි. එඩ්වඩ් නොසිටියත් මා අතින් ඉටුවිය යුතු යුතුකම් රැසකි. මා ටොඩ් පූජකවරයා හමු විය යුතු ය. ඒ ගමනේ දී ඕල්ඩ් හවුස් පසු කර යාමට සිදු වුවත් එය මට බාධාවක් නොවේ.

මා රියෙන් බසින විට ඕල්ඩ් හවුස්හි දොර ජනෙල් වසා තිබුණි. උදේ ආහාර ගනිමින් සිටි පූජකවරයා මා කැඳවා ගෙන ගොස් ඔහුගේ ගෙඋයනත් පළතුරු ගසුත් පෙන්නුවේ ය. මී මැස්සන් නද දෙන මී වද අසළ සිටගෙන අපි කතාවට වැටුණෙමු.

"ඒක නෙවෙයි ටොඩ් මහත්තයා. මේ ගමට ඉස්කෝලයක් නෑ නේද? මං මේ ආවෙත් ඔබත් එක්ක කතා කරලා අලුතින් ඉස්කෝලයක් පටන් ගන්න පුළුවන්ද බලන්න. ෆර්න්ඩීන් වලත් මම ඉස්කෝලයක් පටන් ගත්තා. ඉතිං මෙහෙ මිනිස්සුත් ගොඩක් දුප්පත් නිසා මට හිතුණා මෙහෙත් ඉස්කෝලයක් පටන් ගන්න තියෙනව නම් ලොකු දෙයක් කියලා. ළමයින්ට ලියන්න කියන්නවත් උගන්නන්න පුළුවන්නෙ".

"මං මේ වරදකට කියනවා නෙවෙයි නෝනා. ඒත් ඔය පොඩි මිනිස්සුන්ට උගන්නන්න යන එක නම් එච්චර මොළේ ඇති වැඩක් නෙවෙයි. මේ ගමට වෙලා තියෙන්නේ අධ්‍යාපනය නැති කම නෙවෙයි. රස්සාවල් නැති කම. ඉස්සර ගම්මු ජීවත් වුණේ රෙදි වියලා. ඒත් දැන් නගරෙ ෆැක්ටරි වල මීට වඩා ඉක්මනට ලාබෙට රෙදි වියනවා. ඒ හින්දා ගමේ කර්මාන්තෙ නැත්තට ම නැතිවෙලා ගියා. මේ වගේ තත්ත්වයක් තියෙද්දි අපි මිනිස්සුන්ගෙ ඔළු වලට ඕන නැති අදහස් දාන එක ටිකක් භයානක වැඩක්".

UPLOADED BY ELIFE



මේ පිළිතුර මා පුදුමයට පත් නොකළේ ය. කෙසේ වුවත් මගේ ව්‍යාපාරය දියත් කිරීමට පෙර ගමේ පූජකවරයාට දැන්වීම යුතුකමකි.

"හොඳයි ඉස්කෝලෙකට ගැලපෙන ගොඩනැගිල්ලක් මේ ගමේ තියෙනවද?"

"මොන පිස්සුද? එහෙමනම් ඉතිං අලුත් එකක් හදන්න වෙනවා. එතකොට ඉතිං ආපහු පරණ ප්‍රශ්නෙමයි. කොහෙන්ද සල්ලි හොයාගන්නෙ?"

"සමහර විට පොහොසත් අයගෙන් එකතු කර ගන්න පුළුවන් වෙයි".

"ඒ අයගෙ උදව් ගැන නම් සැකයි. දැන් බලන්න පල්ලියෙ වහලත් හොඳට ම අබලන්. ඒත් ඒකටත් සල්ලි එකතු වෙන්නෙ හරි හිමින්"

"ඒක නම් අවාසනාවක් තමයි. ඒත් අර අලුත් නෝනා, රෝලන්ඩ් නෝනා උදව් කළේ නැද්ද?"

"මොකද නැත්තෙ!"

"එහෙනම් කොච්චර හොඳද. එයා ගැන ඔබ මොනවද දන්නෙ ටොඩ් මහත්තයා?"

"එච්චර දෙයක් නෑ. එයාගෙ නම ජස්ටින් රෝලන්ඩ්. එයා ඉංග්‍රීසි වුණාට ප්‍රංශ මහත්තයෙක් බැඳලා පැරීසියෙ තමයි ඉඳල තියෙන්නෙ. අවුරුද්දකට විතර ඉස්සෙල්ලා මහත්තයා මැරුණලු".

"එතකොට මෙහෙ ඇවිත් තියෙන්නෙ?"

"ටිකක් නිවී හැනහිල්ලෙ ඉන්න වෙන්නැති. එයාට එංගලන්තෙ කව්රුවත් නැලු".

මේ විස්තර අසා ගත් මම ඔහුගෙන් සමු ගතිමි. රෝලන්ඩ් නෝනා පූජකවරයාට කියා ඇත්තේ සත්‍ය ම නම් දැන් මාත් ඈ ගැන තරමක් දුරට දනිමි.



WWW.EXPRESSLANKA.TK 28

ගම්මැද්දේ දී රථයෙන් බට මම, ගම ගැන යම් අවබෝධයක් ලබා ගැනීමේ අදහසින් පයින් යාමට තීරණය කළෙමි. ගමේ විශාලතම නිවසේ හිමිකාරිය හැටියට මා ගමට සේවය කළ යුතුය. කුඩා ගෙවල් එක පොකුරේ පිහිටා තිබුණි. වතුර බාල්දියක් විසි කිරීමට ආ කාන්තාවක් මා දැක මුව අයා වහා ම ගෙට වැදී දොර වසා ගත්තා ය. බිත්තියකට හේත්තු වී සිටි තවත් මිනිස්සු දෙදෙනෙක් මගේ දෙනෙත් මග හැරියෝ ය. මා වීදිය දිගේ ඇවිද යත්ම කිසියම් සංඥාවක් ලැබුණාක් මෙන් ගෙවල් වල දොරවල් වැසී ගියේ ය. මිනිස්සු අතුරුදහන් වූහ. දුම් කවුළු වලින් පිටවන දුම් නොදුටුවේ නම්, මේ ජනශූන්‍ය පෙදෙසකැයි සිතෙන තරම් ගම පාළු විය. මෙලෙස 'හේ' පසු කළ මම නිවස බලා පිටත් වීමි.

අසාමාන්‍ය සීතලකින් මම වෙව්ලා ගියෙමි. මේ සිදු වූයේ කුමක්ද? ඔවුන් මට බිය වූවාද? මා ගමෙන් ඔබ්බට ඇවිද යත්ම "රොචෙස්ටර් නෝනා"යි කව්දෝ අඬ ගැසී ය.

හැරී බැලූ මා දුටුවේ හැරමිටි වාරුවෙන් මා වෙත දිව එන මහලු මිනිසෙකි. ඔහු ළං වත් ම මම හැරී ඔහු වෙත ගියෙමි. ඔහුගේ ඇඳුම් පිරිසිදු වුවත් දිළිඳු කම කියා පෑවේ ය. ඔහු ආවේ හති දමමිනි.

"නෝනා හරි වේගෙන් යනවනෙ!"

ගමෙන් මට ඇසුණු පළමු මිත්‍රශීලී කටහඬ එයයි.

"ඇයි අඳුනන්න බැරිද? මම ආතර් කෲක්. නෝනා ඉස්සර තෝන්ෆීල්ඩ් හිටපු කාලෙ මමත් එහෙ වැඩ කළානෙ. ඇයි මතක නැද්ද? ගින්න ගැන විස්තර කිව්වෙත් මමනෙ"

මම විස්මිත විමි. ඔහු කෙතරම් මහලු වී ඇත්ද? ඔහු දිළිඳු ජීවිතයක් ගත කරන බව ඇසූ මම එඩ්වඩ්ට කියා ඔහු වෙනුවෙන් යමක් කරන බවට පොරොන්දු වීමි. එහෙත් ඔහු එයට විරුද්ධ විය.

"මම දක්කා නෝනා ගම්මැදෙන් එනවා. මිනිස්සු ඉස්සරහ කතා කරන්න බය හින්දයි මං මේ කැළෑ පාරකින් දුවලා ආවෙ.



නෝනව හරියට අඳුරන්නැතුව ගම්මු නෝනව විශ්වාස කරන් නෑ. ඒත් මං දන්නව නෝනා කව්ද කියලා"

"ඔයාට මොනවද ඕනෑ කෲක්?"

"නෝනා ග්‍රේස් පූල්ටයි අර අලුතින් ආපු නෝනටයි කියනවද මට වද නොදී ඉන්න කියලා?"

මම විස්මිත වීමි.

"ඒ කිව්වෙ? ඇයි එයාලා ඔයාට කරදර කරනවද?"

"අනේ ඔව් නෝනා. මේක පටන් ගත්තෙ නොනලා මෙහෙට ආපු දවල්වල ඉඳන්. ඒ දෙන්නා සැරින් සැරේ ඇවිත් මගෙන් ප්‍රශ්න අහනවා. ග්‍රේස් පූල් නෝනා කිව්වා ඇත්ත නොකිව්වොත් රොචෙස්ටර් මහත්තයට කියලා මාව ගෙදරිනුත් පන්නනවා කියලා"

ග්‍රේස් පූල්ට එච්චර හයියක්! මේ ගැහැණු දෙදෙනාගේ අරමුණ කුමක්ද? එයට විසඳුම ඇත්තේ ඔවුන් කෲක් ගෙන් ඇසූ ප්‍රශ්න මතයි.

"එයාලට දැන ගන්න ඕනෙ කලින් හිටපු රොචෙස්ටර් නෝනගෙ මරණෙ ගැන ගමේ මිනිස්සු මොනවද කියන්නෙ කියලා. මං හොඳට ම බය වෙලා දන්න දේ කිව්වා. ඒත් අර අලුත් නෝනගෙන්නම් බේරුමක් නෑ. කොච්චර කිව්වත් ඒ නෝනට මදි".

මහල්ලා තරමට ම මම ද බියපත් වීමි. එහෙත් ඒ බවක් නොපෙන්වූ මම ඔහු සනසා ආපසු ඇරියෙමි. මනස අවුල් වූ මම එඩ්වඩ් නිවසේ නැති බව සිහි වී තව තවත් දුකට පත් වීමි.

නිවසට ඇතුළුවත්ම මා දුටුවේ එකිනෙකාට ළංව කොඳුරමින් සිටි ග්‍රේස් පූල් සහ රෝලන්ඩ් නෝනයි. මා දුටු ඔවුන් වහා දෙපසට වූහ. රෝලන්ඩ් නෝනා බොරු ආචාරශීලී බවක් ආරූඪ කරගෙන මදෙසට ආවේ නිකම් ගොඩ වැදුණු බව පෙන්වීමට ය.

ඇයට ආචාර නොකළ මා දැඩි ගතියක් මවා ගතිමි. එහෙත් මගේ යටි හිත බියෙන් වෙව්ලයි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 29

ආතර් කෑෂක් හමු වූ බව කී මම ඔවුන් දෙදෙනාගෙන් මීට පිළිතුරක් අවශ්‍ය බව පවසමින් ඔවුන්ට සාලයට එන ලෙස අණ කළෙමි.

මා රෝලන්ඩ් නෝනාට වාඩි වීමට ඇරයුම් කළත් ඈ එය ප්‍රතික්ෂේප කොට සටනකට අර අදින්නාක් මෙන් හිටි වන හිටියාය.

"ඔයාට දන ගන්න ඕනෑ මම කෑෂක් ළඟට ගිහින් කලින් හිටපු රොචෙස්ටර් නෝනගෙ මරණෙ ගැනයි ගින්න ගැනයි ඇහුවෙ ඇයි කියලනෙ?"

මේ වදන් මට කම්මුල් පහරක් විය. බර්තා මේසන් "රොචෙස්ටර් නෝනා" නමින් හැඳින්වීම මට දරා ගත නොහැක්කකි.

"ඔය කියන්නෙ බර්තා මේසන් ගැන?"

"නෑ මං කියන්නෙ රොචෙස්ටර් නෝනා ගැන"

"රොචෙස්ටර් නෝනා මමනෙ"

"ඔයාගෙ නම ගැන හරි ආඩම්බරයි නේද? මං මේ කියන කතාව ඇහුවට පස්සෙත් ඔය ආඩම්බරකම් තියෙයි ද බලමුකෝ".

"මං දන්නෑ ඔයා මොනවා කියනවද කියලා. හැබැයි මම එකක් කියන්නම්. අර නාකි මිනිහ බය කර ගත්තා වගේ මාව බය කරන්න බෑ".

"ඔයා හරි නිර්භීතයිනෙ. කරුණාකරල වාඩිවෙලා මං කියන දේ අහන්න.

මගේ ම ගෙදර ඉඳගෙන මට ම අණ කරන හැටි! කෝප වූ මම ඇයට පිටව යන ලෙස අණ කළෙමි. එහෙත් එවිට කතාකළේ එතෙක් නිහඬව සිටි ග්‍රේස් පූල් ය.

"රොචෙස්ටර් නෝනා, ඔබ ඇයට කන් දෙනවානම් හොඳයි. ඔබ නොදන්න ගොඩක් දේවල් තියෙනවා"



මගේ මෙහෙකාරිය වූ ග්‍රේස් පූල් කතා කරන්නේ මටත් වඩා උසස් අයෙකු මෙනි. ඈය පිටතට යැවූ මම රෝලන්ඩ් නෝනාට සවන් දීමට තීරණය කළෙමි.

"හොඳයි කොහොම හරි දන් කෝ ඔයාගෙ මහත්තයා? කරදර පටන් ගන්න කොට ම අතුරුදහන් නේද?

"ඔයා කතා කරන්නෙ ඔහොම නම් ඔයාට යන්න වෙනවා"

"ඔච්චර අහංකාර නොවී මං කියන දේ අහන්න. ඉස්සෙල්ලම ඔයා මේක දනගන්න. මේක ඔයාගෙ මහත්තයා ඔයාගෙන් හැංගුවා. මම බර්තා මේසන්ගෙ අක්කා!"

මම ත්‍රස්තව ඈ දෙස බැලීමි. මෙය ඇත්තක් ද? මා අසා තිබුණේ බර්තා මේසන් ගේ අයියා කෙනෙකු ගැන පමණි. එහෙත් උමතු ස්ත්‍රිය හා මැය සංසන්දනය කරත් ම රූපය අතින් බොහෝ සමානතා මම දුටුවෙමි.

"ඔයා අසනීපෙන්නෙ. ඉඳ ගන්න"

මම කීකරු වීමි.

"දන්නවනෙ, ඔයාගෙ මහත්තයා මගේ නංගිව බඳින කොට අතේ සතේ නැතුව හිටියෙ, නංගිගෙ දෑවැද්දෙන් තමයි එයා පොහොසත් වුණේ. එයා තෝන්ෆීල්ඩ්වල අයිතිකාරයා වුණේ එයාගෙ අයියා මැරුණට පස්සෙ. නංගි ළමයි නැතුව මැරුණොත් දෑවැද්ද ආපහු අපේ පවුලට ගෙවන්න ඕනෑ කියන පොරොන්දුව පිටයි එඩ්වඩ් නංගිව බැන්දෙ. දන් බර්තා මැරිලා. ඒත් තාම දෑවැද්ද ආපහු ලැබුණෙ නෑ"

"එතකොට ඔයා ආවෙ ඒ සල්ලි ඉල්ලන්න?"

"ඒකත් එකක්. දන් අපේ පවුල ගොඩක් දුප්පත්. ඒ නිසා සල්ලි ඕනෑ. අපේ අයියා මේ ගැන එඩ්වඩ්ට ලියලා තියෙනවා. ඒත් එයාගෙන් උත්තරයක් ලැබිල නෑ".

ඇය සාවඥ ලෙස හාත්පස බැලුවා ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 30

"ඔයාට පිළිගන්න වෙනවා මේ සැප සම්පත් ඔක්කොටම වියදම් කරල තියෙන්නෙ මගෙ අසරණ නංගිගෙ සල්ලි කියලා. ඔයා හරියට මං දිහා බලන්නෙ ණය කාරයෙක් දිහා බලන්න වගේ. ඒත් හරියට බැලුවොත් ණයකාරයො ඔයාලයි. අනික මට දැන ගන්න ඕනෙ ඇත්තට ම නංගි මැරුණෙ කොහොමද කියලා. ඔයාට කවදාවත් හිතිල නැද්ද එදා ඇත්තට ම මොකද වුණේ කියලා?"

"මම දන්නවා වෙච්ච දේ" මගේ ස්වරය බාල විය.

"නෑ, එඩ්වඩ් ඇර වෙන කිසි කෙනෙක් දන්නෑ මොකද වුණේ කියලා. ඒ අබිරහස විසඳගන්නයි මම කෘක්ටයි, ග්‍රේස් පූල්ටයි කතා කළේ. ඇත්තට ම, මුලින් එඩ්වඩ් ලියලා එව්වම එයා ගින්නෙන් හොඳට ම තුවාල වුණා කියලා, අපි විශ්වාස කළා. ඒත් ඊට පස්සෙ එක එක ආරංචි ආවා. රොචෙස්ටර් සනීප වෙලා, රොචෙස්ටර් කලින් බඳින්න හදපු කෙනාව ම බැන්දා, රොචෙස්ටර් තාත්තා කෙනෙක් වෙලා, අන්තිමට රොචෙස්ටර් තෝන්ෆීල්ඩ් හදනවා කියලා! මෙච්චර දේවල් වෙද්දිත් නංගිගෙ දැවැද්ද ආපහු ගෙව්වෙ නෑ. ඉතිං ඔයා හිතන්නෙ මං ආවා කලින් වැඩියි කියලද? දැන් ඔයාට පුදුම නැද්ද මේ කිසි දෙයක් ඔයාගෙ මහත්තයා ඔයාට නොකිව්වෙ ඇයි කියලා?"

"ඔයා කිව්වට ඇත්ත දැනගන්න ආවා කියලා. මට නම් පේන්නෙ ඔයා ඇවිත් තියෙන්නෙ පළිගන්නයි".

"සමහරු ඕකට කියන්නෙ යුක්තිය කියලා. ඔයා හිතනවද මගෙ නංගි මරාගත්ත මිනිහ පස්සෙ පන්නන එක මට සතුටක් කියලා?"

"රෝලන්ඩ් නෝනා ඔයා හරි දුෂ්ටයි. වහා ම මෙතනින් පිටවෙන්න"

එහෙත් ඇය නොනවත්වයි.

"එඩ්වඩ්ට ඕනෑ වෙලාවට ම නංගි මැරුණා. ඇයි එයා බලං හිටියෙ ඔයාව බැඳගන්නනෙ. රොචෙස්ටර් ඕන කෙනෙක්ව වසහ



කර ගන්නවා. ඒත් එයා යකෙක්, අන්තිමට ඔයාට මොකද වෙන්නෙ? එයා තීරණය කළොත් ඔයාව තවත් ඕන නෑ කියලා? බලන්න ඔයා බැඳගත්තු මිනිහ දිහා!"

මම ක්ලාන්ත වීමි. ආපසු දෑස් හැර බලන විට රෝලන්ඩ් නෝනා පිටව ගොස් ය. මිසිස් පූල් මා අසළ හිඳී, ඇය මා කාමරයට කැඳවාගෙන යාමට සැරසුණත් මම ඇය පිළිකෙව් කළෙමි.

විදුලි සැරයක් වැදුණාක් මෙන් මම පැය ගණනක් ඇඳේ වැතිර සිටියෙමි. රෝලන්ඩ් නෝනා කියූ දේවල් ගැන කල්පනා කළ යුතු වුවත් දරුවා ගැන සිතා මා සන්සුන් විය යුතු ය.

කෙමෙන් අඳුර වැටෙත් ම අප්‍රාණිකව නැගිට ගත් මම එඩ්වඩ්ගේ නිදන කාමරයට ගොස් ඇඳේ හිඳගෙන ඔහු නැති වීම ගැන ළතවුණෙමි. මා කෙතරම් අසරණද? එඩ්වඩ් මේ කිසිවක් මට නොකියා සිටියේ ඇයිද යන්න දැන් මට ඇති ලොකු ම ගැටලුවයි. පෙර ඔහු තුළ මා ගැන වූ විශ්වාසය දැන් කෝ? ඉස්සර ඔහුගේ හැම ප්‍රශ්නයකදී ම හවුල්කාරිය වූයේ මායි. රෝලන්ඩ් නෝනා ගේ චෝදනා මම ගණන් නොගත්තෙමි. මට ප්‍රහේලිකාවක් වූ එක ම දෙය එඩ්වඩ් ගේ නිහඬ බවයි.

කාමරයෙන් පිට වී එඩ්වඩ් ගේ ඇඳුම් කාමරය හරහා යද්දී මම නැවතුණෙමි. කාමරයේ වූ මේස ලාච්චුවේ නිතර ම පිස්තෝලයක් ඇත. එය ඔහු රැගෙන ගොස් ඇත්දෝයි සැකයෙන් මම ලාච්චුව ඇරියෙමි.

පිස්තෝලය එසේ ම තිබෙනු දැක මම සැනසුණෙමි. එහෙත් එය පසෙක වූ තවත් කුඩා වස්තුවක් ලාම්පු එළියට දිළිසිණ. අතිශය සුන්දර ගැහැණියක ගේ චිත්‍රයක් වූ එය රන් රාමුවක බහා තිබුණි. මේ කව්දැයි මම දනිමි. ඇඩ්ලේ ගේ මුහුණට අතිශය සමාන වුව ද මේ ඇය නොවේ. සුන්දරත්වය කඩා හැළෙන මේ ගැහැණිය ඇඩ්ලේ ගේ මව සෙලින් වැරන්ස් ය.

මේ චිත්‍රය මා මීට කලින් දැක නැත. ෆර්න්ඩීනයේ දී මෙය එඩ්වඩ්ගේ ලාච්චුවේ නොතිබිණ. එය අතට ගෙන බැලූ මට විශාල



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 31

ඉරිසියාවක් ඇති විය. රාත්‍රිය පුරා එඩ්වඩ් මේ පින්තූරය දෙස බලමින් රස විඳිනවා ඇති.

මව මිය ගිය නිසා කුඩා කල පවා මම ආදරයක් නොලැබීමි. එවන් පුද්ගලයකු කිසිදින තමන්ට ලැබෙන ආදරය ගැන විශ්වාසය නොතබන බව මගේ හැඟීමයි. ඔවුන් සිටින්නේ තමන්ට ලැබුණු ආදරය කවදා හෝ ආපසු දෙන්නට වේදැයි සැකයෙනි. මගේ දුර්වලතම ලක්ෂණය වූ මෙම හැඟීමෙන් මම මේ මොහොතේ පීඩා වින්දෙමි.

එඩ්වඩ් ගේ තරුණ වියේ ආදරය සෙලින් ය. ඔහු දැන් ඒ මියගිය ප්‍රේමය ගැන සිතමින් ළතවීම පුදුමක් නොවේ. සමහර විට ඔහු ඇය හා මා සසඳනවා විය හැකිය. ඈ හා බලන විට මා කොතරම් කැතද!

දෙවියෝ මට සමාව දේවි. මෙවෙලේ මට කුසේ සිටි දරුවා දැණුනේ බිම තැබිය නොහැකි නිසා ඔසවාගෙන සිටින මහා බරක් ලෙසිනි. පින්තූරය ලාච්චුවට දමා කාමරයට ගියත් සෙලින්ගේ රුව මා දෑස ඉදිරියෙන් ඉවත් නොවුණි. තවත් දුක්ඛිත රැයක් ගෙවී ගියේ ය.





ශූලගේ වේදනාබර ළතෝනිය අසමින් මම නොනිදා රැය පහන් කළෙමි. මේ පීඩනය තවත් නම් තනිව දරා ගත නොහැක. එඩ්වඩ් වහා ම ආපසු ගෙන්වා ගත යුතු ය. රෝලන්ඩ් නෝනා ගේ කතාව ඇසීමත් සෙලින් ගේ පින්තූරය දැකීමත් නිසා මගේ ආත්ම විශ්වාසය මෙන් ම එඩ්වඩ් ගැන මා තුළ වූ විශ්වාසය ද බිඳී ගියේ ය.

මගේ මුළු ජීවිතය ම වෙනස් කළේ එඩ්වඩ්ගේ ආදරයයි. එය නැති වීම මට ජීවිතය නැති වීමකි. ඔහුගේ ආදරය නැතුව මා කෙසේ ජීවත් වන්නද? මේ වේදනාව මට තව දුරටත් තනිව දරා ගත නොහැක.

එඩ්වඩ් ගේ මැන්චෙස්ටර් හි ව්‍යාපාරික සගයා වන ජේසොප් මහතාට ලියුමක් ලියූ මම එඩ්වඩ්ට දෙන ලෙස හදිසි ලිපියක් ඒ සමග යැවීමි.

"රෝලන්ඩ් නෝනා ඔයා ගැන බොරු චෝදනා වගයක් කළා. මට අසනීපයි. ඉක්මනට ගෙදර එන්න".

එදා මා ජොනතන් බැලීමට ෆර්න්ඩීන් යා යුතුව තිබුණි. කාලගුණය කෙතරම් නරක වුවත්, මා කෙතරම් රෝගී වුවත් නොගිහින් බැරි ය. පුතා මා එනතුරු බලා හිඳී.

මම ඔහු වෙනුවෙන් එකතු කළ තෑගි අසුරා ගනිත් ම සේවිකාවක් පැමිණ, අශ්වයකුගේ ලාඩමක් ගැලවී ඇති නිසා දැන් ම පිටත් වීමට නොහැකි බව කීවා ය. ප්‍රමාදය වැළැක්වීම සඳහා ජේරම් රථයෙන් ම කම්මලට ගොස් ඇත.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 32

"කරත්තෙ හේ වල නම් මම එහෙට යන්නම්. එතන ඉඳන් පිටත් වෙන්න පුළුවන්නෙ" ගෙතුළ සිටීම මට වදයක් විය. මුළු නිවසේ බර මා මත රැඳී තිබෙන බවත් මට එය දරා ගත නොහැකි බවත් මට හැඟිණි.

"අනේ එපා නෝනා, ගමට තනියම යන්න නම් එපා"

සේවිකාව කීවේ බියපත් ගතියකිනි. ගමේ කෙල්ලක වූ ඇය හොඳ එකියකි.

"ඇයි එපා කියන්නෙ?"

"මං මෙහෙම කියන එකත් හරි නෑ. ඒත් ගමට යන එක නෝනට අනතුරුදායකයි."

"අනතුරුදායකයි? ඒ කිව්වෙ?"

අසරණ කෙල්ල කලබල වූවා ය.

"හේ වල මිනිස්සු හරි මෝඩයි. එයාලා මහත්තයටයි නෝනටයි බයයි. එයාලා එක එක දේවල් කියනවා. සමාවෙන්න නෝනා මං මේවා කියනවට".

ඈ එසේ කියද්දී එහි කඩා වැදුණු ග්‍රේස් පූල්, සේවිකාව පළවා හැරියා ය.

"සමාවෙන්න නෝනා, මේ මෝඩ කෙල්ල නෝනට කරදර කළා නම්, මම පුළුවන් තරම් උත්සාහ කරනවා ඒකිව හදා ගන්න. කොහෙද, ඔය ගොඩේ කෙල්ලො ඔහොමමයි. මම ඒකිට තදට ඉන්නම්කො".

"එයා කියනවා ගමේ මිනිස්සු අපි ගැන ඕපදූප කියනවලු. මං හිතන්නෙ මේකට ඔයත් සම්බන්ධයි. ඇයි ඔයයි රෝලන්ඩ් නෝනයි ඕපදූප පැතිරෙව්වනෙ. මං එකක් කියන්නම් ඔයාගෙ මේ මෝඩ වැඩ හින්දා මට ගමෙන් ඈත් වෙලා ඉන්න බෑ. ඔයාට මේකට දඬුවම් ලැබෙයි. දැන් ගිහින් මගෙ කෝට් එක ගේන්න. මම හේ පැත්තෙ යනවා".

මුහුණේ හැඟීම් මට නොපෙන්වීමට ඇය බිම බලා ගත්තා ය.



පාර්සර් කිහිපය අතින් ගත් මම ගෙදරින් පිටත් වීමි. සුළඟ තරමක් තද විය. එහෙනම් මේ ගෑණු දෙන්නගෙ විකාර කතා ගමෙත් පැතිරිලා. එහෙනම් ඒකයි හැමෝ ම මං යනකොට දොරවල් වහ ගන්නෙ.

දැන් නම් ග්‍රේස් පූල් අනිවාර්යයෙන් ම නිවසින් පිට කළ යුතු ය: එඩ්වඩ් ආ විට මේ සියල්ල කියමි.

කම්මල තිබුණේ ගමේ කෙළවර නිසා මට මුළු ගම හරහා ම ඇවිද යාමට සිදු විය. අපේ රථය කම්මල ඉදිරියේ නවතා ඇති අයුරු මට ඈතට පෙනේ. මා ඉදිරියට යත්ම ඈත සිටි මිනිස්සු තුන් දෙනෙක් මා වෙත අත දිගු කරමින් මොනවාදෝ කියනු පෙණිනි. ගම්මැද්දට යත් ම ගෙවල් වල දොරවල් මහ හඬින් වැසී ගියේ ය. පාර ජන ශූන්‍ය විය.

එක් වර ම ඉදිරියට ආ මිනිස්සු දෙදෙනෙක් පාර හරස් කරමින් සිට ගත් හ. අපිරිසිදු පෙනුමැති ඔවුන් මා දෙස බැලුවේ යක්ෂයන් මෙනි.

"මට යන්න දෙනවද?" මම හැකිතාක් සන්සුන් වෙමින් ඇසීමි.

"ඔහේ මෙහෙ නාවට කමක් නෑ" එකෙක් ගිගිරුවේ ය. මට දරුවා ගැන බය සිතුණි.

"මට කම්මලට යන්නෙ. ඔහේලට අයිතියක් නෑ මට බාධා කරන්න".

"අයිතිය අපි දන් නෑ. ඔහේ මෙහෙ එන්න අවශ්‍ය නෑ"

"ඔහේවත්, ඔහේගෙ මහත්තයවත්, කිසි ම රොචෙස්ටර් කෙනෙක්වත් මෙහෙ නාවට කමක් නෑ. මං හොඳින් කියන්නෙ. නෝනා ආපහු යන්න" අනෙකා ද තර්ජනය කළේ ය.

ගැහැණියකට පහර දීමට තරම් ඔවුන් නීච වේවිද? අනික මා ඔවුන් ගේ ඉඩම් හිමියාගේ බිරිඳයි.

"හොඳයි මොකක්ද හේතුව. ඔහෙලගෙ නම් මොනවද?"



SL UNLIMITED The Spirit of Sri Lankan e-community
UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 33

"අපේ නම් කියන් නෑ. ඒ වුණාට තේරුම් කරලා දෙන්නම්. ඔහේගෙ මහත්තයා යක්ෂයෙක්, ආත්මාර්ථකාමියෙක්, ගෑණිව මරපු මිනී මරුවෙක්. ඔහෙත් එයාගෙ වැරදි වල හවුල් කාරියක්. මෙහෙ හැම දෙයක් ම ඔහෙලට අයිති වුණාට අපේ ජීවිත ඔහෙලට අයිති නෑ. අපේ සමහරු බය නැතුව මේවා කියනවා, ඔහෙලා අපට දඬුවම් කළත්".

"කොහොමත් මේකට නම් දඬුවම් ලැබෙයි. මගෙ මහත්තයා ගැන ඔහොම කතා කියන්න උඹලට ඔච්චර හයියක්!"

"යනවා යන්න" දෙවන මිනිසා කෝපයෙන් ගිගිරුවේ ය.

කුමක් කරම්දැයි සිතා ගත නොහැක. මම අධික ලෙස බියපත් වීමි. එහෙත් මා එලවා දැමීමට ඔවුන්ට ඉඩ දිය හැකිද?

හොඳ වෙලාවට එවිට ම ජෙරමිගේ කටහඬ ඇසුණි.

"රොචෙස්ටර් නෝනා! මොකද මෙතන වෙන්නෙ?"

"අපි ආරාධනා කළා උඹලගෙ නෝනට අපට නිදහසේ ඉන්න දීලා ගෙදර යන්න කියලා".

"මෝඩ වෙන්න එපා මිනිහො".

"අපි මෝඩ තමයි. ඒත් රොචෙස්ටර් තරම් දුෂ්ට නෑ"

"කට වහපන් මිනිහො. නැත්නම් කරදරේ වැටෙයි. ඔය නෝනට එන්න ඉඩ දෙනවා. එයා මේවට සම්බන්ධ නෑ".

එසේ කෑ ගසමින් මා වෙත ආ ඔහු මගේ අතින් අල්ලා ගෙන කම්මල වෙත කැඳවාගෙන ගියේ ය. කම්මල්කරුගේ බිරිඳ මා හිඳුවා බීමට වතුර ටිකක් දුන්නා ය. බිය නිසා මම බෙහෙවින් දුර්වලව සිටියෙමි.

ජෙරමි අශ්වයන් යෙදූ වහා ම මම රියට ගොඩ වීමි. "දැන් හොඳයි නේද නෝනා? මේ ගම මහ ජරා තැනක්. නෝනා ෆර්න්ඩීන් යනවද? නැත්නම් ගෙදර යනවද?"

පුතා මා එන තෙක් බලා හිඳිනවා නොවේද?



"ෆර්න්ඩීන් යමු".

කෙමෙන් ෆර්න්ඩීන් වෙත ළඟාවත්ම පැරණි සතුට මා තුළ නැවත ඇති විය. එහෙත් අර නපුරු මිනිසුන් අමතක කිරීම පහසු නොවේ.

අප එහි ළඟා වත් ම දයාබර පුතු මා පිළිගැනීමට දිව ආවේ ය. වෙදර්ෆීල්ඩ් පවුල ම ඔහු පසුපසින් විය. මා ගෙනා තෑගි දරුවෝ එකතුව කඩා බැලූ හ.

"මට ඕනෙ ඉක්මනට මමයි පපායි එක්ක එහෙ ඉන්න"

කෑම මේසයේ දී පුතු එසේ කියන විට මගේ මුහුණේ සියල්ල ලියවී තිබෙන්නට ඇත. මා පසෙකට කැඳවූ වෙදර්ෆීල්ඩ් නෝනා තෝන්ෆීල්ඩ් වල කිසියම් ප්‍රශ්නයක්දැයි ඇසුවා ය.

"එච්චර දෙයක් නෑ. පොඩි පොඩි කරදර තියෙනවා. ඒත් ඒවා ඉක්මනින් ඇරිලා යයි. මං ඔයාට ණය ගැතියි මෙච්චර හොඳට ජොනතන්ව බලා ගන්නවට".

ඇයට තව දුරටත් ප්‍රශ්නය ගැන කියන්න තිබුණා නම් කොපමණ හොඳද? එහෙත් එඩ්වඩ් වෙනුවෙන් මා මේ ප්‍රශ්නය ලොවෙන් වසන් කර තනිව දරා ගත යුතුව ඇත. දෑස් අග වූ කඳුළු බිඳු දුටුවත් වෙදර්ෆීල්ඩ් නෝනා කිසිවක් හාරා ඇවිස්සුවේ නැත. සති ගණනකට පසු මා ලැබූ එකම කරුණාවන්ත ඇසුර මෙයයි.

"හොඳයි ජේන්. මං දෙවියන්ට යාඥා කරන්නම් ඔයාව රැක ගන්න කියලා. බය වෙන්න එපා. අපි ජොනතන්ව අපේ පුතාලා වගේ ම බලා ගන්නවා" ඇය මා වැළඳ ගනිමින් සහතික වූවා ය.

ඉක්මනින් ආපසු එන පොරොන්දුව පිට මම පුතුගෙන් සමු ගතිමි.

මා ආපසු එන විට එඩ්වඩ් ගෙදර ඇවිත් සිටියා නම්! එහෙත් තවමත් මගේ ලියුම ඔහුට ලැබී නැතුව ඇති. පාළු නිවසට ඇතුළු වූ මම යන්තම් කෑම ටිකක් කා ඇඳට වැටුණෙමි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 34

මට පැය භාගයකට වඩා නින්ද නොගියේ ය. මා අවදි වූයේ බර්තා මේසන් ගේ වියරු සිනාව ඇසීමෙනි. කට්ට කළුවරේ තනි වී අඩ නින්දේ සිටි මම බියෙන් මුසපත් වීමි. එක්වර ම මට සෙලින් වැරන්ස් ගේ සුන්දර මුහුණ ද සිහි විය. තෙහෙට්ටුවත්, පීඩනයත් නිසා මම වැළපෙමින් වැතිර සිටියෙමි. අර සිනාව දිගට ම ඇසේ. අනේ එඩ්වඩ්, ඉක්මනට මා ළඟට එන්න.



# 16

රෑය ගෙවී ගොස් දවස උදාවත් ම කිසිවක් සිදු නොවූ ලෙස හැසිරීමට මම ඉටා ගතිමි. ඊයේ සිද්ධිය ගෙදර අයටත් ආරංචි වී ඇති. මා එයින් දුර්වල වූ බවක් නොපෙන්විය යුතු ය.

ග්‍රේස් පූල් ඇගේ කාමරයේ ම තැබූ මම සජන් කැඳවා ගෙඋයන නැවත සෑදීම ගැන කතා කළෙමි. කුළීකරුවන් දෙදෙනෙකු යොදවා වැඩ පටන් ගන්නා ලෙස මම ඔහුට උපදෙස් දුන්නෙමි. තෝන්ෆීල්ඩ් මන්දිරය අත්හැර දමා තිබූ කාලයේ දී එය රැක බලා ගත් සජන් විශ්වාසවන්ත අයෙක් ලෙස සැළකූ මම ඔහු හා විවෘතව කතා කළෙමි.

"ගමේ මිනිස්සු අපේ මහත්තයට විරුද්ධ මොකද?"

"වැරදි වැටහීමක් තියෙන බව නම් මාත් දන්නවා නෝනා. ඒත් ඊට වඩා දෙයක් මගෙන් අහන්න එපා. කොහොම වුණත් මහත්තයට පුළුවන් වෙයි මේ හැම දෙයක් ම හදා ගන්න"

"මාත් එහෙම හිතනවා"

සජන් හමුවීමෙන් පසු මට කිරීමට කිසිවක් නොවී ය. ෆර්න්ඩීනයේ දී මෙන් කුස්සියට ගොස් එඩ්වඩ්ට රස කෑමක් සෑදීම දැන් කළ නොහැක්කකි. තෝන්ෆීල්ඩ් මන්දිරයේ ගෘහණිය ඊට වඩා උසස් ය. පාළුව මකා ගැනීමට වත්තේ ඇවිදීමට ගිය මම සජන් සහ තවත් පිරිසක් එක් ව බැටළු රැළක් පහළට දක්කාගෙන එන හැටි බලා සිටියෙමි.

ඇවිදීම නිසා හදවතේ තරමක සැහැල්ලු බවක් ඇති විය. තව ම මගේ ලියුම එඩ්වඩ්ට ලැබී නැතුව ඇති. මා යන විට ඔහු පැමිණ සිටීවා යි පතමින් මම ගේ දෙසට හැරුණෙමි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 35

නිවසට ඇතුළු වත් ම නෝර්ටන් ආර්යාව පැමිණ ඇති බව සේවිකාවක් මට දන්වූවා ය. මේ වූ කලී එඩ්වඩ්ගේ පෙම්වතිය යැයි මා කලකට ඉහත සැක කළ බ්ලාන්ච් ඉන්ග්‍රම් ය. ඇගේත් වංශාධිපති නෝර්ටන්ගේත් විවාහයට අපට ආරාධනා ලැබුණත් එවකට අසනීපව සිටි එඩ්වඩ් එයට සහභාගී නොවී ය. දැන් ඔවුන් තෝන්ෆීල්ඩ් වලට නුදුරු රේබෙක් මැඳුරේ වෙසෙති. මා ඇය අන්තිමට දුටුවේ ඇඩිලේ ගේ ගුරුවරිය වශයෙනි. එවකට අප අතර වූයේ සමීප සම්බන්ධයක් නොවේ. එහෙයින් මේ කරදර වෙලාවේ එඩ්වඩ් ද නැතිව ඇය මුණ ගැසීම මට අභියෝගයක් විය. කෙසේ වුවත් අපේ ප්‍රශ්න කිසිවක් ඇයට නොපෙන්වා සිටීමට මම අදිටන් කර ගතිමි.

ඇගේ කතාව පෙර පරිදිම ප්‍රසන්න විය. රූපයේ ද වැඩි වීමක් මිස කිසි ම අඩු වීමක් නැත. අප නැවත තෝන්ෆීල්ඩ්හි පදිංචි වීම ගැන සතුට පළ කළ ඇය තේ පානය කරමින් සුපුරුදු නැළවිලි ස්වරයෙන් සල්ලාපයේ යෙදුණා ය. සමහර වචන වලින් මට තේරුණේ ගමෙන් ඇසෙන ඕපදූප වල ඇත්ත නැත්ත දැන ගැනීම ඇගේ අරමුණ වී ඇති බවයි. අවසානයේ බ්‍රහස්පතින්දා ඇගේ නිවසේ සාදයකට අපට ආරාධනා කළ ඇය පිටත් වීමට සැරසුණා ය.

එහෙත් දොර අසළට ගිය ඇය හදිසි යමක් දුටු කලෙක මෙන් විස්මිතව කෑ ගැහුවා ය. එබී බැලූ මා දුටුවේ කුමක් ද? ගමනට සැරසුණු ඇඳුමින් යුතුව ගෙට ඇතුළු වූයේ ඇඩිලේයි! තරුණියක වී සිටින ඇය දැන් ඉතා රූමත් ය. මා දෙස බැලූ ඇගේ දෙතොලේ මඳ සිනාවක් වුව ද දෙනෙතේ වූයේ වෛරයකි. ඈ මා සිසාරා බැලූ බැල්මෙන් ම මා දරුවකු ලැබීමට සිටින බව දැනගන්නට ඇත. ඇගේ සම්ප්‍රාප්තිය නොදැක ආපසු යාමට අකමැත්තෙන් දෝ බ්ලාන්ච් ද ආපසු ආවා ය.

ආපසු ගෙදර ඒම ගැන අධික ප්‍රීතිය පළ කරමින් ඇඩිලේ පුටුවක් මතට ඇද වැටුණේ ජනෙල් රෙදි වල ඇද කුද ද කියමිනි. ඇගේ පැමිණීමෙන් ප්‍රීතියට පත් බ්ලාන්ච් ඈ සමග කතාවට වැටුණා ය. ඔවුන් දෙදෙනා එක්ව මහත් ප්‍රීතියෙන් ආ ගිය තොරතුරු කතා කරද්දී මා සිතුවේ ඇඩිලේ ගේ අනාගතය ගැනයි. ඇය මෙහි



කුමක් කරන්නද? කවදත් විනෝදකාමී ජීවිතයකට හුරු වූ ඇය මා සමග සමාජ සේවයේ යෙදීමට කැමති නොවනු ඇත.

ටික වේලාවකින් බ්ලාන්ච් පිටව ගියේ සාදය සඳහා ඇඩිලේටත් ආරාධනා කරමිනි.

"මදෑ යන්තම් ආපහු ගෙදර ආවා. කෝ පපා?" ඈ ඇසුවේ 'පපා' යන්න ඕනෑ කමින් ම බර කොට කියමිනි. ඇය එඩ්වඩ්ට තාත්තා කිම මට නොරිසි ය. ඇත්තෙන් ම ඇය තමන්ගේ දරුවාදැයි නොදන්නා බව එඩ්වඩ් මා හා පවසා ඇත.

"එයා බිස්නස් වැඩකට ගිහින්. ඔයාට මගෙ ලියුම හම්බ වුණේ නැද්ද? මං ලියලා එව්වනෙ ඔයාට වසන්ත කාලෙ වෙනකම් එන්න එපා කියලා".

"නෑ කුඩම්මා, මට හම්බවෙච්ච ලියුමක් නෑ. අනික මං තවත් ඉන්නෙ මොකටද? දැන් මට දහ අටයිනෙ. ඇයි ඔයා පපාට කිව්වද ඔයාගෙ ළමයා ලැබෙනකම් මාව ගෙන්න ගන්න එපා කියලා"

"එඩ්වඩ් තමයි තීරණය කළේ"

"කොහොම වුණත් මං දැන් ආවනෙ. හරි ෂෝක් මාව පිළිගන්න විදිය නම් කුඩම්මෙ ඔයා කැමති වුණත් නැතත් දැන් ඉතිං කරන්න දෙයක් නෑ. දැන් මම ඇවිල්ලා ඉවරයි".

ඇඩිලේත් මාත් එකට ජීවත්ව ඇත්තේ ඉතා සුළු කාලයකි. පසුගිය වසර දහය තුළ ම ඇය සිටියේ නිවසින් පිට ය. එඩ්වඩ් වසරකට වරක් ගොස් ඇගේ දුක සැප බලා ආවේ ය. ඉඳහිට නිවාඩුවකට පැමිණියත් ෆර්න්ඩීනයේ ඉඩකඩ නැති නිසා ඇය නැවතුණේ මගේ ඥාති සොයුරිය ළඟයි.

ඇත්තට ම මට නම් ඇගේ පැමිණීම සතුටක් නොවේ. ඇයට මෙහි කරන්නට කිසිවක් නැත.

ඇඩිලේ රෑ කෑමට නාවා ය. එඩ්වඩ් එතැයි යන නිරර්ථක බලාපොරොත්තුවෙන් මම තනිව ආහාර ගත්තෙමි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 36

# 17

තවත් දිනකට ඉර උදා විය. ලෝකය ම මා හිස මත කඩා වැටුණත් මා විසින් ඉටු කළ යුතු යුතුකම් කොටසක් ඇත. එඩ්වඩ් පිටව ගොස් අදට දින හතරකි. ඔහු ගැන තැවෙනවාට වඩා ප්‍රයෝජනවත් වැඩක යෙදිය යුතු යැයි මම සිතා ගතිමි. ගෙළයනට ගිය මම මිනිසුන් වැඩ කරන දෙස මොහොතක් බලා සිටියෙමි. වත්තේ වැඩ පරීක්ෂා කිරීමට සජන් පැමිණි විට මා මිනිරන් පතල් ඇති පැත්තට රැගෙන යන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. පළමුව ඊට බලවත් විරෝධය පෑ ඔහු මගේ බලවත් ඇවටිල්ල නිසා අන්තිමේ එකඟ විය.

පතල් ප්‍රදේශය වෙත යත් ම භූමිය නිසරු විය. මිනිරන් සෙවීමට හැම තැන ම පොළව කැණ තිබුණි. වතුර පොම්ප කරන හඬ ඇසිණි. මුදල් අගහිඟකම නිසා මිනිස්සු ශීත කාලයේදීත් වැඩ කරන බව සජන් මට කීවේ ය.

පතල් කරුවන් ගේ පැල්පත් දකීමෙන් මම සසල වීමි. හේ දුප්පත් ගමක් නම් මෙය අන්ත දුප්පත් ස්ථානයකි. එක් කාමරයකින් හෝ දෙකකින් යුක්ත මඩු වැනි පැල්පත් තිහක් හතලිහක් එහි විය. දිළිඳුකමින් බැට කන දරුවෝ ද ගැහැණු ද මුව අයාගෙන අප දෙස බලා සිටියහ.

කිහිළිකරු වාරුවෙන් ඇවිදින මිනිසකුට කතා කළ සජන් ඔහුට පෑනක් හා කඩදාසි කීපයක් දී ගමේ පවුල් වල විස්තර සහිත ලැයිස්තුවක් සාදන ලෙස උපදෙස් දුන්නේ ය. වොට්කින් නම් වූ ඔහු මට හඳුන්වා දුන් සජන්, හදිසි අනතුරක් නිසා ඔහු



තුවාල ලබා සිටින බව කී ය. සජන් ගේ ඇඟිලි ගැසීම් වලට මැන්ගන් අකැමතිලු.

ආපසු එද්දී අප අතර කතාවක් නොවී ය. මේ දුප්පත් අසරණයින් හෙටක් ගැන බලාපොරොත්තුවකින් තොර හිස් බැල්මෙන් බලා හිඳින අයුරු මා සිත සසළ කළේ ය.

පතල් කරුවන් ගේ සුබ සාධන කටයුතු වලට සිය බිරිඳ ද හවුල් කරගත හැකි බව සජන් කී ය. ඉතා සතුටින් එය පිළිගත් මම ඔහුට සමු දී නිවසට ආවෙමි.

නිදන කාමරයට පිවිසි මට කණ්ණාඩි මේසය මත වූ බඩු වල කිසියම් වෙනසක් වී ඇති බව පෙණුනි. සාමාන්‍යයෙන් මා ඉතා පිළිවෙලට වැඩ කරන නිසා මේ සියුම් වෙනස මම වහා දුක්කෙමි. කණ්ණාඩි මේස ලාච්චුව ද ඉතා පරිස්සමින් පරීක්ෂා කර බැලූ බවට ලකුණු තිබුණත් කිසිවක් නැති වී නැත. මෙය කරන්නට සිටින්නේ ඇඩ්ලේ පමණි. එහෙත් ඇගේ අරමුණ කුමක්ද? මා තුළ කෝපයක් ඇති විය. ඊළඟ මොහොතේ කිසියම් හදිසි ඉවක් ඔස්සේ එඩ්වඩ් ගේ කාමරයට ගිය මම ලාච්චුව හැර බැලීමි. සෙලින් වැරන්ස්ගේ රූපය අතුරුදන් වී තිබුණි!

සිදු වූ දේ මා නොදුටු නිසා කෙළින් ම ඇඩ්ලේට චෝදනා කළ නොහැක. අනෙක් අතට මා කළේත් ඈ කළ දේ ම නොවේද? මමත් එඩ්වගේ ගේ කාමරය සෝදිසි කළෙමි.

ඇඩ්ලේ කොහේදැයි මම සේවිකාවගෙන් ඇසීමි. ඇය අඩිපාර දිගේ දේවස්ථානය වෙත යනු දුටු බව ඇසූ මම ද එදෙසට පිය මැන්නෙමි. දේවස්ථානය අසළ කීප දෙනෙක් රැස් වී සිටියහ. බිත්තිය අයිනේ බිම දණ ගසාගෙන හඬමින් සිටියේ අඩ්ලේ යි! මා වික්ෂිප්තව බලා සිටිනාතර පූජක තැන ද එහි ආවේ ය. හඬමින් සිටින්නේ මගේ ඥාති දියණිය බව පැවසූ මම ඈ වෙතට ගියෙමි.

ඇඩ්ලේ හඬමින් සිටියේ සොහොන් කොතක් අසළ ය. "බර්තා රොචෙස්ටර් - තෝන්ෆීල්ඩ් මන්දිරයේ එඩ්වඩ් ෆෙයාර්ෆැක්ස් රොචෙස්ටර් ගේ බිරිඳ" යනුවෙන් එහි ලියා තිබුණි. මට එක් වර ම



UPLOADED BY ELIFE

WWW.EXPRESSLANKA.TK 37

බර්තා ගැන ශෝකයක් ඇති විය. කාත් කව්රුවත් නැති නොදන්නා රටක දී උමතු වී, කාමරයක සිර වී සිට කෲර ලෙස මිය යාමට ඇයට සිදු විය. එහෙත් ඇ වෙනුවෙන් අඩ්ලේ මෙතරම් වැළපීම නම් මට මහත් ප්‍රහේළිකාවකි. එකල කුඩා දැරියක වූ ඇඩ්ලේ කිසිදින බර්තා ගැන දැන නොසිටියා ය.

ඇඩ්ලේ ගේ අත ගත් පූජක වරයා ඇය පූජක නිවසට රැගෙන යන්නට හැදුවා පමණි. හදිසියේ එහි ආ රෝලන්ඩ් නෝනා වා වචනයක්වත් කතා කිරීමට පෙර ඇඩ්ලේ තම නිවසට කැඳවාගෙන ගියා ය. මම ද ඒ පස්සේ වැටුණෙමි.

රෝලන්ඩ් නෝනා හදිසියේ එහි පැමිණියා වන්නට බැරි ය. නිවසේ උඩ තට්ටුවේ සිට ඇය මේ ජවනිකාව මුල සිට ම බලා ඉන්නට ඇත.

කාන්තාවකට සාත්තු කිරීමට කාන්තාවකගේ නිවස වඩා සුදුසු යයි කියමින් පූජකතැන ඉවතට යාමට සූදානම් වූවා පමණි. එක් වර ම දොරට තඩිබාන ශබ්දයක් ඇසිණ. ක්ෂණයකින් දොර අසළ පෙනී සිටියේ එඩ්වඩ් ය! ගමන් වෙහෙස නිසා හෙම්බත්ව සිටි ඔහු කෝපයෙන් පිපිරුණේ ය.

"මොකද මෙතන වෙන්නෙ? ඇයි ඇඩ්ලේ මෙහෙට ගෙනාවෙ? එයාට මොනව වෙලාද?" කෝපාග්නියෙන් දැවුණු මේ සියලු ප්‍රශ්න විසි වූයේ මා වෙතටයි.

බියපත් වූ ටොඩ් මහතා සමාව අයදිමින් අඩියට දෙකට එළියට පැන ගත්තේ ය.

"ඇඩ්ලේ, නැගිටිනවා" එඩ්වඩ් අණ කළත් ඇඩ්ලේ "අනේ පපා" යැයි කෙඳිරි ගෑවා පමණි. එවර අඩියට දෙකට ඇ වෙත ගිය එඩ්වඩ් ඇගේ අත අල්ලා බලෙන් නැගිටුවා ගත්තේ ය. බියපත්වූ ඇඩ්ලේ විරුද්ධත්වයක් නොපෑවා ය.

"රොචෙස්ටර් මහත්තයා දරුණු මිනිහෙක් කියලා අහලා තිබුණට අදයි හරියට ම දැක්කෙ" රෝලන්ඩ් නෝනා වචනවලින් දමා ගැසුවා ය.



"ළමයට දැන් හොඳ නිසා තවත් ඔහේගේ ගෙදර ඉන්න අවශ්‍ය නැනෙ. ඔහේට ඒක දරුණු වැඩක් හැටියට පේනවනම් එහෙම හිතා ගත්තට වරදක් නෑ"

එසේ කියූ එඩ්වඩ් ඇඩ්ලේ ඇදගෙන දොරටුව දෙසට යන්නට විය.

"මට ඔහෙට කියන්න දෙයක් තියෙනවා"

රෝලන්ඩ් නෝනා කීවේ ඔවුන්ගේ මග අහුරමිනි.

"මට නම් ඔහේ එක්ක කිසි කතාවක් නෑ. අපට යන්න දෙනවා"

"බෑ. ඉස්සෙල්ලා මං කියන එක අහනවා"

"යන්න නොදුන්නොත් මං ඔහෙව තල්ලු කරලා දානවා. කාටවත් බෑ මාව නවත්තන්න. එහාට වෙනවා"

"තමුසෙ මගෙ නංගිව මැරුවා. මට පුළුවන් ඒක ඔප්පු කරන්න"

එඩ්වඩ් නැවතුණේ ය. අපි තිදෙනා ම රෝලන්ඩ් නෝනාගේ දැවෙන මුහුණ දෙස බැලුවෙමු.

"තමුසෙ විතරයි දන්නෙ එදා රෑ මොකද වුණේ කියලා. තමුසෙ කිව්වා බර්තා කාමරයෙන් පැනලා ඇවිත් ගෙට ගිනි තිබ්බා කියලා. ඊ පස්සෙ තමුසෙ ගිහින් එයාව කාමරයෙන් බේර ගන්න හැදුවා කිව්වා. එතකොට බර්තා ගෙට ගිනි තියලා ආපහු කාමරේට ගිහින් දොර යතුරු දා ගෙනද? ඒක වෙන්න පුළුවන්ද? ඇත්ත මේකයි. ග්‍රේස් පූල් අතේවත් බර්තා අතේවත් කාමරේ යතුර තිබිලා නෑ. එහෙනම් කා අතේද රොචෙස්ටර් යතුර තිබුණේ? කා අතේද තිබුණේ?

මම භීතියට පත් වීමි. සුදුමැළි වූ එඩ්වඩ් රෝලන්ඩ් නෝනා තල්ලු කර ඉදිරියට යන්නට විය.

"තමුසෙ මගෙ නංගිව කාමරේට දාලා දොර වැහුවා. මගෙ නංගිව මරන්න ඕන හින්දා තමුසෙ ගෙට ගිනි තිබ්බා".



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 38

මෙවර එඩ්වඩ් තල්ලු කළ වේගයට රෝලන්ඩ් නෝනා විසි වී ගොස් බිම වැටුණා ය. ඇඩ්ලේ ඇදගෙන පිටතට ගිය එඩ්වඩ් ඊළඟ මොහොතේ පැමිණ මා ද ඇදගෙන ගියේ ය.

"ඇඩ්ලේ මං කරත්තෙ එවන්නම්. එතකං ටොඩ් මහත්තයගෙ ගෙදරට වෙලා ඉන්නවා" යි වික්ෂිප්තව සිටි ඇඩ්ලේට අණ කළ එඩ්වඩ් මා අසුපිට හිඳුවාගෙන තෝන්ෆීල්ඩ් බලා පිටත් විය.





**ගෙ**දර ගිය වහා ම එඩ්වඩ් මා බලෙන් ම ඇඳට දැම්මේ ය. වෛද්‍යවරයා වහා ම ගෙන්වන ලදී. ඔහුගේ උපදෙස් පිට හෙදිය ද ආපසු ගෙන්වනු ලැබුවා ය.

මේවා අනවශ්‍ය යැයි කියමින් මා විරුද්ධ වුවත් එඩ්වඩ්ගෙන් නොවේ බුරුලක් ලැබුණේ. මගේ අත ගනිමින් ඇඳේ හිඳගත් ඔහු ආදරණීය ලෙස චෝදනා කරන්නට විය.

"ඔයාගෙ දහ වැඩ ඔක්කොම මම දැන ගත්තා හරිද? වත්තෙ වැඩ කරලා. ෆර්න්ඩීන් ගිහින්. ඒ මදිවට පතල් බලන්නත් ගිහින්. ඩොක්ට කිව්වා ඔයාට හොඳට විවේක ගන්න කියලා. බලන්න මං පොඩ්ඩක් එහාට මෙහාට වෙනකම් ඉඳලා ඔයා කරන දහ වැඩ".

"මට අසනීපයක් නෑ". මා එසේ කීවත් මට ඇතිවූ සතුට! එඩ්වඩ් විසින් නළවනු ලැබීමෙන් මම අධික ප්‍රීතියට පත් වීමි. ඇත්තට ම මා දුර්වලව ඇති බව දැන් නම් මට පිළිගැනීමට සිදුව ඇත.

"සමාවෙන්න සුදූ. මං ඔයාට පණිවිඩේ එව්වෙ මේ සේරම තනියම දරා ගන්න බැරි හින්දා".

"පණිවිඩයක් එව්වා? මං දන්නෑනෙ"

"මං ජෙසොප් මහත්තයට ලියුමක් යැව්වා ඔයාට දෙන්න කියලා".

"එහෙනම් මට හම්බ වෙලා නෑ. මං එතකොට ඉන්නැත්තෙ ලන්ඩන් වල. එහෙ වැඩ ඉවර වෙච්ච ගමන් මං කෙළින් ම ගෙදර

UPLOADED BY ELIFE



WWW.EXPRESSLANKA.TK 39

එන්නයි ආවෙ. ඒ එනකොට තමයි මං දැක්කෙ ඇඩ්ලේ එයාගෙ එක්කෙනෙක්ව ෂිල්ඩ් හවුස් පැත්තට ගෙනියනවා. එතන ඔයා ඉන්නවා දැකලා මාව උඩ ගියා. ඇඩ්ලේ මට කිව්වා වෙච්ච දේ අපි ආයි ඒ ගැන කතා නොකර ඉමු".

"ඒත් එඩ්වඩ් ඔයා දන්නෑ රෝලන්ඩ් නෝනා ඔයාට කියාපුවා. ඔයාටත් ඇහුණනෙ එයා කියපුවා. අනේ එඩ්වඩ් මොනව හරි කරන්න වෙයි"

ඔහු මා සිප සැනසුවේ ය.

"දැන් ඕව හිතන්නැතුව විවේක ගන්න ජේන්. ඒ ගෑණිට පිස්සු. මං දන්නවනෙ ඔය පවුලෙ අයගෙ පිස්සුව. ඒත් මං ඒ ගෑණිට ඉඩ දෙන්නෑ මගෙ පුංචි කෙල්ලට කරදර කරන්න. මං සේරම බලා ගන්නම්. ඒක නෙවෙයි ජේන්, මොකද අර ග්‍රේස් පූල්ව හිර අඩස්සියෙ දාලා?"

"එයාව එලවලා දාන්න. එයා තමයි රෝලන්ඩ් එක්ක එකතු වෙලා ඔක්කොම කරන්නෙ. මං හිතන්නෙ එයා රෝලන්ඩ්ව අවුස්සනවා".

"මං එයාට කතා කරන්නම්. හැබැයි මට නම් එයා විශ්වාසයි. රෝලන්ඩ් නෝනා විස්තර අහන්න ආපු බවත් එයා මා එක්ක කිව්වා. මම තමයි කිව්වෙ රෝලන්ඩ් එක්ක යාළු වෙලා එයා ඇවිත් ඉන්නෙ මොකටද කියලා දැන ගන්න කියලා"

"ඇයි දෙයියනේ ඔයා මට මේ ගැන නොකිව්වෙ? මං අච්චර බණිද්දිත් ඇයි ග්‍රේස් පූල් මේ බව නොකිව්වෙ?"

ඔහු සිනාසුණේ ය.

"අපි තීරණය කළා ඔයාට මුකුත් නොකියා ඉන්න. ඩොක්ට කිව්වනෙ ඔයාව කලබල කරන්න එපා කියලා. ඒත් කව්ද දන්නෙ මං එහාට මෙහාට වෙනකම් ඉඳලා ඔයා මෙහෙම දහ කරයි කියලා. බලන්න, ඔයා ඒ ගෑණිගෙ පිස්සු කතා අහලා බොරුවට කලබල වුණානෙ. ජේන් ඔය වැඩ වලින් ඔයයි දරුවයි දෙන්න ම



අනතුරේ. මේ බලන්න. මං ඔයාට ගොඩක් ආදරේ නිසා මට ඔයාට බණින්න බෑ. නැත්නම් අ[illegible]තට ම ඔයා කරලා තියෙන්නෙ වැරදි වැඩක්".

"දැන් ඉතිං මං යන්න ඕනෑ. ඩොක්ට කිව්වෙ ඔයා මහන්සි කරවන්න එපා කියලා. මෙන්න අලුත් ම පොත් ගෙනාවා. බල බල ඉන්න. හෙට අපි පුස්තකාලෙ ගැන කතා කරමු. ඔච්චරයි ඔයාට කරන්න තියෙන්නෙ. අනිත් සේරම මං බලා ගන්නම්. විවේක ගන්න. මං ඉක්මනට එනවා"

මා සිපගත් ඔහු පිටව ගියේ ය.

ඇඳේ වැතිර සිටින මට පුදුම සනීපයක් දැණිනි. තව දුරටත් මා තනි වී නැත. හැම කරදයක් ම අවසන්. තවත් කිසිවක් තිබුණත් එඩ්වඩ් ඒ ගැන බලා ගනු ඇත. ජේන් උඹ නම් හරි ම මෝඩියක්. අර පිස්සු ගෑණිගෙ කතා අහලා නිකං කලබල වුණානෙ.

ඊළඟ දින කීපය සාමකාමීව ගෙවී ගියේ ය. එඩ්වඩ් නිතර මා බලන්නට ආවේ ය. ඇඩ්ලේ ද ඉඳ හිට කර පෙව්වා ය. එඩ්වඩ් සමග කාලය ගත කිරීම ඇට දැඩි සතුටක් වී ඇත. ඔවුන් අසුන් පිට ගිය බවත්, ඇයට අලුත් ඇඳුම් මැස්සවීමට දුන් බවත් කී ඇය, මට කිව්වේ තමන් ඉතා සතුටින් සිටින බවයි. එදා පල්ලියේ දී වූ සිදුවීම අපි දෙදෙනා ම කිසි විටක සිහිපත් නොකළෙමු.

නෝර්ටන්ලාගේ සාදයට යාමට තරම් මට සනීපයක් නොවූ නිසා ඇඩ්ලේ සමග ගියාට කමක් නැද්දැයි එඩ්වඩ් ඇසී ය. "එයා හරි ආසාවෙන් ඉන්නෙ අලුත් ඇඳුම් ප්‍රදර්ශනය කරන්න. එයාව ටිකක් සමාජෙට අරින්නත් එපැයි. එයාට තියෙන්නෙ නියම පැරිස් හදවතක්" එඩ්වඩ් කියද් දී එය අනුමත කිරීම හැර මට කළ හැකි අන් දෙයක් නොවී.

සාදයට යාමට සූදානම් වී ඔවුන් දෙදෙනා මා වෙත ආහ. එඩ්වඩ් ඉතා කඩවසම් ය. ඔහුගේ අතේ එල්ලී සිටි ඇඩ්ලේ ඉතා සුන්දරයි. ඇගේ කොණ්ඩය මනවා සකසා තිබුණි. අලුත් ඇඳුමට



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 40

සිරුරේ හැඩය කැපී පෙණුනි. චරිතය අතින් නරක වුවත් රූපය අතින් නම් ඇඩිලේ අතිශයින් සුන්දරය.

එඩ්වඩ් පැමිණ මා සිප ගත්තේ ය.

"ඔයා දන්නවනෙ ජේන්. මට නම් මේ ගමන් අප්පිරියයි. ඒත් මොනව කරන්නද? යුතුකම් ඉටු කරන්නත් එපැයි"

"යමු සින්ඩ්‍රෙල්ලා. ඔයා මේ පාටියට යන්නම ඕනෙ"

ඔවුන් දෙදෙනා මට සමු දෙත්ම මගේ නෙත් දිව්වේ ඇඩිලේ ගේ ගෙල වෙතයි. ඇය පැළඳ සිටයේ රොචෙස්ටර් පරම්පරාවේ ආභරණ එකතුවේ වූ මුතු මාලයකි. ගින්න අවස්ථාවේ බැංකුවේ තිබුණු නිසා මේවා ආරක්ෂා විය.

මගේ බැල්ම දුටු ඇඩිලේ ගේ අත කරට ගියේ ය.

"පපා මට තෑග්ගක් දුන්නා. එයා නේද ලෝකෙම ඉන්න හොඳම පපා"

"ඒක ඇත්ත" මම සහතික කළෙමි. අට හැවිරිදි දැරියට වඩා ඇය වෙනස්ව ඇත්තනම් ඒ ඉතා ස්වල්පයකි.

ඔවුන් යන හඬ අසාගෙන සිටි මට කණස්සල්ලක් දැණින. අනිත් අය හැඳ පැළඳ උත්සවයකට යද්දී තමන්ට ගෙදර තනිවීමට සිදු වූ විට අප කාට වුවත් එවැනි ශෝකයක් ඇති වන බව මගේ හැඟීමයි. මා පොත් කියවීමට උත්සාහ කළත් එය සාර්ථක නොවී ය.

මධ්‍යම රාත්‍රියත් පසු වී ඔවුන් එන හඬ මට ඇසිණි. දොරවල් ඇරෙන වැහෙන හඬ. ඇඩිලේගේ සායේ සර සර ය. අන්තිමේ මුළු නිවස ම නැවතත් නිහඬතාවේ ගිලී ගියේ ය.

මට නින්ද නොඑයි. ගැහැණියකට ලැබිය හැකි හැම සම්පතක්ම තිබියදීත් මා තුළ ශෝකයක් ඇත. සමහර විට කාමරයට කොටු වීම නිසා මේ උදාසීන ගතිය ඇති වූවා විය හැක. අන්තිමේ දී මා නිදා ගත්තේ හෙට උදයේ වෛද්‍යවරයා පැමිණි විට වෙනදා මෙන් පිටතට යාම අවසර දෙන ලෙස ඉල්ලීමට අධිෂ්ඨාන කරගෙන ය.



# 19

වෛද්‍යවරයා පැමිණ මට පිටතට යාමට අවසර දුන්නේ ය. ඇඳ පැළඳ ගෙන කන්තෝරු කාමරයට පැමිණි මා දුටු එඩ්වඩ් සතුටින් ඉපිලී ගියේ ය. ජනේලය අසළ කවිච්චියේ දිග ඇදී පොතක් බලමින් සිටි ඇඩිලේ මට සනීපදැයි ඇසුවා ය.

"ඔව්, ඩොක්ට කිව්වා මට එළියට යන්න කියලා".

"හොඳයි. ඒත් ගෙයින් පිට යන්න බෑ" එඩ්වඩ් තරවටු කළේ ය.

"නෑ. ඩොක්ට කිව්වා පොඩි රවුමක් යන එක හොඳයි කියලා. අනේ එඩ්වඩ් මම සජන් නෝනා හම්බවෙලා එන්නද? පතල් කාරයන්ගෙ වැඩේ ගැන කතාකර ගන්න තියෙනවා"

"අනේ මන්දා ඒකෙන් ඔයාට සනීපයක් වෙයිද කියලා. අනික ඔය සේවකයො සම්බන්ධ වැඩ ටිකක් කරදරයි"

"මං ඔයාගෙන් අහන්නැතුව මුකුත් කරන්නෑ"

"හොඳයි, එහෙනං යන්න. හැබැයි පරිස්සමින්".

"කුඩම්මා ශාන්තුවරයෙක් හැටියට ප්‍රසිද්ධ වෙයි, පතල් කාරයන්ට තෑගි දෙන්න යන කොට"

"ඇති අය නැති අයට උදව් කරන එක අමුතු දෙයක් නෙවෙයිනෙ"

"ඒකෙන් සමාජෙ තියෙන දාමරික වැඩ අඩු කර ගන්නත් පුළුවන්" එඩ්වඩ් ද එකඟ විය.

"එහෙනම් ඒක හොඳයි" ඇඩිලේ කීවා ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 41

"මට නම් ඕනෙ දුප්පත් මිනිස්සුන්ට මොකක් හරි සහනයක් කරන්නයි. ඒක නෙවෙයි ඊයෙ පාටිය කොහොද?"

සාදයේ අකුරක් නෑර ඇඩිලේ විස්තර කළේ මහත් ආශාවෙනි. ඈ මහත් ආඩම්බරයෙන්, පියානාව වාදනය කළ හැටි කීවා ය.

"මම හොඳට පියානෝ ගැහුවා නේද පපා?" ඇඩිලේ අසුවේ ප්‍රංශ බසිනි.

"ඔව් ඔව්. නෝර්ටන් ආර්යාව මෙයාට කතා කළේ සුරංගනාවි කියලා. දැන් කරුණාකරලා දෙන්න ම වෙන කොහාට හරි ගිහින් ඔය කතාව කර ගන්නවද? මට ගොඩක් වැඩ තියෙනවා"

"මට උදව් වෙන්න බැරිද?"

"බෑ ජේන්. මේවා ඔයාට තියා මටත් බර වැඩියි, හ්ම්... යන්න යන්න.. දෙන්නම යන්න. මට වැඩ තියෙනවා".

ඇඩිලේත් මමත් සාලයට ගියෙමු. අප දෙදෙනා එකට ජීවත්ව තිබුණේ ඉතා සුළු කාලයක් පමනි. එහෙයින් අපි එකිනෙකාට ආගන්තුක වීමු. දැන් ඇඩිලේ විවාහ වන තෙක් ම අප දෙදෙනා එකට ජීවත් විය යුතුයි. අප දෙදෙනා අතර සම්බන්ධය කෙබඳු වේදැයි මට අවිනිශ්චිත ය.

මම මැහුමක් අතට ගනිමින් කතා කළෙමි.

"දැන් ඉතිං අද දවසෙ කරන දෙවල් හිතන්න ඕනැ. ඔයා මොනවද කරන්න හිතං ඉන්නෙ?"

"මෙහෙ කරන්න කිසි දෙයක් නෑ. කාලගුණෙත් හරි සවුත්තුයි".

"කොහොමත් ඉතිං මාස කීපයක් මේ විදියට තියෙයි".

"ඔයාට වගේ මට නම් මේ ජීවිතේ හරි යන්නෑ. ඔයා පපා කියන්නෑනේ ලන්ඩන් එක්ක යන්න කියලා. ඒකටත් ඉතිං ඔයා සනීප නෑනෙ".

ඇගේ ස්වරය කියා පෑවේ මගේ අසනීපය ඇගේ ලන්ඩන ගමනට බාධාවක් වී ඇති බවයි.



"නෝර්ටන් ආර්යාව නම් ලබන සතියෙ ලන්ඩන් යනවා. මං හිතුවා එයා මට කැමති නිසා මටත් කතා කරයිද කියලා. එයලට ළමයිත් නැනෙ. ඒත් එයා එහෙම දෙයක් කිව්වෙ නෑ. මං පපාට කිව්වා එයාගෙන් අහන්න කියලා. පපා කැමති වුණේ නෑ. ඔයා හිතන්නෙ ඒ මොකද?"

"මං හරියට දන්නෑ. එයා අනුන්ගෙන් උදව් ඉල්ලන්න කැමති නෑ"

"ඔයාට බැරිද නෝර්ටන් ආර්යාවගෙන් අහන්න. කොහොමත් ඔයා කැමති නැනෙ මං මෙහෙ ඉන්නවට"

"ඇයි එහෙම කියන්නෙ. මං කැමතියි ඔයා ඉන්නවට. මට තියෙන එක ම ප්‍රශ්නෙ ඔයාට මෙහෙ කරන්න දෙයක් නැති එකයි"

"මට පුළුවන්ද පතල් කාරයන්ගෙ මුඩුක්කු අස්සෙ රිංගන්න? නෑ ජේන්. ඔයා කැමති නෑ මං මෙහෙ ඉන්නවට. ඔයාට මාව තියගන්න ඕන වුණා නම් ඇයි මාව ඇත ඉස්කෝලෙක නැවැත්තුවෙ?

"අපි ඉස්කෝල තේරුවෙ හොඳ සැලකිල්ලෙන්. මං බය වුණා මට පොඩි කාලෙ වෙච්ච කරදර ඔයාටත් වෙයි කියලා. ඉස්කෝලෙදි ඔයාට කරදරයක් වුණේ නැනෙ?"

"ඉස්කෝලෙ ඇති වරදක් නෑ. ඇයි මාව ගෙදරින් ඈත් කළේ?"

"ඔයාගෙ තාත්තා..."

"මගෙ තාත්තා? නෑ ඔයා! ඔයයි තීරණය කළේ. ඔයාට මගෙ පපාව තනියම අයිතිකර ගන්න ඕන වුණා. ඒකයි".

"ඇඩිලේ. පපා මුලදි හොඳට ම අසනීපෙන් හිටියෙ. එයා හිටියෙ ජීවිතයත් මරණයත් අතර. එයාට සම්පූර්ණයෙන් ම මගේ අවධානය අවශ්‍ය වුණා. මම නෙවෙයි එයයි තීරණය කළේ ඔයාව යවන්න. ඒ වෙලාවෙ මං ඒකට විරුද්ධ වුණේ නෑ. ඒ වෙලාවෙ මං එයාව බලා නොගත්තා නම් අද ඔයාට තාත්තා කෙනෙක් නෑ".



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 42

"හොඳයි ඊට පස්සෙ මාව ගෙදර ගේන්න තිබුණානෙ. ඒත් එතකොට ඔයාට ඔයාගෙ ළමයා හිටියා. මට ඉඩක් තිබුණෙ නෑ"

මේ වාදය දිගට ම ගෙන යාම එතරම් නුවණට හුරු නැත. නිවසින් වෙන්ව ගෙවූ වසර ගණනක ජීවිතයට ඇයට තිත්ත වී ඇති සැටියකි.

ඇඩිලේට කීමට බැරි එක් තිත්ත ඇත්තක් ඇත. එඩ්වඩ් ඇය නිවසින් පිට කිරීමට සැරසෙද්දී මා ඊට එකඟ වූයේ තවත් හේතුවක් නිසා ය. ඇඩිලේ ගේ අනාගතය ස්ථාවර නැත. එඩ්වඩ් ඇය තම දියණිය වශයෙන් තව ම ප්‍රසිද්ධියේ පිළිගෙන නැත. ඒ නිසා අනාගතයට මුහුණ දීම සඳහා ඇය අධ්‍යාපනය තුළින් ශක්තිමත් විය යුතුය. ඇයට මේ කටුක ඇත්ත වැටහෙනවාද නැද්ද මට නොතේරෙයි. කෙසේ වුවත් මා කෙලෙස මෙය ඇයට කියන්නද?

"ඔයාට මාව ඕන වුණේ නෑ. මට මෙහෙ ඉඩක් තිබුණෙ නෑ"

ඇගේ වේදනාව මට දැණිනි. ඒ හැඟීම මා කුඩා කළ ද හොඳ හැටි අත් වින්දෙමි.

"මට කණගාටුයි ඔයා එහෙම හිතන එක ගැන"

"ඔව්, ඔයා දුක් වෙන්නම ඕනෑ"

ඇය එසේ කියද්දී ම එඩ්වඩ් සාලයට පිවිසියේ ය. ක්ෂණයකින් සිය කෝපයෙන් දවෙන මුහුණ වෙනස් කළ ඇඩිලේ සුන්දර සිනාවකින් මුව පුරවා ගැනීමට සමත් විය. ඇය කෙතරම් හොඳින් රඟපාන්නේ ද යන්න මම අවබෝධ කර ගතිමි. කෙසේ වුවත් අපේ වාදය එඩ්වඩ්ට නෑසීම සතුටකි. තමන්ගේ වහල යට ගැහැණුන් දෙදෙනෙකු කෙහෙවලු පටලවා ගැනීම ඕනෑ ම මිනිසකුට හිස රදයකි.

"ජේන් මගෙ වැඩ ටිකක් ඉවරයි. අපි ඇවිදින්න යමුද?" මා නැගී සිටිත් ම ඇඩිලේ ද මා අනුකරණය කළා ය.

"මිසිස් පූල්. අපේ කෝට් ගේන්න. අපි ඇවිදින්න යනවා" ඇය කෑගැසුවා ය.



එඩ්වඩ්ට අවශ්‍ය වූයේ මා සමග තනි වීමට බව මට වැටහිණි. එහෙත් දැන් ඇඩිලේ ද රැගෙන යනු මිස වෙන කළ හැකි දෙයක් නොවී ය. අප ගෙළයනේ ඇවිදිද්දී ඈට අවශ්‍ය වූයේ ඈතට ඇවිද යාමටයි. එහෙත් මට එතරම් දුර යාමට සනීපයක් නැත. එඩ්වඩ් ඇගේ කීමට එකඟ වූවා නම් මට සිදු වන්නේ ආපසු හැරී ඒමටයි. ඇඩිලේගේ අභිප්‍රාය වූයේ ද එයයි. වාසනාවට එඩ්වඩ් එය ප්‍රතික්ෂේප කළේ ය.

"ඔයාට ඕනෙ නම් යන්න. ඒත් ජේන්ට එච්චර දුර යන්නබෑ".

එහෙත් ඇඩිලේ අප තනි කිරීමට කැමති නැත. එහෙයින් තිදෙනා ම ආපසු හැරී ආවෙමු.

"ඇඩිලේ ඔයාට මෙහෙ කම්මැලිනම් අපි සංගීත ගුරුවරයෙක් ගෙන්නලා දෙන්නම්" කෑම මේසයේ දී මම ඇසුවෙමි.

"අයියෝ මට ඉගෙන ගෙන ඇති වෙලා"

"මං හිතන්නෙ දැන් ඇඩිලේ ගෙදර දොර වැඩ ටිකක් ඉගෙන ගන්න එක හොඳයි. ඔයාට පුළුවන්නෙ උගන්නන්න" එඩ්වඩ් කීය.

"ඒක නම් හොඳයි. එහෙනම් අපි අද හවස කාගෙ හරි ගෙදරකට යමු"

ඈ අදහස් කළේ රේබෙක් මන්දිරය වන්නට ඇත.

"කොහෙ යන්නද? මට නම් පේන්න බෑ ගෑණු හැමතිස්සෙම අනුන්ගෙ ගෙවල් වලට කඩා වැදිල ඔප දූප කියව කියව කාලෙ නාස්ති කරන එක. ගෙදරට වෙලා වැඩක් බලා ගන්න" මා කිසිවක් කීමට පෙර එඩ්වඩ් අණ කළේ ය.

"කතා කරන එක ඕපදූප කියවිල්ලක් නෙවෙයි පවා"

එහෙත් එඩ්වඩ් ගේ තීරණය දැඩි විය. තවත් වැඩ ඇතැයි පවසා ඔහු මේසයෙන් නැගිට ගියේ ය.

"මං දැන් සජන් නෝනගෙ ගෙදර යනවා. එයාගෙ හොඳ කිරි පට්ටියකුත් තියෙනවා. ඔයත් එනවද ඇඩිලේ?"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 43

"එළදෙන්නුයි, කිරියි? අනේ මට බෑ. ඔන්න ආයි වහිනවා. ඒක නෙවෙයි පපා කවදාවත් ඔයාට ළඟ පාත ගෙවල් වලට යන්න දෙන්නැද්ද?"

"ඔහොම ප්‍රශ්නයක් කවදාවත් මතු වුණේ නෑ. මුලදි එඩ්වඩ්ව බලා ගත්ත හින්දා මට ඕවට වෙලාවක් තිබුණෙ නෑ. පස්සෙ මට අසාවක් නැතුව ගියා"

"ඔයාට ඒවා පුරුදු නැතුව ඇති". ඈ කීවේ සමච්චලයට ය.

"මං යනවා යන්න. ඔයාට එන්න බැරිනම් මම බල කරන්නෑ"

"ඔයාට එහෙම කරන්නත් බෑ. මං දැන් ඔයාගෙ ගෝලයා නෙවෙයිනෙ"

මා පිටව ගියේ සතුටින් නොවේ.

සජන් නෝනා ගේ ගෙදර දී මම ඇගේ කිරි පට්ටියෙන් කිරි නිෂ්පාදන ඇණවුම් කළෙමි. අපි තේ බොමින් පතල් කරුවන් ගේ සුබ සාධනය ගැන කතා කළෙමු. පතල් කරුවන්ගේ භාර්යාවන් මැහුම් ගෙතුම් පවා නොදන්නා බව ඈ මට කීවා ය.

'ඒක නෙමෙයි රොචෙස්ටර්ලා ගැන ගමේ එච්චර හොඳ ආකල්පයක් නෑ නේද?"

සෘජු කාන්තාවක් වූ ඈ මගේ ප්‍රශ්නයෙන් අමාරුවේ වැටුණු බව පෙණිනි.

"ඒ ඉතිං ගම්මුන්ගෙ හැටි. මට විශ්වාසයි ඔයාටයි මහත්තයටයි පුළුවන් ඒක හදා ගන්න"

ගෙදර පැමිණ විවේක ගන්නා අතරේ මා සිතුවේ කෙසේ හෝ ගමේ පාසලක් ඇරඹිය යුතු බවයි. එවිට දිළිඳු දරුවන් යමක් කමක් ඉගෙන යනු ඇත.

එඩ්වඩ්ට රෑ කෑමට කතා කිරීමට මා යන විටත් ඇඩ්ලේ ජනේලය අසළ කච්චියේ ඇළවී සිටියා ය. එඩ්වඩ් කිසිවක්



නොකන බව කී නිසා අපි දෙදෙනා තනිව කෑම ගත්තෙමු. කෑම මේසයේ දී අප දෙදෙනා අතර කතාවක් වූයේ නැති තරම් ය. ඇඩ්ලේ වරින් වර කල්පනාකාරීව මා දෙස බැලුවත් කිසිවක් නොකීවා ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 44

# 20

ශීත සෘතුව වර්ධනය වෙගෙන ආවේ ය. ෆර්න්ඩීන් වලදී නම් ශීත කාලයේ පවා කිරීමට වැඩ තිබුණි. එහෙත් මෙහිදී තත්වය හාත්පසින් ම වෙනස් ය.

එක් රාත්‍රියක මා නින්දට පෙර එඩ්වඩ් ගේ කාමරයට ගියේ මඳක් සල්ලාපයේ යෙදී අපේ සමීප බව වැඩි කර ගන්නා අටියෙනි. උදුන අසළ හිඳගත් අපි කතාවට වැටුණෙමු.

"අපට ඉස්සර වගේ කතා කර කර ඉන්න තියෙනවනම් කොච්චර හොඳද. මට මෙහෙ හරි කම්මැළියි" එඩ්වඩ් ඇඹුමක් ඇරියේ ය.

"මට ඇත්ත කියන්න ජේන්. ඔයා මෙහෙ ආපු එක ගැන දුක් වෙනවාද?"

"ඔව්, සමහර වෙලාවට මට ෆර්න්ඩීන් මතක් වෙලා දුක හිතෙනවා"

"අපි එහෙදි කොච්චර ළඟින් හිටියද. දන් ප්‍රශ්න පිට ප්‍රශ්න නිසා මට නම් පිස්සු වගේ. මං දන්නවා ජේන් සමහර වෙලාවට මං හැසිරෙන විදිය එච්චර හොඳ නෑ කියලා"

"අනේ එඩ්වඩ්, මං ඔයාට උදව් කරන්නම්"

"පුළුවන් නම් කොච්චර හොඳද ජේන්. මට වෙලාවකට හිතෙනවා කොහේ හරි ඈතකට යන්න"

"ඉතින් අපි යමු. අඩුගානෙ ටික දවසකටවත්"



"ඒක කොහොමද කරන්නෙ? ඔයාට ඔය තත්වෙන් කොහෙවත් යන්න බැනෙ. අනික ජොනතන්ව දාලා යන්නත් බැනෙ"

"අපට ජොනතන්වත් ගෙනියන්න පුළුවන්නෙ. මං නිසා දන් යන්න බැරිනම් අපි තව ටික කාලෙකින් යමු".

"හරි හරි ඒක පස්සෙ බලමුකො. දන් දන්නවද අලුත් ම ආරංචිය? මං ඔයාට ලස්සන පොඩි වෙළඹක් ගත්තා. නම රූබි. සජන් හෙට ගෙනෙයි"

මම ඔහු සිප ගතිමි.

"අනේ එඩ්වඩ් ඔයා හොඳ වැඩියි"

"පිස්සු. ඔයාට ව්‍යායාමෙකුත් එපැයි. හැබැයි ඔන්න දුර යන්න බෑ. අනික කාලගුණය හොඳ වෙලාවට විතරයි යන්නෙ, හරිද? දන් ඉතිං මගෙ හිත හැදෙන්න මොනව හරි කියන්න"

මම බොහෝ දෑ කතා කළෙමි. එහෙත් සමහර මාතෘකා මග හැරීමට එඩ්වඩ්ට අවශ්‍ය බව දුටු මා කතා කළ් වචන තෝරා බේරාගෙනයි. කෙසේ වුවත් අප දෙදෙනා අරත නැවත සමීප බවක් ඇති වීම ගැන මගේ පැත්තෙන් මට සතුටක් දැණිනි.

"වැඩ වැඩි හින්ද ඔයාට මහන්සියි. කාලයත් එක්ක ඔක්කොම හරි යයි.

"ඔව් කාලයත් එක්ක ඔක්කොම හරි යයි"

ඔහු දුර්වල ලෙස මිමිණුවේ ය. මා පිටව යාමට පෙර ඔහු සිප ගත්තත් ඔහු එයට වත් ප්‍රතිචාරයක් නොදක්වී ය. ඔහු ශෝකයෙනි. මා තුළත් ශෝකයක් හට ගති.

ඊළඟ උදයේ මට එඩ්වඩ්ගේ අලුත් ම තෑග්ග ලැබුණි. දුඹුරු පැහැ තරබාරු වෙළඹක වූ රූබි දුටු සැණින් මම ඌට ආදරය කළෙමි. තෑග්ග ලැබීමේ ප්‍රීතිය සැමරීම සඳහා අප දෙදෙනා එවේලෙ ම සංචාරයකට පිටත් වීමු. එඩ්වඩ් ඔහු ගේ උස් අසු මෙහෙයවී ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 45

"එඩ්වඩ්, මං ඔයාට කොහොම ස්තුති කරන්නද? ඔයා මට මගෙ නිදහස දුන්නා"

"ඒකෙන් කමක් නෑ ජේන්. ඔයා පරිස්සම් වෙන්න ඕනැ"

ගොවිපොළකින් දිවා ආහාරය ගත් අපි සවස් වන විට රේබෙක් මන්දිරය ආසන්නයට ම පැමිණ සිටියෙමු.

"අපි නෝර්ටන්ගෙ ගෙදරටත් ගිහිල්ලම යමු ද?" එඩ්වඩ් යෝජනා කළේ ය. මා එවන් ගමනකට සූදානම්ව නොසිටියත් ඔහුගේ ඇවටිල්ල නිසා එකඟ වීමි.

විශාල වලව්වක් වූ රේබෙක් මන්දිරය ඉතා පැරණි ය.

නිවස මහේශාක්‍ය ලීලාවක් ඉසිලී ය. එහි ඓශ්වර්ය බලමින් ඉදිරියට ගිය අපි එක් වරම ගල් ගැසී සිටියෙමු. ඒ, නිවසේ අසිරිය දකීමෙන් නොව, නිවස ඉදිරියේ අපේ අස් රිය නවතා තිබෙනු දකීමෙනි.

"අපේ කරත්තෙ මෙහෙ මොකද කරන්නෙ?"යි කෑ ගසමින් එඩ්වඩ් වහා එදෙසට අසු පැන්නී ය. මා එතනට යන විට ඔහු කෝපයෙන් ජෙරමිගෙන් ප්‍රශ්න කරයි.

"මොකද මෙතන? කොච්චර වෙලාවක් අශ්වයො හිටගෙනද?"

"ඇඩ්ලේ නෝනා මෙහෙ ආවා මහත්තයා. දැන් පැය දෙකක් විතර ඇති"

"උඹට පිස්සුද?"

"එඩ්වඩ් මේක ජෙරමිගෙ වැරැද්දක් නෙවෙයිනෙ"

"ඇයි නැත්තෙ. එයට කව්ද කිව්වෙ කරත්තෙ එළියට ගේන්න?"

මේ මොහොතේ බ්ලාන්ච් නෝර්ටන් අප පිළිගැනීමට ආවාය. "කොච්චර දෙයක් ද ඔය දෙන්නා ආපු එක. මං මුළු හවස් වරුව ම ඇඩ්ලේ එක්ක හිටියෙ. එයා කිව්වෙවත් නැනෙ ඔයාලා එන බවක්"

ඇඩ්ලේ පිටුපසින් ආවා ය. අලුත් ඇඳුමට ඈ ඉතා සුන්දර වුවත් බියපත්ව සිටිබව පෙණින.



"අපි ආවෙ ඇඩ්ලෙව එක්ක යන්න"

එඩ්වඩ් කෝපය පාලනය කර ගත්තේ ය. ගෙතුළට එන ලෙස බ්ලාන්ච් කළ ආරාධනය කරුණාවෙන් ප්‍රත්කෙෂ්ප කළ ඔහු ඇඩ්ලේට රියට නගින ලෙස අණ කළේ ය. අනතුරුව අසුන් දෙදෙනා පිටුපසින් සවි කොට එඩ්වඩ් මා ද රියට නැංවීය. කෝපයත් ලැජ්ජාවත් නිසා ඇඩ්ලේ කඳුළු සළමින් සිටියා ය.

"මොන ලැජ්ජාවක්ද? මට එක පාරට ම කරත්තෙට නගින්න කිව්වහම" ඇය මට පමණක් ඇසෙන සේ මිමිණුවා ය.

"විකාර නොකර ඉන්න ඇඩ්ලේ"

එකෙනෙහි ම තිළියක සේ දක්ෂ ලෙස ලස්සන සිනාවක් මුවට නංවා ගත් ඇඩ්ලේ "හොඳයි මං විකාර නොකර ඉන්නම්"යි රහසින් මිමිණුවේ අධික කෝපයෙන් පුපුරමිනි. අනතුරුව ඇය ඉතා මිහිරි ලෙස බ්ලාන්ච් ගේ ලන්ඩන් ගමනට සුබ පැතුවා ය.

"ඊළඟ පාර ඔයත් අපිත් එක්ක එන්න ඇඩ්ලේ"

අසුනට බර දුන් ඇඩ්ලේ ඔවුන් හා සිනාසෙන ගමන් ම මට ළංවී රුදුරු ලෙස ගිගිරුවා ය.

"ඊළඟ පාර, ඊළඟ පාර. ඇයි මේ පාර බැරි? ඔයාගෙ වරද ජේන්!"

"ඔයාට ඉතිං හැම දේම මගෙ වැරැද්ද"

එඩ්වඩ් නැඟුණු පසු රථය ඉදිරියට ඇදුණි.

"අනේ පපා. මං ඔයාගෙන් අහන්නැතුව කරත්තෙ නොගත්තයි තිබුණෙ. ඔය දෙන්නම ගියා ම මට පාළු හිතුණා. මේක වරදක් කියලා හිතුණෙ නෑ. අනේ මට සමාව දෙනවා නේද?" ඇය සුරතල් වූවා ය.

"හොඳයි, හොඳයි. මට වැඩිය ම තරහ ජෙරමි එක්ක. එයා දැන ගන්න එපැයි"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 46

අන්තිමේ වරදකරු ජෙරමි! මෙහි අසාධාරණය මට හොඳින් පෙණුනත් කට පියාගෙන සිටීම, වඩා සුබදායක ය. කෙසේ වුවත් සිද්ධියේ ප්‍රතිඵලයක් ලෙස ඊළඟ වසන්තයේ ඇඩ්ලේ ලන්ඩන් ගෙන යන බවට එඩ්වඩ් පොරොන්දු විය.

"අපි ප්‍රාර්ථනා කරමු ඔයාටත් අපි එක්ක යන්න සනීප වෙයි කියලා" ඇඩ්ලේ කීවේ පසුව අපි දෙදෙනා තනි වූ විටකයි. එහෙත් ඇගේ දවෙන දෑස දුටු මට පෙනුනේ ඇය අදහස් කළේ ඊට හාත්පසින් ම විරුද්ධ දෙයක් බවයි. මාස කිහිපයකින් දරු ප්‍රසූතියක් බලාපොරොත්තුවෙන් සිටින ඕනෑ ම කාන්තාවක් තම ජීවිතය ගැන බියෙන් පසු වෙයි. ඇඩ්ලේ අදහස් කළේ මා දරු ප්‍රසූතියේ දී මිය යන බව ද? මම වෙව්ලා ගියෙමි.

"ඇඩ්ලේ, ඔයා දැන ගන්න ඕනෑ ඔයාගෙ තාත්තා මගේ මහත්තයා කියලා. ඒ හින්දා එයා යන්නෙ කොහෙද, මමත් එතනට යනවා. උදන් මගෙ තත්වෙ හින්දා ලන්ඩන් යන්න බැරි එකට මටත් දුකයි. ඒත් එකක් මතක තියා ගන්න. පසුගිය අවුරුදු දහයෙ ම ඔය මොන ම සංචාරයක්වත් නැතුව අපි හරි ම සතුටින් හිටියා. ඔයා තරුණයි, ඇවිදින්න ආසයි. ඒත් හැම තිස්සෙ ම ඔයාට ඕන දේ ම ලබා ගන්න බෑ".

කෝපයෙන් නැඟී සිටි ඈ පිටව යන්න හැරුණා ය.

"ඉඳගෙන මේක අහගන්න. ඔයාට හැමදාම මේ වගේ නපුරුකම් කරන්න දෙන්න බෑ. එක්කො ඔයා වෙනස් වෙන්න ඕනෙ. නැත්නම් අපි ඔයාව මේ ගෙදරින් යවනවා. ඔයා ප්‍රශ්න ඇති කළොත් ඔයාට යන්න වෙයි".

මා කතා කරද්දී කෝපයෙන් දවෙමින් බිම බලාගෙන ඈ මට සවන් දුන්නා ය. සංචාරය නිසා වෙහෙස වී සිටි මට තවත් කතා කර ගත නොහැකි විය. මා නින්දට ගියේ උදේ වරුවේ අප දෙදෙනා ගත කළ ප්‍රීතිමත් පැය කිහිපය ගැන සිතමිනි. එහෙත් අන්තිමේ දී දවස නිමා වූයේ කෙතරම් කෲර ලෙස ද?





පසු දා උදෑසන අධික ලෙස සීතල විය. කොයි මොහොතේ හෝ හිම වැස්ස ඇරඹෙනු ඇත. පාන්දරින් අවදි වූ මම තනිව ආහාර ගෙන ඉස්තාලයට ගියෙමි. එඩ්වඩ් ගේ අශ්වයා එහි නොවී ය. එහෙත් රූබි සෑදලය ද පැළඳ පිටත සිටිනු දුටු මම මවිත වීමි. ජෙරමිගේ ගෝලයා අසුන්ට සාත්තු කරමින් සිටී. ජෙරමි ජේන ගේ නෙක් මානයක නැත.

"මහත්තයා උදෙන් ම කොහෙද ගියෙ?"

"උදෙන් ම මිල්කොට් ගියා. මම එනකොටත් ගිහින්"

මොන පුදුමයක් ද? එවැනි ගමනක් ගැන ඔහු ඊයේ නොකීවේ ය. කෙසේ වුවත් මිල්කොට් සැතපුම් හයකට වඩා දුර නොවූ නිසා ඔහු අද ම ඒවි.

"මහත්තයා කිව්වද රූබිගෙ සෑදලේ දාලා තියන්න කියලා?"

මං උදේ නැගිට්ටනකොටත් රූබි ඔහොමමයි හිටියෙ"

"එහෙනම් දැන් පැයකටවත් වඩා ඌ එළියෙ? හරි පුදුමයිනෙ. කෝ ජරමි?"

"දන්නෑ නෝනා. මෙලහට ෆර්න්ඩීන් යනව ඇති. එයා කිව්වා අම්මා තාත්තා ළඟට යනවා කියලා"

"ෆර්න්ඩීන් ගියා?"

එහෙමයි. එයා හරි දුකෙන් ගියේ. මහත්තයා එයාව අස් කළාම එයා හරියට කණගාටු වුණා".



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 47

"මොකක්? මහත්තයා ජෙරමිව අස් කළා?"

"එහෙමයි. ඊයෙ මහ රෑ මහත්තයා ඉස්තාලෙට ඇවිත් කිව්වා ජෙරමිට එවලෙ ම යන්න කියලා. මහත්තයා කිව්වා ජෙරමි ඇඩ්ලෙ නෝනව කරත්තෙ එක්ක ගිය නිසා තවත් එයාව විශ්වාස කරන්න බෑ කියලා. ජෙරමිට නිදහසට කාරණාවක්වත් කියන්න දුන්නෙ නෑ. එයාගෙ පඩිත් ගෙවලා එවලෙම යන්න කිව්වා".

"ඒත් ජෙරමි කිව්වා එයාගෙ පවුලෙ අය මහත්තයලට අවුරුදු දහයක් ම වැඩ කළා කියලා. එයා කළේ ඇඩ්ලෙ නෝනට කීකරු වෙච්ච එක විතරයි කිව්වා. ඒත් මහත්තයා එයාව එලව ගත්තා. ජෙරමි කිව්වා අම්මලා ගාවට යනවා කියලා. පව්, එයා කරදරයක් නැතුව ගියා ද දන්නෑ. සමහර විට එළි වෙනකම් කොහෙ හරි ඉඳලා යන්නැති".

එඩ්වඩ් මෙසේ කළේ ඇයි? බොහෝ කලක් අපට සේවය කළ ජෙරමි කෙතරම් පක්ෂපාතී ද? නිසැකයෙන් ම මෙය එඩ්වඩ් ක්ෂණික කෝපයෙන් කළ දෙයක් විය යුතු ය. ඔහු ගෙදර ආ විට ජෙරමි ආපසු ගැනීමට ඔහු පෙළඹවීමට මට හැකි වනු ඇත.

රූබිට සෑදලයත් දමා ඇති නිසා වහා ගොස් ජෙරමි අල්ලා ගත යුතු යැයි මම සිතුවෙමි. ජෙරමි එළි වන තෙක් කොහේ හෝ නැවතී සිටියානම් තවමත් මග යනු ඇත. ඔහුට මුදල් ටිකක් දී ආපසු වැඩට ගන්නා බව කියා ඔහු සැනසිය යුතු ය.

මම වහා වහා සූදානම් වී ෆර්න්ඩීන් බලා පිටත් වීමි. දැන් ආපසු හැරී බලන විට, එදා අසුපිට නැඟී ව්‍යායාම සඳහා කඳුකරය දෙසට නොගෙස්, ජෙරමි සොයා පාර දිගේ යාම කෙතරම් වාසනාවක්ද? එසේ නොවුණා නම් එදා මගේ ජීවිතය නැති වීමට ඉඩ තිබුණි.

මට සැතපුමකට වඩා යා නොහැකි විය. හදිසියේ රූබි දඟලීමට පටන් ගත්තා ය. සෑදලයේ පටි බුරුල් වී ඇත. කවදත් අශ්වයන් සම්බන්ධයෙන් ප්‍රවීණයකු නොවූ මට කෙසේවත් අසුපිට රැඳී සිටින්නට නොහැකි විය. එක් වර ම පාර අයිනේ වූ තණ බිස්සක් දුටු මම, වෙන කළ හැකි කිසිවක් නොවූ නිසා එදෙසට පැන්නෙමි.



වැටීම නිසා මගේ හුස්ම නැවතුණාක් සේ විය. සිහි මූර්ඡා නොවූ බැවින් මට රූබිගේ කුර ගැටෙන හඬ ඇසිණ. මා තුවාල වී ඇත්දැයි හරියට ම නොදැණුනත් වැටීම නිසා දරුවාට හානි වුණා වත්ද?

එක් වර ම අඩි ශබ්දයක් ඇසිණි. "එයා මෙහෙ ඉන්නවා"යි කවුදෝ කෑ ගසන හඬ ඇසිණි. මිනිස්සු දෙදෙනෙක් පැමිණ මා ඔසවා ගත්හ. ඔවුහු මා කරත්තයක දමා ගෙන තෝන්ෆීල්ඩ් වෙත ගෙන ආහ.

වාසනාවකට මෙන් මා වැටෙනු ඔවුන් දක ඇත. අප නිවසට එන විට හිම වැස්ස ඇරඹී තිබුණි. ජනශූන්‍ය ස්ථානයක දී මේ විපත සිදු වූවා නම් මට කුමක් වේවිද?

ග්‍රේස් පූල් නිහඬව ම මා ඇඳට දම්මා ය. අඩ සිහියෙන් පවා නිවස තුළ වූ මුසල නිහඬතාව මට දැණිනි. ඊළඟට මට දැණුනේ වෛද්‍යවරයා මා පරීක්ෂා කරන අයුරුයි. ජනේලය තුළින් තදින් හිම වැටෙනු පෙණිනි. එනිසා එය දවසේ කුමන වෙලාවදැයි මටකිව නොහැකි ය.

මා තුවාල නොලැබීම ගැන වෛද්‍යවරයා සතුට පළ කළේ ය. එහෙත් දින කීපයක් යන තෙක් දරුවා ගැන කිව නොහැකි බව ඔහු මට කීය. මට නිදි බෙහෙතක් දුන් ඔහු හිම වැස්සට කොටු වෙතැයි බියෙන් ඉක්මනින් පිටව ගියේ ය.

මුළුනිවස ම නිහැඬියාවේ ගිලී ඇත. මා දිගු නින්දකින් අවදි වී බලන විට ලාම්පුවත් උදුනත් නිවී කාමරය අඳුරේ ගිලී තිබිණි. පිටත අඳුරු ය. ජනෙල් පඩිය මත හිම තට්ටුවක් බැඳී ඇති අයුරු පෙනේ. බියකරු නිහැඬියාවකි. සතකුගේ කෑ ගැසීමක් වත් නැත. ඉඳහිට වත් ඇසුණේ උදුණේ ගිනි අඟුරු පුපුරු ගසන හඬ පමණි. කාමරය පුරා සීතල අරක් ගෙන ඇත.

මට උදව්වට කිසිවකු එවන බවට වෛද්‍යවරයා පොරොන්දු වූවත් මෙතෙක් කිසිවෙක් නාවේ ය. නිවසේ සිටින්නේ මා පමණක් සේ ය. නිසැකව ම මේ වන විට එඩ්වඩ් මිල්කොට් සිට පැමිණ ඇති.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 48

නිහැඩියාව කපා ගෙන පහළින් කට හඬවල් ඇසෙයි. දන් රෑ වී ඇත. මට බියක් දැණුනි. ඇඳෙන් නැගිටීම තහනම් වුවත් මා කෙලෙස නම් මෙසේ තනි වී ඉන්නද?

මම නැගිට්ටෙමි. වැටීම නිසා ඇතිවූ වේදනාවෙන් මුළු ගතම හිරි වැටී ගියේ ය. නිරුවත් දෙපා වලින් යුතුව ම කාමරයෙන් පිට වූ මම කොරිඩෝව වෙත ගියෙමි. පඩිපෙළ අසළට යත් ම ග්‍රේස් පූල් ගේ කටහඬ ඇසිණි.

"නෝනට කියන්න එපා. මං එයාව ආපහු එළවලා දම්මා"

අනතුරුව මා භීතියට පත් කරමින් රෝලන්ඩ් නෝනාගේ පහත් ස්වරය ඇසුණි.

"ඒත් අරක ගැන මොකද කරන්නෙ?"

"එයා නම් හරි මෝඩියක්" ග්‍රේස් පූල් කීවා ය.

"ඔතන මොකද වෙන්නෙ?" මම කෑ ගැසීමි.

"දෙයියනේ ජේන් අයර්, ඒ ඔබද?" අසමින් ලාම්පුවක් අත දරා ගෙන ග්‍රේස් පූල් පඩිපෙළ පාමුලට ආවේ රෝලන්ඩ් ද සමගිනි. මම පහළට බසින්නට වීමි.

"පහළට එන්න එපා"

"නෑ මම එනවා".

වේදනාවෙන් වෙව්ලමින් ගරාදි වැටේ එල්ලී මම පහළට බසින්නට වීමි. ග්‍රේස් පූල් පැමිණ මට උදව් වුවත් ඇගේ ස්පර්ශය නිසා මා දුර්වලව ඇද වැටෙන්නට ගියෙමි.

"මාව අල්ලන්න එපා!"

"නෝනට නැගිටින්න හොඳ නෑ"

"නෑ මට නැගිටින්න ම වෙනවා. ඔයා හැදුවෙ හැමෝට ම හොරෙන් රෝලන්ඩ් නෝනව ගේ ඇතුළට ගන්නනෙ. කෝ මගෙ මහත්තයා?"



මිනිත්තු දෙකක නිහැඩියාවකට පසු ග්‍රේස් පූල් කටහඬ අවදි කළා ය.

"මහත්තයා මිල්කොට් ඉඳලා ඇවිල්ලා ආපහු ගියා"

මට මහත් අසරණ බවක් දැණුනි. සතුරන් දෙදෙනෙකු සමග මා නිවසේ තනි වී ඇත. ඇඩිලේ ඉහළ මාලයේ නිදා සිටිනවා ඇති. එහෙත් අවශ්‍යතාවක් ඇති වුවහොත් මට උදව් කිරීමට ඇයට පුළුවන්ද?

"මහත්තයා කොහෙද ගියේ?"

"ප්‍රශ්න අහන්න එපා. නෝනට සනීප නෑ. ඇඳට යන්න"

"මිසිස් පූල්, මගෙ මහත්තය කෝ? කියන්න එයාට කරදරයක් නෑ නේද? එයා කොහෙද?"

කෙටි නිශ්ශබ්දතාවකින් පසු රෝලන්ඩ් නෝනාගේ සන්සුන් කටහඬ අවදි විය.

"වෙන කරන්න දෙයක් නෑ. එයාට කියන්න"

"නෝනා ඔයාට සීතලයි. කාමරේට යන්න"

"මට අණ දෙන්න එන්න එපා. දන් කියනවා. කෝ මහත්තයා?"

"නෝනා ගෙදර ගෙනාවට පස්සෙ ඇඩිලෙ නෝනා ගෙදරින් පැනල ගිහින්. නෝනගෙ අනතුර හින්දා හවස මහත්තයා එනකම් ම ඇඩිලෙ නෝනා නැති බව අපට කල්පනා වුණෙත් නෑ. පස්සෙ මහත්තයා ගියා එයාව ආපහු ගේන්න"

"මේ හිම වැස්සෙ? කිසිම විවේකයක් නොගෙන? දන්නවද ඇඩිලෙ කොහෙද ගියේ කියලා?"

නැවතත් නිශ්ශබ්දතාව

"දන් වෙලාව කීයද?"

"දන් රෑ දොළහට විතර ඇති"

"මේ වෙලාවෙ ඔයා මොකද මෙහෙ?" මම එවර ඇසුවේ රෝලන්ඩ් නෝනාගෙනි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 49

"උදව් කරන්න"

"උදව්? මේ වෙලාවෙ මොන උදව්ද? මගෙ මහත්තයා නැති බව දනගෙන හොරෙන් ගෙට රිංගගෙන මෙයා එක්ක එකතු වෙලා මහත්තයට විරුද්ධව කුමන්ත්‍රණ කරනව නේද? ඒකද ඔය කියන මහ ලොකු උදව්ව? දෙන්න ම දන් ම බහිනවා එළියට"

"නෑ රොචෙස්ටර් නෝනා, දන් ඇඳට යන්න ඕනෑ"

"යනව යන්න. දන් ම යනවා. ඔය දෙන්නා ඉන්නෙ කොතනද, එතන ප්‍රශ්න. මට බෑ තවත් ඔය දෙන්නා මේ වහල යට තියා ගන්න. දන් ඇඩ්ලෙත් ගිහින්. එඩ්වඩුත් ගිහින්. ඔය දෙන්නා තමයි ඒකටත් හේතුව. යනව යන්න".

"මේ හිම වැස්සෙ?"

"ඉතිං මට මොකද?" හිමේ බැරි නම් ඕන එකක්"

රෝලන්ඩ් නෝනා මා දෙස බැලී ය.

"රොචෙස්ටර් නෝනා, ඔයාට සනීප නෑ"

"ඔයා නම් හරි මෝඩියක්" ග්‍රේස් පූල් මට කීවා ය.

"දන් මං කිව්වා යන්න කියලා"

"ටිකක් ඉවසන්න. ඔයා ඔයාට ම අනතුරක් කර ගන්නෙ"

"ඔහෙලා එළියට බහිනවද? නැත්නම් මං වැඩකාරයන්ට කියල එළියට දම්මන්නද?"

"වැඩකාරයො කව්රුත් නෑ"

"මොකක්? මගෙ මහත්තයා...."

"කට වහගන්න. මම ඔයාට හොඳින් කිව්වා. දන් මේකත් අහගන්න. ඔයාගෙ වැඩකාරයො ඔක්කොම ගිහිල්ලා. ඔයාගෙ මහත්තයත් ගිහිල්ලා. ඔයා ලොකු කරදරේක වැටිලා ඉන්නෙ. දන් වද නොදී ඇඳට යන්න"



මට පරාජිත බවක් දැණුනි. උදව් ඉල්ලීමට කිසිවෙක් නැත. මගේ දිව පැටලෙයි.

"එඩ්වඩ් බලා ගනී ඔහෙලව. නපුරු ගෑණු!"

"ඔයා දන්නෑ එයා කොහෙ ගිහින්ද කියලවත්. දන් ඔයාට නොකිය බෑ. එයා ඇඩ්ලෙව හොයා ගෙන ලන්ඩන් ගියා"

"ඇඩ්ලෙ ලන්ඩන් ගිහින් ද?"

"මිසිස් පූල් හැදුවෙ ඔයාට නොකියා ඉන්න. ඒකයි මාත් මේ ඔක්කොම අපහාස විඳගෙන හිටියෙ. ඇඩ්ලෙ ලියුමක් ලියලා තියලා ගිහින්. එයා ලන්ඩන් වල එයාගෙ අම්මා ළඟට යනවා කියලා. රොචෙස්ටරුත් ඇඩ්ලෙ පස්සෙ ගියා"

"අම්මා? සෙලින් වැරන්ස්? එයා මැරිලනෙ"

"නෑ සෙලින් මැරිල නෑ"

මම නොවැටී සිටීම සඳහා කණුවක් බදා ගතිමි.

"ෆර්න්ඩීන් වල ඔයා හිටියෙ ඔයාගෙ ම පුංචි ලෝකෙනෙ. ඉතිං කොහොමද මේවා දන ගන්නෙ? සෙලින් තමයි ප්‍රංශයේ දන් ඉන්න ප්‍රසිද්ධම නිළිය. මේ දවස්වල එයා ලන්ඩන් වල ඉන්නෙ"

"රොචෙස්ටර් නෝනා, මම සෙලින්ව අවුරුදු ගාණක ඉඳලා දන්නවා. ඔයා හිතන තරම් එයා නරක ගෑණියක් නෙවෙයි. එයා හරි නිර්භීතයි. රොචෙස්ටර් එයාව අතෑරියට පස්සෙ එයා ගොඩක් පහත් තත්වෙට වැටුණා. එයා ගායකයෙක් එකක් යාළු වෙලා හිටියා. ඒත් ඒ මිනිහ එයාව අතෑරියා. අන්තිමට එයා හොඳට ම අසරණ වුණා. රොචෙස්ටර් ඇඩ්ලෙව නොගත්තනම් ඒ ළමයා බඩගින්නෙ මැරෙන්න තිබුණා. සෙලින්ගේ ජීවිතේ බේරුණෙත් පල්ලියෙ කන්‍යා සොයුරියන් නිසා. ඒත් දන් නම් මුළු ලෝකෙම එයාගෙ කකුල් දෙක ළඟ".

"දන් ඇඩ්ලෙත් එයා ගාවට ගිහින්. ඔයාගෙ මහත්තයත් ගිහින්"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 50

ඇගේ කටහඬ විජයග්‍රාහී විය.

"ජේන් අයර්, ඔයා අහිංසක බව ඇත්ත. ඒත් ඒ අහිංසකකමේ වටිනාකම ගොඩක් ඉහළයි"

මම ග්‍රෙස් පූල් ගේ වචන ගැන තැකීමක් නොකළෙමි. මා සිටියේ ඉතා දුක්බිත අඩියක ය. සෙලින් ගේ රුව මසිත හොල්මන් කරයි. ඇය ජීවත් වන බව එඩ්වඩ් කොතෙක් කල් සිට දන්නේ ද? ඔවුන් ලන්ඩන් වලදී හමු වුණාද? මේ මහා හිම වරුසාවේ ඔහු ඈ වෙත යමින් සිටී.

"ඔයාට දන් කව්රුත් නෑ. ඒත් ඔයාගෙ ලොකුකම! මම තව මොහොතක්වත් මේ ගෙදර ඉන්නෙ නෑ. ජේන් අයර්, ඔයා කවදත් මට වෛර කළා. දන් මාත් ගියා ම ඔයාට පෙනෙයි ඔයාගෙ මෝඩකම කොච්චර ද කියලා. මම රෝලන්ඩ් නෝනා එක්ක යනවා. මෙහෙ ඉන්නවට වඩා මැරෙන එක හොඳයි"

ලාම්පුව අතින් ගත් දෙදෙනා මා තනි කර දොරටුව දෙසට ගියහ.

"වැඩකාරයො තීරණය කරලා තියනවා රොචෙස්ටර්ලට වැඩ කරනවට වඩා බඩගින්නෙ ඉන්න එක හොඳයි කියලා. හැමෝම හිතන්නෙ මහත්තයා කලින් නෝනව මැරුවා කියලා. එක සැරයක් මිනී මරපු කෙනාට ආයි මිනී මරන්න පුළුවන්. අන්න ඒක මතක තියා ගන්න"

ඔවුන් දොර අරින හඬ ඇසිණ. හිම වැස්ස තදින් ඇද හැළේ.

"අන්න ඒක මතක තියා ගන්න ජේන් අයර්!"

ඔවුන් යන්නට ගියහ. අතිනත් ගෙන එකිනෙකාට උදව් කරමින් හිම වැස්සට එරෙහිව ඇවිද යන කළු රූප දෙක දෙස මම ගල් ගැසී බලා සිටියෙමි.



# 22

සිත් පිත් නැති රූකඩයක් සේ ඇවිද ගිය මම ඉදිරි දොර වසා දැම්මෙමි. මගේ කබාය හමු වූ බැවින් වෙව්ලන සීතලෙන් මිදීමට එය පෙරවාගෙන සාලයේ පුටුවක් මතට වැටුණෙමි.

එදා රාත්‍රියේ බිහිසුණු බව අදටත් මගේ මතකයෙන් ඈත්ව නොයයි. මට කල්පනා වූයේ සෙලින් ගැන ම පමණි. ඇත්තට ම එඩ්වඩ් ගියේ ඇඩ්ලේ සොයාගෙනද? නැත්නම් ඇගේ මව සොයා ගෙනද? මා අවුල් ජාලයක පැටලී ඇත. ඔරලෝසුව ඉඳ හිට නාද වෙයි. එකයි...., දෙකයි...., තුනයි....

වෛද්‍යවරයාගේ නිදි බෙහෙත් නිසාදෝ කෙටි නින්දකට වැටුණු මම සිහිනයක් දුටුවෙමි. අපේ පළමු විවාහය අසාර්ථක වීමෙන් පසුව මා පළා ගිය අයුරු, මා විඳි වේදනාවන්, නැවත එඩ්වඩ් හමු වීම... මිහිරි සිහිනයක්!

මම තිගැස්සී පියවි ලොවට ආවෙමි. ග්‍රේස් පූල් මා මෝඩියකැයි කීවා ය. මා තව දුරටත් මෝඩ විය යුතු ද? මගේ ජීවිතයෙන් හරි අඩක් එඩ්වඩ් ය. ඔහු නැතිව මා කෙසේ ජීවත් වෙන්නද? මගේ ප්‍රීතිමත් යුග දිවිය රැක ගැනීම සඳහා වහාම යමක් කළ යුතු ය.

මම පහන් සහ උදුන් දල්වූයෙමි. මේ නිවසේ තව දුරටත් තනි වී සිටිය නොහැක. මම එඩ්වඩ් සොයා ලන්ඩන් යමි.

එහෙත් බාධක බොහෝ ය. කාලගුණය කෙසේත් ම යහපත් නැත. වැටීමෙන් ඇති වූ වේදනාව ද අඩු නැත. මට රියදුරෙක්ද නැත. මුළු ගම ම අපේ සතුරන්ව සිටිය දී කෙනෙක් සොයා ගැනීම



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 51

ද පහසු නොවේ. එහෙත් මා උත්සාහ කර බැලිය යුතු ය. මේ රළු ගමනේ දී දරුවාට හානි වීමට ඉඩ ඇත. එහෙත් මගේ ජීවිතයේ මීට වඩා දුෂ්කර අවස්ථාවන්ට මුහුණ දීමට සිදු විය. දන් නැවතත් මා හැම දෙයක් ම පරිත්‍යාග කළ යුතුව ඇත.

මා උඩු මහලට ගොස් ඇඳුම් අඳුරන විට එළිවීමට ආසන්න ය. ගමනේ උදව් නොලැබුණොත් ටොඩ් මහතාගෙන් කරත්තයක් හා රියදුරෙකු ඉල්ලා ගත හැක. කුස්සියට ගිය මම අප්පිරියාවෙන් කිරි ටිකක් බී ගතිමි. මේ ගමනට මා ශක්තිමත් විය යුතු ය. මෙතරම් සීතලේත් මට දැණුනේ රස්නයකි. මම බෑගය එක් අතකින් ගෙන නිවසින් පිටත්ව දේවගැති නිවස බලා යන්නට වීමි.

හිම වැස්සත් සීතලත් දරුණු ය. සාමාන්‍ය කාලගුණයේ දී ඉතා සුළු දුරක් වූ මේ සැතපුම් බාගය මට ගව් ගාණක් දුර විය. එහෙත් හැම ගින්දරක් ම දරා ගෙන මා කෙසේ අර පාළු නිවසේ තනි වී සිටින්නද?

සිය ගැහැණුකම නොසලකා ඕනෑ ම අභියෝගයකට මුහුණ දීමට අවස්ථාවක් සෑම ගැහැණියකට ම උදා වේ. දන් මගේ ජීවිතයේ ඒ මොහොත පැමිණ ඇති බව මට දැණුනි.

මා දන් ලන්ඩන් දක්වා හෝ ගොස් එඩ්වඩ් සොයා ගත යුතු ය. මා දවන සියලු ප්‍රශ්න වලට පිළිතුරු සොයා ගත යුතු ය. මේ මොහොත මගේ ජීවිතයේ සන්ධිස්ථානයකි.

මා ඉදිරියට යත් ම දඩි නිහඬතාව අතරින් අසෙකුගේ කුර ගැටෙන හඬ ඇසිණි. අපේ ඉස්තාලයේ අසුන්ට කෑම හෝ වතුරවත් නැති බව මට සිහි විය. එක් වර ම නිවස දෙසින් කට හඬක් ඇසිණ.

"ජේන්, හලෝ ජේන්!"

මම හැරී බැලීමි. පරණ පන්නයේ තොප්පියක් හා කබායකින් සැරසී අසකු පිට නැගී සිටි උස් රුවක් මා දෙසට අත වැනී ය. අසු පිටින් බැස ඔහු මා වෙත එත් ම ඒ මුහුණ මම හැඳින්නෙමි. මගේ ඥාති සොයුරා, සේන්ට් ජෝන් රිවර්ස්! ඔහු ආගමික සේවයට



ඉන්දියාවට ගොස් බොහෝ කල් ය. මා සිතා සිටියේ ඔහු තවමත් ඉන්දියාවේ බවයි.

හිම අතරින් ආ ඔහු මා වැළඳ ගත්තේ ය.

"නියම පිළිගැනීමක් තමයි මේක නම්. ජේන් ඔයාට අසනීප පාටයි. ඔයාව ඇතදි දූකලා මට හරි සතුටක් ආවා. ඒත් මං බැලුවා මේ වගේ ජරා දවසක මෙච්චර උදෙන් බෑග් එකකුත් උස්සගෙන ඔයා මේ කොහෙද යන්නෙ? එහෙනම් මේකයි තොන්ෆීල්ඩ්! මාර ගෙයන්නෙ!"

"කොච්චර දෙයක් ද ඔයාව දකින්න ලැබීම. යං ගෙට. ඒත් මට ඔයාව පිළිගන්න වෙන්නෙ බොහොම දුප්පත් විදියට".

"යං, යං, මගෙ අස්සයා ගෙනියන්න කව්රු හරි ඉන්නවද?"

"කව්රුත් නෑ. මං ඔයාට ඉස්තාලෙ පෙන්නන්නම්"

ඉස්තාලය දුක්මුසු දසුනකි. පෙරළුණු බාල්දි, කිළිටි පිදුරු හැම තැන ම විසිරී ඇත. බැලූ බැලූ අත අපිළිවෙල පළ විය. කරත්ත වල අසුන් පමණක් නොව රුබි ද ඉස්තාලයේ විය. ඌව සොයාගෙන ගෙදර ගෙනාවේ කව්ද? මම ඌ වෙතට ගොස් හොම්බ අත ගෑවෙමි. ඌ හොම්බ අතුල්ලමින් ආදරය පළ කළේ ය.

"කෝ ජේන් වැඩකාරයෝ?"

"එක්කෙනෙක් අස් කරලා. අනිත් අයත් ගිහින්"

ඔහු කුතුහලයෙන් මදෙස බැලුවත් මුවින් නොබිණුවේ ය.

"එහෙනම් මම අශ්වයො ගැන බලන්නම්" -

සිය අසු ගේ සෑදලය ගලවා මුල්ලකට විසිකළ ඔහු වතුර පොම්ප කරන්නට විය.

"ගෙට යන්න ජේන්. ඔයාට හීතලේ ඉන්න හොඳ නෑ. ඔයාගෙ මහත්තයා ගෙදර ඉන්නවද?"

"එයා ලන්ඩන් ගිහින්"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 52

"එතකොට ඔයා ළඟ ඉන්නෙ කව්ද?"

"කව්රුත් නෑ"

"මේ වගේ වෙලාවක, තට්ට තනියම?"

මා දරුවකු ලැබීමට සිටින බව ඩයනා හෝ මේරි ඔහුට කියන්නට ඇත. ඔහුගේ කටහඬේ අනුකම්පාව ගැබ් වී ඇත.

"මට නම් මේ මුකුත් තේරෙන් නෑ. ඒත් මං පුළුවන් උදව්වක් කරන්නම්. ගෙට යන්න ජේන්. හීතලයි හුළඟයි ඔයාට හොඳ නෑ"

"එතකොට ඔයා? ඔයාටත් පුරුදු රස්නෙ දේශගුණේනෙ? මොකද ආපහු එන්න හිතුණෙ?"

මෙසේ අසමින් ම මම ඔහුගේ සෑදලය ගබඩා කාමරයට ගෙන යන්නට වීමි.

"ඕක තියන්න ජේන්"

"මේ ව්‍යායාමෙන් මට උණුසුමක් ලැබෙයි"

"හිතුවක්කාර කෙල්ල!" අශ්වයන්ට වතුර ගෙන යන අතරේ ඔහු මිමිණීය. "මම නිකම්මයි ආවෙ. දැන් මෙහෙම වැඩක්වත් කරන්න ලැබිච්ච එක කොච්චර හොඳද?" වතුර බාල්දි ගෙන එහාට මෙහාට යන අතරේ ඔහු කතා කළේ ය.

ඔහු ගේ අශ්වයා කුටියකට දමා දොර වසමින් මම ඔහු දෙස බැලීමි. මේ මා කලින් දුටු න්‍යායික මිනිසා නොවේ. වසර ගණනක ඉන්දියානු ජීවිතය ඔහු ප්‍රායෝගික මිනිසකු කර ඇත.

අන්තිමේදී අශ්වයන් ගේ වැඩ අවසන් කළ අපි ගෙතුළට ගියෙමු. මා උදුන අසළ හිඳුවා නොනැගිටින ලෙස අණ කළ ඔහු උදුන දල්වා කෑමට යමක් සෙවීමට ගියේ ය. මා ලන්ඩන් ගොස් එඩ්වඩ් සොයා ගත යුතු ය. එහෙත් කෙසේ ද?

කෑම ටිකක් සොයා ගෙන ආ ඔහු උදුන මත කේතලය තැබී ය.



"ඔයාට පේනව ඇති පිටරට ජීවිතේ හින්දා මම ප්‍රායෝගික මිනිහෙක් වෙලා තියෙන හැටි. දැන් ඕන දේකට ඔරොත්තු දෙනවා"

"ඒක ඇත්ත. දැන් අනුන්ගෙ දුකේදි පිහිට වෙන කරුණාවන්ත කෙනෙක්. ඔයා එහෙදි අසනීපෙන් හිටියද?"

"ඔව්, හොඳට ම අසනීප වුණා. දැන් හොඳයි. මං කාලයක් ම පිටරටට වැඩ කළානෙ. දැන් ඉතිං මෙහෙට වැඩ කරන්න කාලෙ. මේ දවස් ටිකේ මට නිවාඩු. ඒකයි ඔයා බලන්න ආවෙ"

බොහෝ අත්දැකීම් වලට සාර්ථකව මුහුණ දුන් ලකුණු ඔහුගේ මුහුණේ විය. දැස්වල වෙනදා නොවූ කාරුණික බවකි. පිටරට ජීවිතය ඔහු වෙනස් කර ඇති තරම්! කළකට පෙර විවාහයට නොගැලපෙන පුද්ගලයෙකැයි සිතා මම ඔහු ප්‍රතික්ෂේප කළෙමි.

ඔහු මා වෙත නැඹුරු විය.

"තරහ නැත්නම් දෙයක් අහන්නද? ඩයනයි මේරියි කිව්වා කාලෙකින් ඔයාගෙන් ලියුමක් නෑ කියලා. එයාලා හිතුවලු ගෙවල් මාරු කිරිල්ල හින්දා ඔයාට නිදහසක් නැතුව ඇති කියලා. දැන් මං එනකොට ඔයා මේ පාළුගෙයි තනිවෙලා ඉන්නවා"

"මොකටද බොරු කියන්නෙ. මෙහෙ හැම දෙයක් ම හොඳින් සිද්ධ වෙනව කියන්න නම් බෑ"

තේ හදන ගමන් කියූ මම දෑසට පිරූ කඳුළු හංගා ගැනීමට පුටුවේ හාන්සි වීමි.

"ජේන්, ජේන්. දුක් වෙන්න එපා. දැන් මං ඉන්නවනෙ. මට පුළුවන් විදියට ඔයාට උදව් කරන්නම්. කොහොමද ජොනතනුයි රොචෙස්ටර් මහත්තයයි සනීපෙන්ද?"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 53

"ජොනතන් ඉන්නෙ ෆරන්ඩීන් වල. එහෙ පූජක තුමාගෙ ගෙදර. එඩ්වඩුත් හොඳින් ඉන්නවා"

"එයා බිස්නස් වැඩකට ගිහින් වෙන්නැති නේද? එතකොට මං එද්දි ඔයා අර කොහෙද යන්න ගියෙ?"

සේවකයන් සියලු දෙනා පිට ව ගිය පසු එඩ්වඩ් සොයා ලන්ඩන් යාම සඳහා ටොඩ් මහතා ගේ උදව් ඉල්ලීමට ගිය බව කී මම සෙලින් ගැන කිසිවක් නොකීමි. ජෝන් මා සැක කරන බව පෙණුනත්, තවත් මා නොපෙළා ඔහුගේ පිටරට ජීවිතය විස්තර කළේ ය.

උදුනේ උණුසුමින් මට නිදිමත විය. ජෝන් මගේ නළලට අත තබා බැලී ය.

"ඔයාට උණ වගේ. යං, මං ඇඳට එක්ක යන්නම්"

මා දන් ඇත්තෙන් ම අසනීපයෙනි. ඉතින් ඔහුට කීකරු වනු හැර කුමක් කරන්නද? කාන්තාවක සේ හුරුබුහුටියට කාමරය සැකසූ ඔහු මා සතපවා ගොස් හොඳ බීමක් ගෙනායේ ය. අනතුරුව දේවස්ථානයට යන පාර අසාගෙන ටොඩ් මහතාගෙන් උදව් ඉල්ලීමට යාමට සැරසිණි.

"මගේ අස්සයට හරි මහන්සියි. මං ඔයාගෙ වෙළඹ ගෙනියන්නද?"

"එපා! ඌ ඊයෙ කුප්පුවෙලා මාව බිම දැම්මා"

"මොකක්? පුදුමයක්යැ ඔයා අසනීප වෙන එක. හොඳයි මං මගෙ අස්සයා ගෙනියන්නම්. ඌට තව හැතැප්මයක් යා ගන්න පුළුවන් වෙයි. දන් විවේක ගන්න. මං ඉක්මනට එනවා"

ඔහු පිටව ගියේ ය. මහන්සියි හා රෝගී බව තිබියදීත් ජොන් මා සමග සිටින බව දනීම නිසා මට හොඳින් නින්ද ගියේය. මා නැවත අවදි වූයේ රෑ කෑමට කතා කරන විටයි. ජෝන් කෑම මේසයේ තනි කිරීම නොමනා නිසා මම ද ඔහු සමග කෑමට වාඩිවීමි. ටොඩ් මහතාගේ නිවාස පාලිකාවත්



තවත් සේවකයෙක් හා සේවිකාවකුත් නිවසේ වැඩ බාර ගෙන තිබුණි.

"ඔයා නම් හාස්කමක් කරලා තියෙන්නෙ. මං ඔයාට කොහොම ස්තුති කරන්නද?"

ඉතා හොඳින් පිළියෙළ කර තිබූ කෑම මේසය දුටු මම ඔහුට ප්‍රශංසා කළෙමි.

"මට නම් දෙවියන්ට ස්තුති කරන්නෙ අර හිම වැස්සෙ ඔයා යන එක නවත්තන්න වෙලාවට එන්න ලැබිච්ච එක ගැන. ටොඩ් එච්චර කඩිසර මිනිහෙක් නෙවෙයි. ඒ වුණාට මේ වෙලාවෙ උදව් කළා".

ඔහු නිහඬ වූ හැටියෙන් ම ටොඩ් හොඳ වාර්තාවක් සපයා ඇති බව මට දැණින. මා පත්ව සිටියේ අසීරු තත්වයකට යි. බිරිඳක වශයෙන් සැමියාට දක්විය යුතු පක්ෂපාතී බව සියල්ලට වඩා ප්‍රබල ය. එහෙත් ජෝන් මේ කරන උදව් වල හැටියට ඔහුට කිසිවක් නොකියා සිටිය නොහැක.

"ටොඩ් මහත්තයා කියන්න ඇතිනෙ අපේ කරදර ගැන. වැඩකාරයො ගෙදරින් ගිය එක පොඩි දෙයක් විතරයි".

"මට නම් මේවයෙ තේරුමක් නෑ. ඒත් ටොඩ් කිව්වා කලින් හිටපු රොචෙස්ටර් නෝනගෙ අක්කා ඇවිල්ලා ඔයාගෙ මහත්තයට චෝදනා කරනවා කියලා. සමාවෙන්න ජේන් මම මේවා අහනවට. කොහොමත් ඔයාගෙ මහත්තයා ඇරුණා ම ඔයාට ඉන්න එක ම පිරිමි නෑදෑයා මමනෙ"

"මට නම් පේන්නෙ ඔයා පඹ ගාලක පැටලිලා ඉන්නෙ. ඔය ඕපදූප කතා නිසා ඇත්ත යට යනවා".

"ඔය ඔක්කොම ම වැරදි කාරයො අර නපුරු ගෑණු දෙන්නා".

"වෙන්නැති. ඒත් ජේන්, මං කෙළින් ම කියන්නද? ඔයා කවදත් අභියෝග වලට මූණ දෙන්න දක්ෂනෙ. ඒකයි අපි ඔයාට ගොඩක් ආදරේ. අමතක කරන්න එපා, ඕනෙ එකකට ඔයාට අපි තුන්දෙනා ඉන්නවා"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 54

"ජෝන්....' මට ගොත ගැසුණි.

"මේ අහන්න ජේන්. රෝලන්ඩ් නෝනා ඔයාලගෙ නම් කැත කරනවා. මොකක්ද දැවැද්දක් ගැන ප්‍රශ්නයක්ලු නේද? ඒක එච්චර වැදගත් නෑ. ඒත් ලෝකයා එච්චර කරුණාවන්ත නැනෙ. අනිත් භයානක ම දේ තමයි එයා ඕපදූප පතුරවනවලු ඔයාගෙ මහත්තයා කලින් නෝනව මැරුවා කියලා"

"ජෝන්. මේ ප්‍රශ්නෙ ගැන තවත් කතා කරන්න එපා. ඔය ඔක්කොම කියන්නෙ පිස්සු පවුලක පිස්සු ගෑණියෙක්. එඩ්වඩ් තරුණ කාලෙ කරගත්ත මෝඩ කසාදෙ නිසා නිකම් මේවට පැටලිලා. මේසන්ලා හින්දා එයාගෙ ජීවිතේ ම විනාස වුණා. දැන් බර්තා මැරිලවත් එයාට නිදහසක් නෑ"

"මං ඔයාට කරදර කරන්න හිතුවෙ නෑ ජේන්. ඒත් රෝලන්ඩ් නෝනා කට වහගෙන ඉන්න එකක් නෑ. ඔයාගෙ මහත්තයා හිතනවා ඇති ගණන් නොගෙන හිටිය ම ඕවා නිකම්ම ඇරිල යයි කියලා. ඒත් මේකට නම් ඊට වඩා මොකක් හරි කරන්න වෙයි. මං මේ කියන්නෙ ඔයාගෙ හොඳටයි. මේවට ඔයයි පුතයිත් ගෑවෙනවනෙ. මම කියන්නද? මහත්තයා ආවම මං මේ ගැන කතා කරන්නම්.

එය නම් එඩ්වඩ් කෝප ගන්වන ක්‍රියාවකි.

"එපා ජෝන්. එඩ්වඩ් කැමති නෑ එයාගෙ වැඩ වලට ඇඟිලි ගහනවට".

"එක අතකට ජීවිතේට නොදකපු මිනිහෙක් කියන දෙයක් එයා අහයිද? ඒත් ජේන් මං කතා නොකළොත් කවිද කතා කරන්නෙ?"

මම බියෙන් ගොලු වීමි. මෙයින් එඩ්වඩ්ගේ කෝපය ප්‍රසිද්ධියේ ප්‍රකාශ වනු ඇත. කෙසේ වුවත් තමන් ගැන කියවෙන ඕපදූප චෝදනා ගණන් නොගෙන සිටීම එඩ්වඩ් ගේ පරම්පරාවේ ලක්ෂණයකි.

"ඔච්චර දුක් වෙන්න එපා ජේන්. දැන් ඉතිං අතගගා ඉන්නැතුව කන්න. මේවා ඔක්කොම විලෝජ් නෝනා ගෙනාවෙ. කෑවට පස්සෙ ඔයා මට පියානෝ ගහනව නේද?"



කෑමෙන් පසු මම ඔහු කැමති ගීත කීපයක් වාදනය කළෙමි. කලකට පසු වාදයේ නිරත වීමෙන් මට ලැබුණේ අධික සතුටකි. වාදනය අතරේ එක් වර ම ළඟ වූ ජනේලයක් දෙසින් පහුරු ගාන හඬක් ඇසුණි.

"ඒ මොකක් ද?" පුටුවෙන් පැන්න ජෝන් ජනේලය වෙත ගොස් එබී බැලීය. පිටත අඳුරෙන් මතු වූයේ මා හොඳින් දක පුරුදු මුහුණකි.

"ජෙරමි! ඒ ජෙරමිනෙ. එයා තමයි අපේ කරත්තෙ එලවන්නෙ"

"ඔයාට ඕනැද එයාව ගෙට ගන්න?"

"නැතුව!"

"බලාගෙන එයා බීල ද දන්නෑ"

"එහෙනම් ඒ ජීවිතේ පළවෙනි පාරට. ජෙරමි බොන්නෑ"

ජෝන් දොර ඇරියේ ද සැකයෙනි. පැන දුවන්නට සැරසුණු විලාසයකින් සිටි ඔහු අප දැක දබරැඟිල්ල දෙතොලට තබා ගනිමින් අප වෙත ආවේ ය. කිළිටි ඇඳුම් ඇඳ සීතලේ වෙව්ලමින් සිටි ඔහු ගැන මට දුක සිතුණි.

"නෝනා මට කියන්න දෙයක් තියෙනවා. හැබැයි නෝනට විතරයි"

"මම රිවර්ස්. නෝනගෙ අයියා. මොකක් ද තමුසෙට කියන්න තියෙන්නෙ?"

"එයාට සැර කරන්න එපා. එයා පොඩි කාලෙ ඉඳන් අපට වැඩ කළා. ජෙරමි, එන්න ඇතුළට"

"බෑ.. මට බයයි. මහත්තයා මාව පැන්නුවා. රෑබිව ගෙනාපු වෙලේ ග්‍රේස් නෝනා කිව්වා මෙහෙ ඉඳලා අහුවුණොත් බලාගෙනයි කියලා".

"ඒ දෙන්නම ගෙදර නෑ. එන්න ඇතුළට"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 55

ඔහු සීතලෙන් ගැහෙමින් ඇතුළට ආවේ ය. මම ඔහු කුස්සියට කැඳවා පළමුව කන්න දුන්නෙමි.

"එහෙනම් ඔයයි රූබිව ආපහු ගෙනාවෙ?"

"ඌට අයාලෙ යන්න ඇරලා මං කොහොමද යන්නෙ? මම මෙහෙ ඉඳලා හැතැප්ම දහයක් විතර ගිහින් හිටියෙ රූබි පාර දිගේ එනකොට. මගෙ කටහඬ අඳුනගෙන ඌ මං ගාවට ආවා. සෑදලේ නැතුව ඉණ පටිය විතරක් තියනවා දකලා මට නෝන ගැන හරියට බය හිතුණා. මම ආපහු එනකොට දක්කා සෑදලෙත් වැටිලා තියනවා. ඒකෙ පටි කැඩිලා. කව්රුත් මං ගෙදරට එන්න ඉඩ දුන්නෑ. මට ඕන වුණේ නෝනට හොඳද බලාගෙන යන්න".

"රූබි කුලප්පු වුණේ මං ඔයාව හොයාගෙන එනකොට"

"මං හිතුවා නෝනා"

"එතකොට තමුසෙ එදා උදෙන් ම ගියා නම් කව්ද නෝනගෙ අස්සයා ලෑස්ති කළේ? නෝනා කොහොමත් අස්සයෝ පිටේ යන්න දස්සයෙක් නෙවෙයිනෙ. ඒත් සෑදලේ හරියට දාලා තිබුණා නම් මේක වෙන් නෑ"

"එක් තමයි මහත්තයා. මං හිටිය නම් මමයි සෑදලේ දාන්නෙ. ඒත් මං ගියාට පස්සෙ කව්රු මේක කළා ද දන්නෑ. ඒත් නෝනා මං එන ගමන් දක්කා. සෑදලේ බඳ පටි දෙක ම කව්රු හරි බාගෙට කපලයි තිබිල තියෙන්නෙ. ඒක හොඳට පේන්න තියනවා"

"වෙන්න බෑ!" මම පුදුම වීමි.

"කෝ දන් ඒක? මට බලන්න ඕනෑ". ජෝන් ඉස්සර විය.

"හරියට දන්නෑ මහත්තයා. මං ඒක ගේ පිටි පස්සට ගෙනාවෙ. නෝනට කරදයක් නෑ කියලා ග්‍රේස් නෝනා මාව එළව ගත්තා. තව දෙයක් තියනවා නෝනා. රූබිගෙ සෑදලේ දාන තැන පිටේ අහලක විතර ලොකු තුවාලයක් තියෙනවා. හරියට සෑදලේ යට ඇණයක් වගේ මොකක් හරි තිබිලා වගෙයි. නෝනා ඉඳගත්තම ඇණේ ඇනිලා රූබිට රිදෙන්නැති. ඒකයි ඌ කුලප්පු වුණේ.



එතකොට පටි කපලා තිබ්බව හින්දා නෝනා වැටෙන්නැති. මේක හොඳට කල් යල් බලල කරපු වැඩක්".

"මං ගෙට රිංගලා හැංගිලා හිටියෙ නෝනට මේක කියන්නයි. මේ ගෙදර දවසින් දවස මහ අමුතු දේවල් සිද්ධ වෙන්නෙ"

කලින් දා රාත්‍රියේ ග්‍රේස් පූල් රෝලන්ඩ් නෝනාට කී වචන මට සිහි විය.

"නෝනට කියන්න එපා. මං එයාව ආපහු එළවල දැම්මා" ඇ කියන්නට ඇත්තේ ජෙරමි ගැන විය යුතු ය.

සෑදලය සොයා ගත් අපි එය පිරික්සා බැලීමු. ජෙරමි නිවැරදි ය. පටි දෙකේ ම අඩක් කපා ඇති අයුරුත් ඉතිරි අඩ ඉරී ගොස් ඇති අයුරුත් මැනවින් පෙනේ. රූබිගේ තුවාලයද ජෙරමි කියූ පරිදිම විය.

"මේක නම් හොඳට ම පැහැදිලියි. ඔයාව මරන්න හරි තුවාල කරන්න හරි කව්රු හරි උත්සාහ කරලා තියනවා. ඒක දන ගන්න නම් අස්සයට සෑදලේ දාපු කෙනා හොයා ගන්න වෙනවා"

ජොන් කැළඹී ඇත. මා කුමක් කියන්නද? මා මැරීමට තරම් මට වෛර කරන කෙනෙක් මෙලොව සිටින බව දැන ගැනීම නිසා මම බියෙන් වෙව්ලීමි.

"මේ රෑ තමුසෙට ආපහු යන්න බෑනෙ. අද මෙහෙ නවතිනවා. එන්න ජේන්, අපි ගෙට යමු"

මට සාළුවක් පොරවා උදුන අසළ හිඳවූ ජෝන් ජෙරමිට අවශ්‍ය දෑ දීමට ගියේ ය. මොහොතකට පෙර ඇසූ දුටු දෙයින් මා කෙතරම් කම්පනයට පත්ව සිටියේ ද යත් ජොන් පැමිණ පවසන තුරු නිවස දෙසට ආ රථයක හඬ මට ඇසුණේ නැත.

කිසිවෙක් කෝපයෙන් කෑ ගසන හඬත් බර අඩි හප්පමින් එන හඬත් ඇසුණි. දොරටුවේ පෙනී සිටියේ එඩ්වඩ් ය. ඔහුගේ මුහුණ කෝපයෙන් දැවේ. ඔහුට පිටු පසින් බියෙන් මුවා වී සිටයේ ඇඩ්ලේ යි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 56
SL UNLIMITED The Spirit of Sri Lankan Community

ජොන් ගේ පැමිණීම දුටු එඩ්වඩ් තවත් කෝපයෙන් කෑ ගැසීය.

"ආ... ජේන්, මං නැති අතරෙ ඔයා ඔක්කොම වැඩ තනියෙං කරගන්නව වගේ නේද? අරෙහෙ ජෙරම් ඉන්නවා හොඳ සැප පහසුවට. මේ මහ රෑ මෙතන මගෙ ගේ ඇතුළෙ ඉන්නවා මම ජීවිතේට නොදකපු මහත්තයෙක්. ආ.... ටිකක් විනෝද වෙලත් තියනව වගේ. මගෙ නෝනා හොඳට වාදනය කරනවද මහත්තයා?"

"මගෙ නංගි කවදත් හොඳට පියානො ගහනවා. මම ම මාව අඳුන්නලා දෙන්නද? මගේ නම සේන්ට් ජෝන් රිවර්ස්. රොචෙස්ටර් මහත්තයා, මෙහෙ ගොඩක් ප්‍රශ්න තියනවා. ඔයා ඒවට කන් දෙන්න ඕනෙ"

"මං කරන්න ඕන දේ ඔහේ කියන්න ඕනෙ නෑ. ඔහේ ඉන්නෙ මගෙ ගෙදර. මට අණ කරන්න එන්න එපා. මට ඕනෙ මගෙ නෝනට තනියම කතා කරන්න. ඇඩිලේ යනවා ඇඳට. මහත්තයත් ගියොත් හොඳයි. මිසිස් පූල් කෝ?"

විලෝස් නෝනා දොර ළඟට ආවා ය.

"මේ කව්ද මේ?"

"මිසිස් පූල් ගෙදරින් ගියා එඩ්වඩ්. ඔයාට කියන්න ගොඩක් දේවල් තියනවා. ඔයා ඒකට ඉඩ දෙනවාද?"

"මට හරි ම මහන්සියි. අරෙහෙ ඇඩිලේ ගෙදර එපා වෙලා යන්න ගිහින්. මෙහෙ වැඩකාරයො උන්ට ඕන ඕන විදියට යනවා එනවා. ඒ මදිවට මම ජිවිතේට නොදැකපු කෙනෙක් මගෙ ම ගෙදර හොඳට සැළකිලි විඳිනවා. ඔව් ජේන්, ඔයා හැම දෙයක්ම කියන එක හොඳයි".

"රොචෙස්ටර් මහත්තයා, මේ වෙන දේවල්වලට හොඳ හේතු තියනවා. ඒ හින්දා ඔක්කොම විස්තර දන ගන්නකම් කරුණාකරලා කේන්තිය පාලනය කර ගන්න".

"ඔහේගෙ අවවාදෙට ස්තුතියි. මට ඔහේගෙන් බේරිල්ලක් නැනෙ. ජේන් අපි උඩට යමු".



මම කීකරු වීමි. මගේ අත දැඩිව ගෙන ඔහු මා කාමරයට ගෙන ගියේ ය. මම හොඳට ම බිය පත්ව සිටියෙමි. කිසි දිනක ඔහු මට මෙතරම් අකාරුණික වී නැත.

කාමරයේ මා හිඳ වූ ඔහු මහත් නොඉවසිල්ලෙන් එහාටත් මෙහාටත් සක්මන් කරන්නට වූයේ මා දෙස බැල්මකුදු නොහෙළා ය.

මේ සියල්ල ඇඩිලේගේ වරද. මට සෙලින් ද සිහි විය. ගැඹුරු නිහඬතාව මැඩ ඔහු කඩා පැන්නේ ය.

"ජේන් ඔයාට කියන්න දෙයක් නැද්ද?"

"මොනවද මං කියන්න ඕනෙ?" මම සන්සුන් වීමි.

"වැටිච්ච එක දැන් හොඳයි නේද?"

"ඔව්, ස්තුතියි"

"හිම දියවෙන පාටක් නම් නෑ. ආපහු එන ගමන හරි ම කරදර වුණා. මං හිතුවා අස්සයන්ගෙ කකුල් කැඩෙයි කියලා. කතා කරන්න ජේන්. ඔයා සද්ද නැතුව ඉන්න එක මට ඉවසන්න බෑ".

"ඇඩිලේ ගියේ මගෙ වැරැද්දෙන් කියලද ඔයා හිතන්නෙ?"

"පිස්සුද ජේන්. එහෙම දෙයක් මගෙ තුන් හිතකවත් නෑ. දැන් කියන්න. ඊයෙ මං ගිය වෙලේ ඉඳන් මේ ගෙදර මොනවද වුණේ? කව්ද අර මිනිහ?"

"ඒ මගෙ මස්සිනා, ඩයනගෙයි මේරිගෙයි අයියා. ඔයා දන්නවනෙ එයා අවුරුදු ගාණක් ඉන්දියාවෙ හිටියෙ. අද උදේ එයා ඇවිත් මට ගොඩක් උදව් කළා. එඩ්වඩ්, කියන්න නම් ගොඩක් දේවල් තියනවා. මට අනුකම්පා කරලා අහනවද?"

සෙලින් ගැන නොකියා අන් සියලු දේ මම ඔහුට කීමි. එඩ්වඩ්ගේ මුහුණේ කෝපය තිබූ තැනට අනුකම්පාව ආවේ ය. මා අසළ බිම හිඳගත් ඔහු මගේ අත ගත්තේ ය.

"අනේ ජේන්. අනේ දෙයියනේ ඔයා කොච්චර දුකක් විඳලද!"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 57

තව දුරටත් සෙලින් ගැන කතා නොකර සිටීම අපහසු ය. ඔහුගේ හිස අතගාමින් මම කටහඬ අවදි කළෙ මි.

"රෝලන්ඩ් නෝනා කිව්වා ඇඩ්ලේ ලන්ඩන් ගියේ එයාගෙ අම්මා ළඟටයි කියලා. එඩ්වඩ්, මං හිතං හිටියෙ සෙලින් නෝනා මැරිලා කියලා. අර නපුරු ගෑණු දෙන්නා කිව්වම සෙලින් ලන්ඩන්වල ඉන්නවා කියලා, මං හරියට වද වුණා. එඩ්වඩ්..."

එඩ්වඩ්ගේ පෙනුම වෙනස් විය. ඔහු නැගී සිටියේ ය.

"නිකං බොරු චෝදනා කරන්න එපා. ඒ වගේ ගෑණියක් ගැන කියලා මං ඔයාට නින්දා කරයිද? ඒකි ජීවත්ව ඉන්නවා කියලා යාළුවෙක් මට ලියලා එව්වෙ ඔයාට පුතා හම්බ වුණු ගමන්මයි. ඒ වගේ වෙලාවක මං ඒක කොහොම ඔයාට කියන්නද? මේ රහස මට හරි ම බරක් වුණා. ඒකි ටිකෙන් ටික ප්‍රසිද්ධ වෙනකොට ඒ ආරංචි ඔක්කොම මට ආවා. ඒත් මං ඒ එකක්වත් ඔයාට කිව්වෙ නෑ. ඒ ගෑණි තවම මේ ලෝකෙ ඉන්න බව කියලා අපේ ජීවිත අවුල් කර ගන්නෙ මොකටද?"

ඔහු ගේ නිහඬතාවට හේතුව මම වටහා ගතිමි. ඔහු සිතන්නට ඇත්තේ මේ ප්‍රශ්න මගෙන් සඟවා ගැනීම හොඳ බවයි. ඒත්, මා සත්‍ය දැන සිටියා නම් කොපමණ හොඳද?

අනතුරුව මට නොකිවයුතු දෙයක් කියවිණි.

"එඩ්වඩ්. සෙලින් ඇඩ්ලේගෙ අම්මා. ඒත් ඇත්තට ම ඇඩ්ලේ ඔයාගෙ දුව නම් ඒක පිළිගන්න වෙනවා නේද? සෙලින් ජීවත්ව ඉන්න නිසා එයා ඇත්ත කියයි. එතකොට ඉතිං මුළු ලෝකෙම දැන ගනී".

මෙය හුදෙක් මගේ ඊර්ශ්‍යාව නිසා කියවුණකි. ඇඩ්ලේ ගැන මට කැක්කුමක් නැත. මට දැන ගත යුතු වූයේ එඩ්වඩ් තවමත් සෙලින්ට ආදරේ කරන්නේ ද යන්න පමණි. මට ඇවැසි වූයේ එඩ්වඩ් සෙලින් පිළිකුල් කරන බව කියා ඇඩ්ලේ ඔහුගේ දරුවා නොවන බව කියනු ඇසීමටයි. එහෙත් මේ මොහොතේ එඩ්වඩ්ට අවශ්‍ය වූයේ ඔහුගේ ප්‍රශ්නවලට මගෙන් සැනසුමක් ලබා ගැනීමටයි.



එහෙත් දෙදෙනා ම එකිනෙකා තේරුම් නොගත් නිසා මෙවේලේ දෙදෙනාගේ ම අවශ්‍යතා ඉටු වූයේ නැත.

එඩ්වඩ් රළු ලෙස ගිගිරුවේ ය.

"ඔයාගෙ අපභ්‍රංශ මට තේරෙන්නෑ ජේන්. අර දේව දූතය ද ඕව කියලා දුන්නෙ? දන් මං කිව්වනෙ මේක ඔයාට නොකියා ඉන්න හොඳ හේතු තියන බව. තව දෙයක් තියනවා මං නොකීපු. ඕක ඔයාට කිව්වා නම් ඔයා හැමදාම දුක්වෙයි මම තාම සෙලින්ට ආදරෙයි කියලා. අපි දෙන්න අවුරුදු පහක්, දහයක් නෙවෙයි, අවුරුදු සීයක් ආදරේ කළත් ඔයා මට ඉන්න දෙන එකක් නෑ. මං අහන්නෙ බොරුද? මං දන්නවනෙ ගෑණුන්ගෙ හැටි"

ඔහුගේ නපුරුකම මට වැදුණු තදබල පහරක් විය. මෙවැනි වචන අහනවාට වඩා ඔහු මට ගැහුවා නම් හොඳයි. මම හිස බිමට හරවා ගතිමි.

"එඩ්වඩ් ඔයාගෙ නපුරු කමට මම මැරෙයි".

පළමුව තිගැස්සුණු ඔහු නැවතත් කෝප විය.

"මට වෙන කියන්න දෙයක් නෑ. මං තවත් මේ ගෙදර ඉන් නෑ. මට ඇතිවෙලා ජේන්. ඔයා දන්නෑ මම විඳින වදේ. මට මේවා විඳගන්න පුළුවන්. මම මීට වඩා ඒවා විඳලා තියනවා. මේ ගෙදර කාලකණ්ණි තැනක් වුණා. ඔයා මාව සනසනවා වෙනුවට වද දෙනවා. ඔයාට ඕන දෙයක් කර ගන්න. මම යනවා යන්න".

"එඩ්වඩ් යන්න එපා, යන්න එපා"

අවාසනාවකට මෙන් පඩි පෙළ පාමුල දී ජෝන් හා එඩ්වඩ් හමු වූහ. මෙවේලේ එය අවාසනාවන්ත ප්‍රතිඵල ගෙනාවේ ය.

"තාම රස්තියාදු වෙනවද රිවර්ස්. හොඳයි මම තවත් තමුසෙට බාධා කරන් නෑ. මගෙ ගෙදර හොඳට සැපට ඉඳගෙන මගෙ නෝනවත් බලා ගන්නවා. මම යනවා"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 58

ඔහු නිවසින් පිටව ගියේ ය. මා පසුපස යමින් හඬා වැටුණත් ඔහු නොවේ නැවතුණේ. අසු පිට නැඟුණු එඩ්වඩ් ඉගිලී ගියේ ය. පයිලට් බල්ලා පසු පසින් දිව්වේ ය.

කෙතරම් වෙලා එහි සිටියා දැයි මට අමතකයි. ජෝන් පැමිණ මා ගෙට කැඳවාගෙන ගියේ ය. වේදනාවෙන් දුර්වලව සිටි මට ඔහු තුවායක් පෙරවූයේ ය. මම නත් දොඩවන්නට වීමි. නොදනී ම සෙලින් ගැන ද කියවුණි.

"එයා ලොකු පීඩනයකින් ඉන්න පාටයි. ටිකක් ඉවසන්න ජේන්. එයා ගෙදරින් පිට වෙලා ඉන්නකොට කරපු දේවල් ගැන මීට වඩා හිතාවි".

"එයා රට යාවි. බර්තා ඉන්නකොටත් එයා එහෙම කළා".

"ඔයා පිස්සියක් නෙවෙයිනෙ. එයා ඔයාගෙ මහත්තයා. එයා ඔයාට ආදරෙයි"

මට කඳුළු දරා ගත නොහැක.

"අනේ ජෝන්. එයා එන වෙලාවෙ ඔයා නොහිටියනම්! ඔයාව දැක්කම එයාට තරහ ගියා. ඔයා අද ආවෙ නැත්නම් මම එයා පස්සෙ ලන්ඩන් වෙනකම් හරි ගිහින් එයා එක්ක ආපහු එනවා. එහෙනම් මේක මේ විදියට කෙළවර වෙන්නෑ".

මේ වචන ගැන පසුව මම මට ම ශාප කර ගතිමි. එහෙත් ජෝන් එය ගණන් නොගත්තේ ය.

"ඔව් ජේන්, මට තේරෙනවා. ඒත් එයා ආපහු ඒවි. ඒක මට විශ්වාසයි".





**මා** දැන් ඔබට කීමට යන්නේ මගේ අත්දැකීමක් නොවේ. එඩ්වඩ්ගෙන් සහ බ්ලාන්ච් නෝර්ටන්ගෙන් මා පසුව අසා දැනගත් කරුණු මත මේ විස්තරය පදනම් වී ඇත.

එදා රෑ නිවසින් පිට වූ එඩ්වඩ් සැතපුම් විසිපහක් පමණ දුර අමාරුවෙන් ගෙවා කුඩා නගරයක තානායමකට සේන්දු වී ඇත. පයිලට් බල්ලා ද ඔහු සමග ගොස් ඇත. ඊළඟ උදෑසන අශ්වයා නිවසට එවන ලෙස අණ කළ ඔහු වෙනත් අස්රියක් කුළියට ගෙන ලන්ඩන් බලා ගොස් ඇත. මේ දිගු ගමනේ දී ඔහු අධික වෙහෙසිනුත් සිතේ අමැරුවලිනුත් පීඩා විඳි බව පසුව මා සමග කීවේ ය.

ලන්ඩන් නුවරට ළඟා වූ ඔහු නැව් සමාගමටත්, ඔහුගේ ඇඳුම් මසන්නා හා සපත්තු සාදන්නා වෙතටත් ගොස් ඇත. අන්තිමේ ඔහු නෝර්ටන් යුවළගේ ලන්ඩන් නිවසට ගියේ ය.

කතාවේ ඉතිරි කොටස මා දැන ගත්තේ ළඟ දී මා බැලීමට ආ බ්ලාන්ච් නෝර්ටන්ගෙනි. අනුන්ගේ දුක ගැන කිසිදු අනුකම්පාවක් නැති ඇය මගේ සිත රිදවමින් මේ කතාව කීවා ය.

"එයා ආවෙ බොහොම සතුටු මූණකින්. කිසි කෙනෙකුට හිතන්න බෑ එයා එච්චර ප්‍රශ්න ගොඩක් හිතේ හංගන් හිටිය ද කියලා. ඒත් මං දැක්කා එයාගෙ මූණෙ අර ඉස්සර නෝනා ඉන්නකොට තිබ්බ්ච පෙනුම යන්තමට තියනවා. එයා කිව්වෙ බිස්නස් වලට ලන්ඩන් ආවා කියලා. අපිත් ඉතිං ප්‍රශ්න අහන්න ගියෙ නෑ. ඒත් මගෙ මහත්තයා කිව්වා එයාට බිස්නස් වලින්



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 59

කරදර බව. එයා බිස්නස් ගැන වැඩිය කතා නොකර මග ඇරියා. ඉතිං අපි දැනගත්තා ප්‍රශ්නයක් තියන බව".

"තෝන්ෆීල්ඩ් ගැන එයා වැඩි දෙයක් කිව්වෙ නෑ. ඔයාගෙ අයියා කෙනෙක් ඔයාව බලා ගන්නවා කිව්වා. ටික දවසකින් එයා ඇඩිලේව ගෙන්න ගන්න තීරණය කළා. ඒකට නම් අපි හරියට සතුටු වුණා."

මුල් දින කීපයේ දී, එඩ්වඩ් ලන්ඩන් සමාජයේ විඳිය හැකි සියලු ම විනෝදයන් අත්විඳි බව බ්ලාන්ච් කීවා ය. ඔහු ලන්ඩන් ගියේ වසර දහයකට පසු බැවින් සියලු දෙනාගේ අවධානයට ලක් වී ඇත. ඔහුගේ අතීත කතාව ද ඔව්හු දනිති. අනිත් අතට ඒ සෘතුවේ ජනප්‍රියම චරිතය වූ සෙලින් වැරන්ස් නිසා ද එඩ්වඩ් වැඩියෙන් අවධානයට ලක් වී ඇත. හැම සන්ධ්‍යාවක ම කාගේ හෝ සාදයක ගී ගැයීමට ඇයට ආරාධනා ලැබී ඇත. එඩ්වඩ් හා සෙලින් නැවත මුණ ගැසී ඇත්තේ ද ජාගෝ ආර්යාවගේ නිවසේ පැවති එවැනි සාදයකදී ය. සෙලින් ගේ සුන්දරත්වය ද ඇගේ රමණීය කටහඬ ද බ්ලාන්ච් වර්ණනා කළේ අතිශයෝක්තියෙනි. එඩ්වඩ් ආ විට සියලු දෙනා ම ඔවුන් දෙදෙනා දෙස බලමින් කසු කුසු කැ හැටිත්, ඔවුන් දෙදෙනා එකිනෙකා නොදුටු අයුරින් සිටි හැටිත් බ්ලාන්ච් විස්තර කළා ය. එහෙත් අනතුරුව සෙලින් ගායනා කොට ඇත්තේ පැරණි පෙම්වතා වෙනුවෙන් පෙම්වතියක් වැළපෙන අයුරු කියවෙන ගීතයකි. ඒ ගීතය ගැයෙත් ම එඩ්වඩ් ගල් ගැසී සිටි අයුරුත් ඔවුන් දෙදෙනා ඉතා වේදනාවෙන් එකිනෙකා දෙස බලා සිටි අයුරුත් බ්ලාන්ච් කදිමට මවා පෑවා ය.

ගීතය අවසන් වූ වහා ම එඩ්වඩ් ඈ වෙත ගොස් ඇගේ අත ගෙන කාමරයෙන් පිටව ගොස් ඇත.

"පහුවෙනිදා උදේ එඩ්වඩ් ගෙදර හිටියා. මං දන්නෑ එයා රෑ කීයට ආවද කියලා. සෙලින් එක්ක පැය කීපයක් කතා කර කර හිටියා කියල විතරයි එයා අපට කිව්වෙ. අපිත් ප්‍රශ්න අහන් නැතුව හිටියා"



"ඇඩිලේ ආවහම තමයි ඔක්කොම කතා පැතිරුණේ. එයානම් ඉක්මනින් ම ලන්ඩන් ජීවිතේට හුරු වුණා. මුළු නගරෙ ම එයාව පිළිගත්තා".

දිනක් සෙලින් රඟපෑ නාට්‍යයක් නැරඹීමට ගිය බව කී බ්ලාන්ච් ඇගේ රඟපෑම ද මහ ඉහළින් වර්ණනා කළේ ය.

"එයා රඟපාන අතරෙ මං දැක්කා එඩ්වඩ් ඉස්සරහට නැවිලා අත්මිට මොළවගෙන කෙඳිරි ගානවා. එයාගෙ දුක දකලා මට පුදුම හැඟීමක් ඇති වුණේ ජේන්.

"මට හිතා ගන්න පුළුවන්" කී මම තිහඬ වීමි. වචනයෙන් කියා ගත නොහැකි ශෝකයකින් මගේ හදවත බර වී තිබුණි.

UPLOADED BY ELIFE



WWW.EXPRESSLANKA.TK 60

# 24

එඩ්වඩ් නිවසේ නොසිටි කාලයේ ශෝක වෙමින් සිටි මා සැනසීමට ජෝන් නොකළ දෙයක් නැත. මා ශෝක වූයේ එඩ්වඩ් මිය ගිය ආකාරයෙනි. අප හමු වූ දින පටන් ම එඩ්වඩ් මට මෙතරම් දරුණු ලෙස සලකා නැත.

ඔහුගේ ආදරය නැති වීමත් සමග ඔහු ගැන පමණක් නොව ජීවිතය ගැන පවා මා තුළ වූ විශ්වසය බිඳී ගියේ ය. මට එඩ්වඩ් ගැන විශ්වාස කළ නොහැකි නම් අන් කිසිවක් විශ්වාස කළ නොහැක. ඔහුගෙන් ලිපියක් නොලැබී දිනෙන් දින ගතවත් ම ඔහුගේ ආදරය සදහට ම අහිමි වූ බව මම සිතුවෙමි.

ජෝන් ඇඩ්ලේ ගැන ද ඇස ගසා ගෙන සිටියේ ය. දෙසැම්බරයේ මැද හරියේ දී හිම දියවීම ඇරඹින. සතියකට පසු එඩ්වඩ්ගෙන් ලිපියක් ලැබුණි. මෙහෙකාරියගෙන් එය උදුරා ගත් මම වෙව්ලන දෑතින් විවර කොට කියවන්නට වීමි. ලිපිය ඉතා කෙටිය.

"මම නෝර්ටන් ආර්යාවගේ ගෙදර ඉන්නෙ. ඇඩ්ලේව මා ළඟට එවන්න. එයා වැඩ කාරියකුත් ගේන්න ඕනැ. කරුණාකරලා හොඳ රියදුරෙක් හොයලා එවන්න. ඇඩ්ලෙ ආවහම කරත්තෙ ආපහු එවන්නම්. මං හිතනවා ඔයාටයි රිවර්ස් මහත්තයටයි කර්ත්තෙ ඕන වෙයි කියලා"

මම පුටුවක් මතට වැටුණෙමි. තව ම ඔහු මට සමාව දී නැත. තවමත් ඔහු කෝපයෙනි. දැන් ඔහු ඇඩ්ලේවත් තමන් වෙත ගෙන්වා ගැනීමට යයි. ආදරය පළ කරන එකදු වදනක්වත් ලිපියේ



නැත. අප දෙදෙනා අතර නැවත සමීප බවක් ඇති කර ගැනීමට ඔහුට අවශ්‍ය නැති බව පෙනේ.

ඇඩ්ලේ තාත්තා වෙතට යා යුතු බව මා කීවිට ඇය ප්‍රීතියෙන් කැළඹුණා ය. "පපා ඔයාට එන්න කියලා නැද්ද කුඩම්මෙ?" ඈ ඇසුවේ ද්වේශ සහගත සිනාවක් සමගිනි. මා හිස සැළුවා පමණි. ලන්ඩන් ජීවිතය ගැන අධික උනන්දුවෙන් සිටි ඈ මගේ කඳුළු නොදකින්නට ඇත.

ඇඩ්ලේ ගිය පසු ජෝන් සහ මම නැවතත් තනි වීමු. මගේ ඥාති සොයුරිය මේරි අප වෙත පැමිණීමට නියමිතව තිබුණත් ඈ හදිසියේ අසනීප වූ නිසා ගමන වැළකිණි.

දවසින් දවස ගත වත් ම මගේ ජීවිතයේ ඇති වටිනාකම කුමක්දැයි මම කල්පනා කළෙමි. පියා නැති නිවසක මගේ අලුත් දරුවා බිහි කළ යුතුද? නිදි නැති දිගු රාත්‍රීන් වලදී මා පැතුවේ වෙලාව පැමිණි විට මාත් දරුවාත් දෙදෙනාම මිය යතොත් යහපත් බවයි.

මා කෙතරම් උත්සාහ කළත් මගේ වේදනාව ජෝන්ගෙන් සඟවා ගැනීම අසීරු විය. වසර ගණනක ආගමික සේවය නිසා ඔහු අනුකම්පා සහගත මිනිසකු බවට පත්ව ඇත. ඔහු මා සැනසීමට සුළු සුළු දේවල් කළේ ය. කාලගුණය හොඳ දින වල ඔහු මට අසුපිට යන්නට බල කළේ ය. නිවසේ කටයුතු පවා ඔහු සිය කරපිට පටවා ගත්තේ ය.

සති දෙකකට පමණ පසු ජොනතන් බැලීමට යාමට මට යෝජනා කළේ ද ඔහු ය. ඇත්ත ම කියතොත් මේ අඳුරු කාලය තුළ මට පුතා මතක් වුණේවත් නැති තරම් ය. ඔහු මේ පාළු නිවසට ගෙන්විය නොහැකි නිසා දිනක් අපි ෆර්න්ඩීන් බලා ගියෙමු.

"එඩ්වඩුයි මායි ෆර්න්ඩීන් වලදි හරි සතුටින් හිටියා. අපේ පුතා හම්බ වුණෙත් එහෙදි"

හොඳ ජෝන්! මගේ මෙවැනි වැළපීම් ඔහු කෙතරම් ඉවසීමෙන් අසා සිටිනවාද? ෆර්න්ඩීන් ගමන හිතුවාටත් වඩා යහපත් ලෙස



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 61

මට බල පෑවේ ය. ආදරණීය පුතාත් වෙදර්ෆීල්ඩ් පවුලත් දකීමෙන් අපේ අතීත ප්‍රීතිය නැවත මා වටා ඇතුවාක් සේ මට දැණින. එතරම් තදින් බැඳී සිටි අප ප්‍රශ්න සහ අනවබෝධය මත වෙන් වීම කෙතරම් පුදුමයක්ද? පුතා සහ වෙදර්ෆීල්ඩ් පවුල සමග තේ බී මා නිවසට ආවේ වඩා ප්‍රීතියකිනි. එදා සිට ටිකෙන් ටික මා ශක්තිමත් වූ බව මට සිතේ.

ශෝකය කෙතරම් ප්‍රබල වුවත් තෝන්ෆීල්ඩ්හි රොවෙස්ටර් මැතිණියගේ ස්ථානය ආරක්ෂා කර ගැනීමට මට හැකි විය. බර්තා සිටිය දී කළාක් මෙන් එඩ්වඩ් මා නිසා නිවසට නොපැමිණියහොත් මා තෝන්ෆීල්ඩ්හි තනි වනු ඇත. මගෙන් ඔහුට වැඩක් නොවේ නම් මගෙන් කාට හෝ යහපතක් විය යුතුය. මගේ ජීවිතයෙන් කාට හෝ ප්‍රයෝජනයක් තිබිය යුතු ය. මේ ගැන සිතූ මම දිනක් ජෝන් ඇමතුවෙමි.

"ජොන්. නත්තලුත් කට ළඟට ම ආවා. දැන් ගමේ දුප්පත් මිනිස්සුන්ට අමාරුම කාලෙ. ඔයා මට උදව් කරනවනෙ".

"නැතුව! ඕන උදව්වක්. තව එකක්. සජන් කීප පාරක් ම ආවා උපදෙස් ගන්න. මට ඒවට අයිතියක් නැනෙ. ඔයාට දැන් හොඳයි නම් එයාව හම්බ වෙනවද? සමාවෙන්න ජේන්. ඔයාට මේවා බර වැඩිද මන්දා. ඒත් සජන් කියන විදියට සෑහෙන ප්‍රශ්න ගොඩක් තියනවා. ජේන්, ඔයාගෙ කසාදෙන් පස්සෙ ඔයාගෙ සල්ලි ඔයා යටතෙ තියා ගන්න ක්‍රමයක් හදා ගත්තද? නැත්නම් නීතියෙ හැටියට ඒවා ඔක්කොම අයිති වෙන්නෙ ඔයාගෙ මහත්තයටයි".

"නෑ. මං ඔක්කොම එඩ්වඩ්ට පැවරුවා"

"මං හිතුවා. එතකොට ඔයා මහත්තයගෙ බිස්නස් ගැන දන්නවද?"

"ෆර්න්ඩීන් වලදි නම් ඔක්කොම දැනං හිටියා. දැන් නම් කිසි දෙයක් දන්නෑ".

"පුළුවන් නම් සජන් හම්බ වෙන්න" ඔහු තුළ ශෝකයක් විය.



"මං නිතර ම හිතුවෙ ගෑණියෙක් හැම දේකදිම තමන්ගෙ මහත්තයව විශ්වාස කරන්න ඕනෑ කියලා".

"මට තේරෙනවා. ඒත් දැන් ඔයා මේ මුකුත් නොදැන කොහොමද සජන්ට උපදෙස් දෙන්නෙ?"

"හොඳයි. ඔයත් මා එක්ක ඉන්නවනම්, මම එයාට කතා කරන්නම්. ලොකු ප්‍රශ්න එඩ්වඩ් ආවහම බලා ගනී. පොඩි ඒවා ගැන අපි බලමු".

"හොඳයි. මං ගිහින් සජන්ව ගේන්නම්"

"පුළුවන් නම් සජන් නෝනවත් ගේන්න. ගමේ අයට ඕන දේ දීලා, නත්තලට ළමයි ටික සතුටු කරන්නත් ඕනෙ".

"හොඳයි ජේන්".

අපි සජන් හමු වී කතා කළෙමු. ඔහු ගෙනාවේ සුබ ආරංචි නම් නොවේ. එඩ්වඩ් ගිය පසු ඔහුගේ උපදෙස් මත ඉතා විශාල මුදල් ප්‍රමාණයක් බැංකු ගිණුම් වලින් ගෙන ඔහුට යවා තිබුණි. ඒ මුදල් වතු යායේ හෝ නිවසේ ප්‍රයෝජනය සඳහා ගත් ඒවා ද නොවේ. මට මෙය නොවැටහේ. එඩ්වඩ්ට මෙතරම් මුදලක් අවශ්‍ය වූයේ ඇයි?

එඩ්වඩ් එන තෙක් සජන් හැකි පමණින් කටයුතු කළමනාකරණය කර ගත යුතු බව අන්තිමේ තීරණය විය. මම සජන් නෝනා සමග කතා කොට ගමට ගොස් දුප්පතුන්ගේ අවශ්‍යතා සොයා බැලීම ගැන තීරණය කර ගත්තෙමි. ඈ කියූ පරිදි දැන් ගමේ තත්වය වඩාත් දරුණු ය. ගම පුරා ම උණ වසංගතයක් පැතිර ඇත. බෙහෙත් ගැනීමට මිනිසුන් ළඟ මුදල් ද නැත. මගේ ම කියා මුදලක් නැති වුවත් එඩ්වඩ් වරින් වර වියදමට දුන් මුදලක් මා ළඟ ඇත. දැනට ඒ මුදල් ප්‍රමාණවත් වේවි.

ගමේ ගෙයින් ගෙට යද්දී මම ත්‍රස්ත වීමි. දිළිඳුකමත් කුසගින්නත් ප්‍රබල ය. රෝගය හා සටන් කිරීමට තරම් මිනිස්සු



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 62

ශක්තිමත් නැත. සජන් නෝනා ගේ විරෝධතාව නොසළකා මම ගෙයින් ගෙට ගියෙමි. එක් ගෙදරක ළමයින් පස් දෙනෙක් මැරෙන්නට වැටී සිටියහ. තවත් ගෙදරක මහලු ස්ත්‍රියක් කුස ගින්නේ ය. තවත් තැනක ළඟදී දරුවකු වැදූ මවක් මරණය අබියස සිටියා ය.

ජොන් වහා ම වෛද්‍යවරයා සොයා ගියේ ය. ඔහු සෑම නිවසකට ම ගොස් ප්‍රතිකාර කිරීමට පොරොන්දු වී තිබුණි. ඉන්පසු ජෝන් මිල්කොට් බලා ගියේ ගම්මුන්ට අවශ්‍ය ආහාර, ඇඳුම් ආදිය රැගෙන ඒමට ය. ඒ අතර මා නිවසට ගොස් විවේක ගත යුතු විය.

ගමේ කාලකණ්ණිකමෙන් මම අධික ලෙස සැළුණෙමි. උණ වසංගතය දුරු වුවත් ගමේ දිළිඳුකම නැති කිරීමට ගත හැකි දීර්ඝ කාලීන පියවර කුමක් ද? ගම්මුන්ට රැකියා අවශ්‍යයි. රෙදි විවීමේ කර්මාන්තය දැන් අඩපණ වී හමාර ය.

වෛද්‍යවරයා ගමට පැමිණි බව ජෝන් මට දැන්වීය. අවශ්‍ය බඩු රැගත් කරත්ත පසුදා ගමට පැමිණෙනු ඇත.

"ඒත් මේ ප්‍රශ්නෙ ලේසියෙන් විසඳන්න බෑ. මිනිස්සුන්ට රස්සාවල් නෑ. ඉස්කෝලයක් නෑ". ජෝන් මතක් කළේ ය.

"කරන්න නම් ගොඩක් දේවල් තියෙනවා. ඒත් මං ගාව සල්ලි ටිකයි තියෙන්නෙ".

"සවලකින් හාරන්න බැරි නම් තේ හැන්දකින් හාරන්න ඕනෑ ජේන්. ටොඩ් මහත්තයවත් හවුල් කර ගන්න පුළුවන්නෙ".

"කියන්න නම් ලේසියි. කරන්න ගියහම තමයි අමාරු".

"නෑ. ටොඩ් නරක මිනිහෙක් නෙවෙයි. එයාට කව්රු හරි මග පෙන්නන්න ඕනෑ. ඔයාට ඒක කරතැකිනෙ. අනික ඔයාට මතකනෙ මාමාගෙන් හම්බ වෙච්ච සල්ලි ටික හතරට බෙදලා අපිටත් දුන්නා?"

"ඔව් ඒක මං සාධාරණ විදිහට බෙදුවා".



"හරි. මායි ඩයනයි මේරියි කොටස් තුනක් ගත්තනෙ. දැන් මං ඔයාට මේක කියන්නම්. ඒවා අපි වියදම් කළේ නෑ. ඔක්කොම බැංකුවෙ දාලයි තියෙන්නෙ. ඔයාට ඕන වෙලාවක පොළියයි සල්ලියි දෙක ම වුණත් ගන්න පුළුවන්.

"නෑ ජෝන්. තෑග්ගක් කියන්නෙ තෑග්ගක්. ආපහු ගන්න දෙන එකක් නෙවෙයි".

"මේ බලන්න ජේන්. මට පූජකයෙක් හැටියට ඇති වෙන්න සල්ලි තියනවා. ඩයනයි මේරියි බැඳලා. එයාලට කරදරයක් නෑ. දැන් ඔයා ගමේ දුප්පත් අයට උදව් කරන්න යනවා. අනික ඇත්තම කියනවනම් සජන් කියන විදියට ඔයාලගෙ බූදලෙන් ගොඩක් නැති වෙලා. අනික මේසන්ලා ඔයාගෙ මහත්තයගෙන් සල්ලි ඉල්ලනවනෙ. ඉතින් මහත්තයට සල්ලි නැති වුණොත් අපි කැමති නෑ ඔයා දුක් විඳිනවා බලන්න".

"එහෙම මුකුත් වෙන එකක් නෑ" මම කීවෙමි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 63

# 25

පසු දින අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැගත් කරත්ත හේ වලට ළඟා විය. ඒවා බෙදා දීම සඳහා සජන් නෝනා ද එහි ගියා ය. සවස් වරුවේ මම ද ගියෙමි. දන් අඩු තරමේ සෑම ගෙදරක ම ලිප ගිනි දල්වේ. මිනිසෙකු අලුත් සවලකින් පොළව කණින අයුරුත් ළමයි රංචුවක් සෙල්ලම් කරන අයුරුත් මගේ දෙනෙතට හසු විය.

මා කෙළින් ම ගියේ දරු ප්‍රසූතියෙන් පසු උණ සෑදී සිටි කාන්තාව ගේ ගෙදරටයි. පැළට ඇතුළු වෙත් ම රෝගී කත අසල තබා ඇති මල් පොකුරක් මගේ නෙත ගැටිණි. උදුන මත සුප් භාජනයක් පැසේ. කාමරයේ මුල්ලක මා හොඳින් දන්නා අඳුනන කළු හැඳි ස්ත්‍රියක් බෝතලයකින් යමක් වක් කරමින් සිටියා ය.

"මිසිස් පූල්! මොකද මෙතන?"

"මෙයාට කව්රු හරි සාත්තු කරන්න ඕනෙ. රෝලන්ඩ් නෝනට ආරංචි වෙලා නෝනා මෙහෙ මිනිස්සුන්ට උදව් කරන බව. ඉතිං මටත් කිව්වා කැමති නම් ගිහින් උදව් කරන්න කියලා. එයා නම් එන්න බයයි. ඒත් සල්ලි දුන්නා. එයා තරුණ කාලෙ එයාගෙ පවුලෙ අයත් පොසත් වුණේ වහල්ලුන්ගෙන්ලු. දන් එයා ඒවට විරුද්ධයි. ඒ වහල්ලුත් මේ මිනිස්සු වගේ අසරණයිලු"

ඇය රෝගියා වෙත ගොස් බීමට යමක් දුන්නා ය.

"ඔලුව උස්සපන් මේරි. මේක බීපන්. බය වෙන්න දෙයක් නෑ. එහා ගෙදර කට්ටිය උඹේ ළමයි බලා ගන්නවා. උඹේ මිනිහා තව කට්ටියක් එක්ක එක්කහු වෙලා පාත්ති හදනවා. මෙන්න රොවෙස්ටර් නෝනා ඇවිල්ලා ඉන්නවා උඹව බලන්න"



"කතා කරන්න මහන්සි වෙන්න එපා. හාන්සි වෙලා විවේක ගන්න". මොන මෝඩ ඉල්ලීමක්ද! නිදා සිටිනු හැර ඇට කළ හැකි කිසිවක් නොවී ය. ඇගේ මුහුණේ මරණය ඇඳී ඇත.

ග්‍රේස් පූල් සහ මම අසාධ්‍ය රෝගී කතක ගේ දෙපස හිඳ ඇයට සාත්තු කරමින් ඇය වෙනුවෙන් ශෝක වෙමින් සිටීම කෙතරම් පුදුමයක්ද? අපි හැකි පමණ අසරණ ස්ත්‍රියට උවටැන් කළෙමු.

ග්‍රේස් පූල් පහත් ස්වරයෙන් කතා කළා ය.

"මං දන්නවා මේක වෙලාව නෙවෙයි කියලා. ඒත්, නෝනට කියන්න දෙයක් තියනවා. නෝනා මෝඩයෙක් නෙවෙයිනෙ. දනටමත් තේරිලා ඇතිනෙ කලින් නෝනා මැරිච්ච එකට මහත්තයාගෙ මොකක් හරි සම්බන්ධයක් තියනව කියලා. එදා බර්තා එක්ක කාමරේ හිර වෙලා හිටියෙ මමයි. ඉතිං මං තරම් හොඳට කව්ද මේක දන්නෙ?"

"මට කියනවද එදා මොකක්ද වුණේ කියලා?"

"මං කියන්නම්. එදා පහළ තට්ටුව ගිනි ගන්නවා කියලා මට තේරිච්ච ගමන් මම කාමරේ යතුර හෙව්වා. හැම තැන ම බැලුවා. ඒත් හම්බ වුණේ නෑ. බර්තා ගාව තිබුණෙත් නෑ. ඒත් දොරේ යතුර දාලා තිබුණෙ. ඒත් යතුර නැතිවෙලා.. එතකොට කව්ද යතුර ගත්තෙ? කව්ද දොරේ යතුරු දැම්මෙ?"

"ගින්න හොඳට ම වැඩිවෙන කොට අපට පැන ගන්න තිබුණ එක ම පාර වහල විතරයි. ඒ පාර මං බර්තාට උදව් කළා ජනේලෙන් පැනලා වහලෙට නගින්න. ඒත් මං පැන ගන්න ඉස්සෙල්ලා ජනේලෙත් ගිනි ගත්තා."

"මං ජීවිතේ ගැන ආසාව අතෑරගත්තා. ඒත් එතකොටම රොවෙස්ටර් මහත්තයා දොර ඇරගෙන ඇතුළට ආවා. එයා අතේ යතුර තිබුණා නෝනා".

මම ගොලු වුණෙමි. රෝගී කත පණ අදින හඬ පසෙකින් ඇසේ. මේ කතාව ඇත්තක් විය නොහැක.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 64

පූල් ගේ හඬ වෙනදාට වඩා සෞම්‍ය විය.

"මම කාමරයෙන් පැනලා ගින්න හරහා දුවලා එළියට පැන ගත්තා. මාවත් ගිනි අරන් තිබුණෙ. රොචෙස්ටර් මහත්තයා නෝනව බේරගන්න වහලෙට නගින්න ඇති. රෝලන්ඩ් නෝනා නම් කියනවා මහත්තයා එයාව බිමට තල්ලු කළා කියලා. ඒත් මට ඒක පිළිගන්න බෑ. මහත්තයා හැදුවෙ ගෙට ගිනි තියලා නෝනව මරන්න නම්, එයා මොකටද ගිනි ගන්න ගේ ඇතුළට ඇවිල්ලා නෝනව බේරගන්න වහලටත් නැග්ගෙ? නෝනා කියන්න පුළුවන් මහත්තයා ආවෙ මාව බේර ගන්න කියලා. ඒත් තමන්ගෙ නෝනව මරන්න ගෙයක් ගිනි තියන්න පුළුවන් මිනිහෙක් තව කෙනෙක් පිච්චිලා මැරෙන එක ගණන් ගනීද?"

"මට නම් හිතෙන්නෙ, මෙතන තව මොකක් හරි තියනවා. ඒක මමත් දන්නෑ. හැබැයි එදා අස්සයගෙ පටි කපලා නෝනවත් මරන්න හැදුවා. නෝනා, අපි දන් ඉන්නෙ පණ අදින ලෙඩෙක් ළඟ. මේ වගේ මරණය පෙනි පෙනී නෝනට බොරු කියන්න මට බෑ. මම දන් නෝනට අවවාද නොකළොත් මට කවදාවත් සැනසීමක් ලැබෙන එකක් නෑ. පුළුවන් ඉක්මනට තෝන්ෆීල්ඩ් අතෑරලා ආරක්‍ෂා ඇති තැනකට යන්න"

රෝශියා කෙඳිරි ගෑවා ය. ඊළඟ මොහොතේ ඇය මෙලොවින් සමු ගත්තා ය. අපි ඇ අසල්වැසියන්ට බාර දී පිටතට ආවෙමු. ග්‍රේස් පූල් මා දිගු කළ අත ගෙන සන්සුන් ලෙස ආචාර කළා ය. අපි වදනකුදු නොදොඩා වෙන් වීමු.

මේ කිසි දෙයක් මම ජෝන්ට නොකීවෙමි. මා ග්‍රේස් පූල් විශ්වාස නොකළත් ඇ කතා කළේ ඍජු විලාසයකිනි. ඇ ඉතා අවංක ලෙස මට තෝන්ෆීල්ඩ් හැරදා යන ලෙස උපදෙස් දුන්නා ය. එහෙත් මෙය මාත් එඩ්වඩුත් වෙන් කිරීමට ඔවුන් ඇටවූ තවත් උගුලක් විය නොහැකිද?

කෙසේ වුවත් මේ ගැන වැඩිදුර සිතීමට මට කාලයක් නොවීය. ඊළඟ සතිය ම ගත වූයේ උණ වසංගතයෙන් පීඩා විඳි ගැමියන්



වෙනුවෙනි. මා ගමට ගියේ කොයි මොහොතේද, ඒ හැම මොහොතක ම ග්‍රේස් පූල් ලෙඩුන්ට සාත්තු කරමින් සිටියා ය. සම්පූර්ණයෙන් ම නොවුණත් පෙරට වඩා මඳක් හෝ ඇය විශ්වාස කිරීමට මම උගත්තෙමි.

මේ සියල්ල සිදු වෙද්දීත් ලන්ඩන් නුවරින් කිසිදු ආරංචියක් නාවේ ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 65

# 26

එඩ්වඩ් ගේ එංගලන්ත ගමන ගැන බිලාන්ච් ගේ විස්තරය දෙස නැවත හැරෙමු.

එඩ්වඩ් බිලාන්ච්ට සෙලින් ගැන කිසිවක් කියා නැත. එහෙත් සෙලින්, ඇඩිලේ සහ එඩ්වඩ් ආපන ශාලාවක එකට සිටිනු වරක් බිලාන්ච් ඇතුළු කණ්ඩායම දක ඇත. ඔවුන් තිදෙනා ඉතා ප්‍රීතියෙන් සල්ලාපයේ යෙදී හුන් සැටිත් සෙලින් ගේ සහ ඇඩිලේ ගේ සුන්දරත්වයත් බිලාන්ච් අතිශයෝක්තියෙන් වර්ණනා කළා ය.

එහෙත් එසමයෙහි තොන්ෆීල්ඩ්හි සිටි මට ජීවිතයේ සුන්දරත්වය අත් විඳීමට මොහොතක හෝ ඉඩක් නොවී ය. නත්තලට තව ඇත්තේ සති දෙකකි. එහෙත් එඩ්වඩ්ගෙන් ආරංචියක්වත් නොලැබුණු බැවින් ඔහු නත්තලට ගෙදර නොඑන බව මම සිතා ගතිමි. අපි කිසි දිනක නත්තලට වෙන්ව සිට නැත. මගේ සිත සොවින් බර විය.

සේන්ට් ජොන් කෙතරම් හොඳින් මා තේරුම් ගත්තේ ද යත්, නත්තලට ඩයනා මේරි සහ ඔවුන්ගේ සැමියන්ට ආරාධනා කළ යුතු යයි යෝජනා කළේ ය. මම එය සතුටින් වැළඳ ගතිමි. නැතහොත් මේ නත්තල මටත් ජොනතන්ටත් පාළු, දුක්බර නත්තලක් වනු ඇත.

ඇරයුම් පත් යවන ලදී. එහෙත් ඉන් දින කීපයකට පසු එඩ්වඩ්ගෙන් ලිපියක් ආවේ ය.

"මගේ ආදරණීය ජේන්,"



මේ පළමු වචන දකිත් ම මගේ හදවත ගැහෙන්නට විය. ඔහුගේ සුපුරුදු ආදරය එයින් ම පළ වේ. මුළු ලිපිය ම ආදර වදන් වලින් පිරී තිබුණි. ඔහු යහළුවන් කණ්ඩායමක් සමග නත්තලට ගෙදර එන බවත්, ගෙදර සාදයක් පැවැත්වීමට කටයුතු පිළියෙල කරන ලෙසත් ඔහු කියා ඇත.

මා ගම්මුන්ට කරන සේවය ලන්ඩනයේ පවා පැතිර ඇති බව ද ඔහු ලියා ඇත. උත්සව කටයුතු මට තනිව සූදානම් කළ නොහැකි නිසා ශ්‍රේස් පූල්ට ආපසු නිවසට එන ලෙස ඔහු දන්වා යවා තිබේ.

ලිපිය කියවූ මම ප්‍රීතියෙන් කැළඹුණෙමි. ඔහු ගේ සුපුරුදු ආදරය හමුවේ මා තුළ වූ සැක, බිය පළා ගියේ ය. මම ප්‍රීතියෙන් ඉල්පෙමින් ජෝන්ට මේ ආරංචිය කීවෙමි.

ජෝන් එයට සතුට පළ කළේ හදවතින් ම නොවන බව මට වැටහිණ.

"මට ඔයා ගැන සතුටුයි ජේන්. දන් ඉතිං නත්තලට මෙහෙ ගොඩක් කට්ටිය ඉඳීනෙ. ඩයනලයි මමයි ඉන්න එක ඔයාට තවත් බරක් වෙනවා. ඒ හින්දා මාත් ඩයනගෙ ගෙදර යන්නම්".

මා කෙතරම් පෙරැත්ත කළත් ඔහු තීරණය වෙනස් නොකළේ ය. ඒ වෙනුවට අලුත් අවුරුද්දේ මා බැලීමට ඒමට ඔහු පොරොන්දු විය.

කෙසේ වුවත් එඩ්වඩ් සමග නත්තල ගත කිරීමට ජෝන් ගේ වැඩි කැමැත්තක් නැති බව පෙනේ. ඔවුන් දෙදෙනා අවසන් වරට වෙන්ව ගියේ ද නෝක්කඩුවෙනි. එඩ්වඩ්ගේ ලිපියේ ද ජෝන් ගැන වචනයක්වත් නැත. මේ සියල්ල සැලකූ මම ජෝන්ට බල නොකළෙමි.

එඩ්වඩ් ගේ පැමිණීම ගැන මා කෙතරම් කැළඹී සිටියේ ද යත්, ජෝන්ට පළ කළ යුතුව තිබූ කෘතඥතාව සහ ආදරය මගෙන් හරි හැටි පළ නොවූ බව දුන් මට සිතේ.

දින දෙකකින් ඔහු පිටත්ව යාමට සැරසී මා අත කඩදාසි බෑගයක් තැබී ය.



UPLOADED BY ELIFE

WWW.EXPRESSLANKA.TK 66

"මෙන්න ඔයාගෙ ඉස්කෝලෙ"

"මේ මොකක්ද?"

හේ හි වූ විශාල හිස් නිවාස දෙකෙන් එකක් බද්දට ගෙන එය පාසලකට ගැලපෙන සේ සකස් කිරීමට අදාළ ලියකියවිලි සියල්ල එහි විය. මගේ නෙතට සතුටු කඳුළක් ඉනුවේ ය. ඔහු ගේ දෙනෙතේ ද කඳුළක් විය.

"මම ගිහින් එන්නම් ජේන්. මතක තියා ගන්න. ඕන වෙලාවක අපි තුන් දෙනා ඉන්නවා ඔයාගෙ උදව්වට"

"ඉක්මනට ආපහු හම්බ වෙමු"

අතට අත දී සමුගත් ඔහු යන්නට ගියේ ය.

පසුගිය දින කීපය ම මා ගත කළේ ජෝන් ගේ ආදරය මධ්‍යයේ යි. දන් මා තනි වී ඇත. එහෙත් කළයුතු වැඩ රාශියකි. වසංගතය සුව වී තිබුණත් තවමත් ගම ගැන බැලිය යුතුය. තෝන්ෆීල්ඩ්හි නත්තල් සාදය සැළසුම් කළ යුතු ය.

ජොන් පිටව ගොස් පැයකින් පමණ ග්‍රේස් පූල් ආවා ය. නිවසට ඇතුළු වීමට මගේ අවසරය ලැබෙන තෙක් බලා සිටි ඈ වෙතින් පළ වූයේ සුපුරුදු ගුප්ත බවයි. පණ අදින රෝගියා අසළ සිටි මොහොතේ හැඟීම් දන් වෙනස් වී ඇත. මම උදාසීන ලෙස ඇය පිළිගෙන නත්තල් සාදයට අවශ්‍ය උපදෙස් දුන්නෙමි.

ඊළඟ සතියේ එඩ්වඩ් ආවේ ය. රියෙන් පැන්න ඔහු මා වෙත දිව විත් අවස්ථාවට නොගැලපෙන තරම් උණුසුමින් මා වැළඳ ගත්තේ ය.

"ජේන්, ජේන්. කොච්චර සතුටක් ද ආපහු ඔයා ළඟට ආපු එක".

ඔහු එසේ කොඳුරත් ම ඔහු ගේ සුපුරුදු ආදරය හොඳින් විද්‍යාමාන විය.

ඊළඟට ආවේ ඇඩ්ලේයි. ඇගේ මුණේ උණුසුමින් තොර සිනාවකි.



"පාටියට ඔක්කොම ලෑස්තිද කුඩම්මෙ?" ඒ ඇගේ පළමු වචනයයි.

"වයසෙ වැරැද්ද" එඩ්වඩ් මට රහසින් කීය. මම සිනාසුණෙමි.

කරත්ත හතරක ආ පිරිස යුද හමුදාවක් බඳු විය. නෝර්ටන් යුවළ, ජාගෝ යුවළ හා ඔවුන් ගේ පුත්‍රයා, ශ්‍රීමත් ජෝර්ජ් ලයින් සහ ඔවුන් ගේ මෙහෙකරුවන් ද පිරිසේ වූහ.

මා නිවස සරසා තිබූ අයුරු කව්රුත් අගය කළහ. ජොනතන් ගෙන්වා සියල්ලන්ට ම හඳුන්වා දෙන ලදී. මේ ප්‍රීතිමත් මොහොතේ, සාමාන්‍යයෙන් ලැජ්ජාශීලී පුද්ගලයෙකු වන මම පවා තරමක් සමාජශීලී වීමි.

සජන් පැමිණ දඩයමේ අසීරු බව කීවත් කිසිවෙක් ඊට සවන් දුන්නේ නැත. ජොනතන්ට ද යාමට අවසර ලැබුණි.

දිවා ආහාරයෙන් පසු මා සමග නිදන කාමරයට වූ එඩ්වඩ්, මා තුරුලු කර ගෙන ඔහු නැති අතරේ වූ දෑ විමසුවේ ය. ඔහු නැති සොවින් මා විඳි වේදනාව හැර සිදු වූ සියල්ල මම ඔහුට කීමි.

අනතුරුව මා ඔහුගේ ලන්ඩන් ජීවිතය ගැන ඇසුවේ සෙලින් ගැන දන ගැනීමේ අභිප්‍රායෙනි. එහෙත් ඒ ගැන කිසිවක් නොකී එඩ්වඩ් ලන්ඩනයේ දී ඇඩ්ලේ ලැබූ ප්‍රසිද්ධියත්, ජාගෝ යුවළ ගේ තරුණ පුතු සහ තවත් බොහෝ දෙනෙක් ඇයට කැමැත්තෙන් සිටින බවත් කීය.

"එහෙනම් එයා ඉක්මනට බඳී?".

"සමහර විට. ඒත් එයාගෙ තත්වෙ හැටියට හොඳ දෑවැද්දක් ඕන වෙයි" ඒ වචන වල බැරෑරුම් බව මට දැණුනත් ඊට යටින් වූ මහත් ශෝකය මට එවෙලේ පෙනුණේ නැත.

"අපි ඉක්මනට පෝසත් වෙයි වස්තුව. ඔයාට කියන්නත් බැරි වුණා. මම මගෙ බිස්නස් කොටස් ජෙසොප්ට විකුණලා ජේනස් කියලා නැවක් ගත්තා. ඒක ආපහු ආවම අපි නිකම්ම



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 67

පෝසත් වෙයි. ඒ වුණාට මගෙ නිහතමානී නෝනට නම් ඒවයින් වැඩක් නෑ කියලා මම දන්නවා.

මා සිප ගත් ඔහු නැගී සිටියේ ය.

"මට පොඩි වැඩ වගයක් තියනවා. මං ඉක්මනට එන්නම්. එතකං හොඳට විවේක ගන්න".

ඉන්පසු උදා වූ දින කිහිපය මම සතුටින් ගත කළෙමි. නුපුරුදු සමාජශීලී ජීවිතය නිසා ඇති වූ වෙහෙස ඒ සතුට තුළ දිය වී මැකී ගියේ ය. ජාගෝ ආදිපාදවරයා මෙන් ම ශ්‍රීමත් ස්ටැන්ලි නෝර්ටන් ගේ බුද්ධිමත් ඇසුර ද මට රුචි විය. ඒ නිසා ම මා මහත්වරුන් සමග ගත කරන කාලය වැඩි යැයි එඩ්වඩ් නිතර විහිළු කළේ ය.

නත්තල ළඟා වත් ම ඇඩ්ලේ සිටියේ ප්‍රීතියෙන් ඉල්පෙමිනි. උසස් සමාජශීලී ජීවිතයට ඈ තදින් ඇළුම් කළා ය.

නත්තල් දා උදේ අපි පල්ලි ගියෙමු. පෙර දින සවස මම ගමට ගොස් දරුවන්ට තෑගි දී ආවෙමි. අප දේවස්ථානය වෙත යද්දී ඔවුන් ප්‍රීතියෙන් සෙල්ලම් කරනු පෙණිනි. අද දවසේවත් සෑම දෙනාට ම බඩ පිරෙන්නට කෑම ලැබෙනු ඇත.

එඩ්වඩ් මගේ ප්‍රීතිය දුටුවේ ය. ඔහු මගේ දණහිසට තට්ටු කරත් ම මට සියුම් ලැජ්ජාවක් ද ඇති විය.

"බලන්න පුතා, ඔයාගෙ මමා තමයි හේ වල ගැලවුම් කාරයා"

"බලාගෙන ඉන්නකො. මං ගාව තව හොඳ සැළැස්මක් තියනවා".

"කොච්චර ත්‍යාගවන්ත නෝනා කෙනෙක් ද මට ලැබිලා තියෙන්නෙ"

මගේ වැඩපිළිවෙල ගැන ඇසූ ජාගෝ ආදිපාදවරයා මගේ සැළසුම් වඩාත් ප්‍රයෝජනවත් ලෙස සකසා ගැනීමට අවශ්‍ය උපදෙස් දී ඇත. මා සිතා සිටි ප්‍රමාණයට වඩා දුරක් යාමට මා පෙළඹවූයේ ද ඔහු ය. මේ මොහොතේ ඔහු මගේ පැත්තට කතා කළේ ය.



"මේවට විරුද්ධ වෙන්න එපා රොචෙස්ටර්. මේවා කෙරෙන්න ඕනැ දේවල්".

අපේ සතුට සාම්චිය අවසන් කරමින් රථය දේවස්ථානය වෙත ළඟා විය. දේවස්ථානය චාම් ලෙස සරසා තිබුණි.

අප හිඳගත් පසු කැරොල් ගීතයක් ඇරඹිණි. අපි ද නැගිට අත්වැල ඇල්ලීමු.

"කව්ද අර රොචෙස්ටර් මහත්තයා දිහා කන්න වගේ බලං ඉන්න නෝනා?" බ්ලාන්ච් මගේ කණට කර ඇසීය.

"මට ජේන් නෑ"

"එයා හොඳට ඇඳල ඉන්නවා. හරි තේජස් ගතියයි"

"එහෙනම් රෝලන්ඩ් නෝනා වෙන්නැති. එයා තමයි එඩ්වඩ් ගැන බොරු කිය කියා ඇවිදින්නෙ"

අප දේවස්ථානයෙන් පිට වන විට රෝලන්ඩ් නෝනා අපේ මග අවුරා සිටියා ය.

"රොචෙස්ටර් මහත්තයා, ඔහේ අද හරි සතුටින් ඉන්නවා වගේ. ඒත් මං පේන කියනවා වගේ කියන්නම්. ඔය සතුට දවසක්වත් තියෙන්නෑ".

ජාගෝ ආර්යාවටත් මේ වචන ඇසී ඇත.

"කව්ද ඒ ගෑණි? මං දක්කා ඇතුළෙදිත් ඔයා දිහාම බලං ඉන්නවා"

"පිස්සු ගෑණියෙක්. මං එයා ගැන බලා ගන්නම්කො. එන්න ජේන්, නගින්න"

කෙසේ වුවත් ආපසු ගමන ප්‍රීතිමක් එකක් නොවී ය. රෝලන්ඩ් නෝනා ගේ ද්වේශ සහගත වදන් වල වූ ජයග්‍රාහී බව මා භීතියෙන් පිරවී ය. සමහර විට ගර්භනී බවත් අධික තෙහෙට්ටුවත් නිසා මා අනවශ්‍ය ලෙස බියපත් වූවා විය හැක.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 68

නත්තල් රාත්‍රී භෝජනය ඉතා විනෝදමත් විය. මා පියානෝව වාදනය කරද්දී සියල්ලෝ එක්ව ගී ගැයූහ. අපි සතුටින් ක්‍රීඩා කළෙමු. සැන්දෑව විනෝදයෙන් ගත කිරීම සඳහා සියලු දෙනා නෝර්ටන්ලාගේ නිවසට යාමට සැරසුණහ. අධික තෙහෙට්ටුවෙන් සිටි මම ගෙදර නවතින්නදැයි එඩ්වඩ්ගෙන් ඇසීමි. ඔහුත් මා සමග නැවතීමට උත්සාහ කළ ද මම එය ප්‍රතික්ෂේප කළෙමි.

"හොඳයි එහෙනම් ඔයා විවේක ගන්න. හෙට උත්සවේට හොඳට ඉන්නත් එපැයි"

කණ්ඩායම පිටත්ව ගිය පසු ජොනතන්ව නිදි කර වූ මම පොත් කියවන්නට වීමි. එහෙත් නිසලතාව වැඩි වේලාවක් නොරැ කුණේ ය. මිසිස් පූල් පැමිණ ලන්ඩන් වල සිට එඩ්වඩ් හමු වීමට අමුත්තෙකු පැමිණ ඇති බව දන්වූවා ය.

"ලන්ඩන්වල ඉඳන් ම ඇවිල්ලද, මේ නත්තල් දවසෙ?"

"ඔව් නෝනා. මහත්තයව ඉක්මනට හම්බ වෙන්න ඕනැලු"

ග්‍රේස් පූල් ගේ මුහුණ බැලූ මට රෝලන්ඩ් නෝනා ගේ ජයග්‍රාහී හිනාව සිහි විය. මේ මිනිසා ගෙනැවිත් ඇත්තේ නරක ආරංචියකි. ග්‍රේස් පූල් එය දනී. මම භීතියට පත් වීමි.

"එයාගෙ නම මොකක්ද?"

"පිලිප්ස්"

"එයාට වාඩි වෙන්න කියන්න"

මා ඔහු වෙත ගියේ මරණ වරෙන්තුව දෙන වෛද්‍යවරයෙකු වෙත යන අයුරිනි.

"මම ග්‍රොවර් සහ සිම්ස් නැව් සමාගමේ ලිපිකාරයෙක්. මගෙ රාජකාරියෙ හැටියට ඉස්සෙල්ලා රොචෙස්ටර් මහත්තයට කතා කරන්න ඕනෑ".

එඩ්වඩ් ගේ නැවට අනතුරක් වෙලාවත්ද? එහෙත් මට මේ මිනිසාගෙන් ප්‍රශ්න කළ නොහැක.



"මහත්තයා එනකම් ඉන්න වෙයි. එයාගෙ කන්තෝරු කාමරේට යන්න. මං කෑම එවන්නම්".

මට එදින දැන ගන්නට නොලැබුණු ඒ පුවත මෙසේ ය. ජැමෙයිකාවේ කිංග්ස්ටන් වරායේ දී ජේනස් නැව මෙසන්වරුන් විසින් ගිනිබත් කොට ඇත. හදිසි කුණාටුවක් නිසා නැව ඒ වරායේ නැවැත්වීමට සිදු වී තිබුණි. ඒ රාත්‍රියේ එඩ්වඩ්ගේ සියලු බලාපොරොත්තු සුණු විසුණු වී ගොස් තිබුණි.

කෙසේ වුවත් මේ ආරංචිය රෝලන්ඩ් නෝනා කලින් දැන සිටි බව පැහැදිලි ය.

මම නොනිදා බලා සිටියෙමි. පිලිප් ගෙනා ආරංචිය අසුබ එකක් නම් එඩ්වඩ් මට ඒ ගැන කීමට පැමිණෙනු ඇත.

රාත්‍රී එකට පමණ පිරිස එන හඬ ඇසිණ. ප්‍රීතිමත් කටහඬවල්, දොරවල් අරින වහන හඬ, අඩි ශබ්ද ඇසී අන්තිමේ සියල්ල නිහඬ විය. පිලිප්ස් සහ එඩ්වඩ් කතාවේ යෙදී ඇත.

ප්‍රධාන ප්‍රවෘත්තිය පැවසීමට කාලය හැර මම කන්තෝරු කාමරයට ගියෙමි. එඩ්වඩ් සහ පිලිප් උදුන අසළ හිඳ සිටිති. කඩදාසි කීපයක් පොළව මත විසිරී ඇත.

"ජේන්! ඔයා මොකටද පහළට ආවෙ?"

"මං කොහෙමද නිදා ගන්නෙ? පිලිප් මහත්තයට නිදා ගන්න තැන කියන්න එපැයි. එඩ්වඩ් ඔයා සුදු මැලි වෙලා. මුකුත් අසනීපයක් ද?"

"හොඳ කම්මුල් පාරක් වැදිච්ච මිනිහෙක් ඉන්න තරම් හොඳින් මං ඉන්නවා. ඔයා අහන්න කලින් මං මේ කියන්නෙ. ප්‍රශ්න අහන්න එපා. මේක පිලිප් මහත්තයගෙයි මගෙයි ප්‍රශ්නයක්".

"මම මුකුත් අහන්නෑ. ඒත් මං ඔයාගෙ නෝනා".

"පිලිප් මහත්තයට කියන්න තියන දෙයක් කියලා යන්න ජේන්. හෙට උත්සවේ. ඔයා විවේක ගන්න ඕනෙ"



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 69

"එඩ්වඩ්....."

"ජේන්! අපට කතා කරන්න තියනවා!"

"හොඳයි එඩ්වඩ්".

පිලිප්ට නිදා ගන්නා තැන කියූ මම පිටව ගියෙමි.

එඩ්වඩ් මා විශ්වාස කොට මගෙන් උදව් ඉල්ලීමට එනු ඇතැයි සිතමින් මම බලා සිටියෙමි. ප්‍රශ්නය කෙතරම් ප්‍රබල එකක්දැයි කුතුහලයෙන් යුතුව මා අන්තිමේ නින්දට වැටුණේ එඩ්වඩ් උදෑසන හෝ මා වෙත එතැයි බලාපොරොත්තුවෙනි. එහෙත් ඒ බලාපොරොත්තුව ගඟට කැපූ ඉණි සේ විය.





**සා**දය පවත්වන දිනය උදා විය. උදේ කාලය වෙන් වී තිබුණේ දඩයමේ යාම සඳහා යි. අශ්වයන් පෙළ ගසා ඇත. නිවසත් වත්තත් මුළුමනින් ම ජනාකීර්ණ විය.

අසුපිට යන ඇඳුමින් සැරසී සැහැල්ලු පෙනුමින් සිටි එඩ්වඩ්ගේ යටි සිතේ ඇති ශෝකය මා හැර කිසිවකු නොදුටු බව මට සහතිකයි. ඔහු සිටින්නේ අසු පිට යාමට තරම් හොඳ මානසික තත්වයක නොවේ. ඔහුට අනතුරක් වෙයිද?

එහෙත් එඩ්වඩ් මා මග හැරියේ ය. පිලිප්ගේ පණිවිඩය ගැන මා අසනවාට ඔහු අකැමති බව පෙනේ.

මා මෙහෙකාරියකට උපදෙස් දෙන අතරේ ගමනට සූදානම් වී මා වෙත පැමිණි පිලිප්ස් මට ස්තුති කළේ ය. එඩ්වඩ් මට මේ රහස නොකියන්නේ නම් පිලිප්ගෙන් හෝ එය දැන ගැනීමට උත්සාහ කළ යුතුය. කෙසේ වුවත් මා ඔහු කන්තෝරු කාමරයට කැඳවා ගෙන ගොස් රහස දැන ගැනීමට කළ උත්සාහය නිරර්ථක විය. ඔහු කීවේ මෙපමණකි.

"නෝනා, හරිනම් මට මේවා කියන්න තහනම්. ඒත් මං මේක විතරක් කියන්නම්. මට පේන විදියට නම් ඔයාගෙ මහත්තයා ඉවරයි. මට කණගාටුයි"

අපි ඉදිරි දොර වෙත එත් ම එඩ්වඩ් ජොනතන්ට කෑ ගසනු මට ඇසිණි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 70

"ඊයෙ මොනව කිව්වත් අද ඔයාට යන්න බෑ. දුන් උඩට ගිහින් ඔය ඇඳුම් මාරු කර ගන්න". ජොනතන් යටිකොල හපාගෙන උඩු මහලට දිව්වේ ය.

පිලිප් නිවසින් පිටත්ව අඩිපාර දිගේ යන්නට විය. ඒ අතරේ එඩ්වඩ් මා අසළට ආවේ ය.

"ජේන්, ඔයා නැව් සමාගමේ ලිපිකාරයා එක්ක සතර කන් මන්ත්‍රණ කරනවට වඩා හොඳ නැද්ද මේ අමුත්තො ගැන බලන එක?"

පිලිප් හැරී නොබැලුවත් මේ කතාව ඇසී ඔහු ගේ උරහිස් සැලෙනු මට පෙණුනි.

"සමාවෙන්න එඩ්වඩ්" මා ගණන් නොගෙන එඩ්වඩ් ගොස් අසු පිටට නැංගේ ය. පිරිස ද කලබලයෙන් සූදානම් වූහ.

මෙතරම් ව්‍යසනයකදීවත් එඩ්වඩ් මා කෙරෙහි විශ්වාසයක් නොතබයි. අනික ඔහු ප්‍රසිද්ධියේ මට තරවටු කළේ ය. ඔහුගේ හැසිරීම මා වේදනාවට පත් කළ බව සැබැවි. ඒත් එය ඔහු ඇසූ නරක ආරංචිය හා සබැඳුනකි. මෙවැනි මානසික තත්වයක් යටතේ ඔහු දඩයමේ යාම ගැන මම යළි යළිත් බිය වීමි.

නළාව පිඹිනු ඇසේ. එඩ්වඩ් ඉදිරියෙන් ම විය. ඔහු පසුපසින් විසි දෙනෙකුගෙන් පමණ යුත් අශ්වාරෝහකයන් පිරිස ගමන් කරන්නට විය. ඔවුන් ටිකෙන් ටික නිවසින් ඈතට යනු බලා සිටි මම බර වූ හදවතින් ආපසු හැරුණෙමි. ජොනතන් මා අසළ ය.

"පපා ඇයි මට එන්න එපා කිව්වෙ? ඊයෙ කිව්වනෙ මටත් යන්න පුළුවන් කියලා".

"අද හිම මිදිලනෙ. අස්සයො පිටේ යන එක භයානකයි. අනික පපා ඉස්සරහම ඉන්න හින්දා ඔයාව බලා ගන්න අමාරුයි"

"මං හිතන්නෙ පපාට කේන්ති ගිහින්"

"මිනිස්සුන්ට සමහර වෙලාවට කියා ගන්න බැරි විදිහෙ හැඟීම් ඇති වෙනවා".



මා සමග නිවසේ ඉතිරි වූයේ ඇඩිලේ, ජාගෝ ආර්යාව, වෛද්‍යවරයා සහ ඔහුගේ බිරිඳ පමණි. දිවා ආහාරයෙන් පසු වෛද්‍යවරයා මා පසෙකට කැඳවී ය.

"රොචෙස්ටර් නෝනා. ඔයාට හරියට මහන්සි පාටයි. මට පොරොන්දු වෙනවද බබා ලැබෙන කම් ඔච්චර මහන්සි වෙන්නෑ කියලා?" මම පොරොන්දු වීමි. එහෙත් ඔහු සෑහීමකට පත් නොවේ.

"ඔයා පොරොන්දු වෙනවද කිසි ම ප්‍රශ්නයක් ඔලුවට ගන්නැතුව ඉන්නවා කියලා?"

"මං කොහොමද එහෙම පොරොන්දු වෙන්නෙ?"

"හොඳයි රොචෙස්ටර් නෝනා, ඒත් උත්සාහ කරන්න තවත් අලුත් ජීවිතයක් ඒ මත තීරණය වෙනවා"

සවස් කාලය දිගු විය. ඇඩිලේ නොඉවසිල්ලෙන් එහාට මෙහාට ඇවිදිමින් අඬා නිකුත් කරමින් සිටියා ය. මම ඇය ඉවසා සිටියෙමි.

කෙමෙන් බිම් කළුවර වැටිණි. පියානෝව වයමින් සිටි මට ඈත කඳුකරය දෙසින් නළා ශබ්දයක් ඇසිණි. කඳු බහුල ඒ පෙදෙසේ බෙහෙවින් හිම මිදී ඇත. මා තවත් බලා ඉන්නේ කෙසේද?

"මම යනවා දඩයම බලන්න"

වෛද්‍යවරයා මා දෙස විපරමින් බැලුවේ ය.

"මට තනියම යන්න පුළුවන්. මිනිත්තු දහයෙන් එනවා. මං යන්නෙ ඔලුව පොඩ්ඩක් සැහැල්ලු කර ගන්න".

වත්ත දෙසට යත් ම ඈත කන්ද මුදුනේ දඩයම් කණ්ඩායම දිස්විය. එඩ්වඩ් ගේ අසු ඉදිරියෙන් ම! කළුවර වැටී ඇති නිසා දුන් එඩ්වඩ් දඩයම අවසන් කරනු ඇත.

ඔවුන් කඳු මුදුන දිගේ යත් ම මම ඔවුන්ට සමාන්තරව පහළින් ගමන් කළෙමි. මේ නිසා මම ඉබේම තෝන් කැළය වෙත



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 71

යැවුණි. කළුවර අහසේ තරු එක දෙක බැබළේ. නළා හඬට කන් දෙමින් මම ඉදිරියට ඇදුණෙමි. දන් තදින් කළුවර වැටී ඇත. මා හිතුවාට වඩා වෙලා මෙහි බලා සිටියෙමි.

මා ගස් පෙළක් අතරින් යත් ම කාගේදෝ උස් රූපකායක් මා දෙසට එනු පෙණිනි. ඒ රුව මා දෙසට එත් ම මට සහේතුක බියක් දැණිනා. මොහොතකින් ඒ පුද්ගලයාගේ අතක් අසව්ණි. මිට මොළවාගත් අතේ වානේ වැනි යමක් දිලිසේ. ඊළඟ මොහොතේ, කිසිවක් සිතා ගැනීමටත් පෙර මා ඒ පුද්ගලයාගේ ප්‍රහාරයට ලක් වෙමින් සිටියෙමි.

ශක්තිමත් අතකට මගේ උරහිස හසු විය. ප්‍රහාරකයා හිසත් මුහුණත් වසාගෙන සිටිනු මම යන්තමින් දුටුවෙමි. එක්වර ම මගේ හිසට ඉහළින් පිහිය එසව්ණි. මම පැත්තකට ඇළ වෙත් ම ප්‍රහාරකයාගේ සමබරතාව බිඳී ගිය බව මට දැණිනි. ඊළඟ මොහොතේ ඔහු හෝ ඇයගෙන් මිදුණු මම පාර දෙසට දිව ගියෙමි.

මර බියෙන් ත්‍රස්ත වී මම වැටි වැටී දිව්වෙමි. ප්‍රහාරකයා මා පසු පස එනවා ඇති. මගේ ම හතිලන ශබ්දයෙන් මගේ සවන් පිරී ගියේ ය.

තාප්පය අසළට ආ මම එයට වාරු වීමි. දන් ප්‍රහාරකයා ගේ අඩි ශබ්දයක්වත් නැත. ඒ වෙනුවට මා පසුකරමින් යන දඩයම් පිරිසගේ හඬ ඇසුණි. එහෙත් මට කෑ ගැසීමටවත් ශක්තියක් නැත. දඩයම්කරුවන් ගිය විගස නැවත ප්‍රහාරකයා මා වෙත එනු ඇත. එහෙයින් මම තාප්පයට මුවා වෙමින් ඉදිරියට ගොස් පාරට බැස්සෙමි. හදිසි ප්‍රහාරයත් සීතලත් නිසා වෙව්ලමින් මම ගේ දෙසට ගාටන්නට වීමි. දඩයමේ ගිය පිරිස අසුන් පිටින් බසිමින් ගෙට යමින් සිටිති. ආලෝකය, ශබ්දය සහ ක්‍රියාශීලී බව නිවස දෙසින් දොරේ ගලයි.

කිසිවකුට නොපෙණෙන ලෙස කාමරයට රිංගා ගත් මම ඇඳට වැටුණෙමි. කාමරයේ එක් ලාම්පුවක් පමණක් දල්වේ. නිවස තුළ සාදයට අවශ්‍ය සියල්ල පිළියෙල වන හඬ මට ඇසේ.



මට තවමත් සිදු වූ දෙය සිතා ගත නොහැක. මගේ සැමියාගේ ම වත්තේ දී කව්රු හෝ මට පහර දුන්නේ ය. ප්‍රහාරකයා කව්දැයි මා නොදනිතත්, මීට පෙර ද මා මැරීමට කව්රුන් හෝ සැළසුම් කළ බව මට සිහි විය. මට සතුරන් නැතැයි සිතා සිටියත් එක් සතුරකු සිටින බව පිළිගැනීමට දන් මට සිදුව ඇත.

කව්දෝ දොරට ගසයි.

"එන්න ඇතුළට"

ග්‍රේස් පූල් ඇතුළු වූවා ය.

"රොචෙස්ටර් නෝනා, නෝනා සනීපෙන්ද? මුකුත් ප්‍රශ්නයක්ද?" මේ වෙලාවේ මා කෙසේ ඇය විශ්වාස කරන්නද?

"උදුන හදන්නද?"

"කැමැත්තක්".

ඇ කාමරයේ එහාට මෙහාට යමින් උදුන සහ ලාම්පු දල්වන්නට වූවා ය. මම ඇ දෙස නොබලා සිටියෙමි.

"මම සැරයකුත් නෝනට අවවාද කළා. මේ ගෙදර නෝනට ආරක්ෂාවක් නෑ. මං ආයිත් කියනවා. නෝනා වහා ම යන්න ඕනැ. කොහේ හරි කමක් නෑ, දන්ම යන්න".

දරුණු ලෙස එසේ කී ඇ පිටව ගියා ය.

මම කල්පනාවට වැටුණෙමි. අඩු තරමේ දරුවා ලැබෙන තෙක්වත් මා නිවසින් පිට වී සිටිය යුතුය. එඩ්වඩ්ට කතා කොට අවසර ඉල්ලා ගත හැක. මා මැරීමට කව්රු හෝ දෙවරක් තැත් කර ඇත. මේ නිවස තුළ කිසියම් අබිරහසක් ඇත. පසුදා උදෙන් ම ඩයනාගේ ගෙදරට ගොස් දරුවා ලැබෙන තෙක් එහි නිදහසේ ගත කිරීමට මම තීරණය කළෙමි.

මේ තීරණය මා තුළ වූ කිසියම් බලයක් විසින් කෙරුණු අණ දීමක් බඳු විය. මේ නිවසේ ඇති අබිරහස් ගුප්ත බව මට තවත් දරා ගත නොහැක. මේ සටන මට බර වැඩියි. "ඉක්මනට මෙතනින් පලයන්" මා තුළ වූ බලවේගය මට අණ කළේ ය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 72

සේවිකාවක් පැමිණ මා දුන් ම ඇඳගන්නේදැයි ඇසුවා ය. ඔව් මා ඇඳ ගත යුතු ය. සාදය අවසන් වූ පසු එඩ්වඩ්ට සියල්ල පවසා පිටව යා හැකි ය. සේවිකාවට විනාඩි දහයකින් එන ලෙස අණ කොට, මම මුහුණ සෝදා ඇඳ පැළඳ ගැනීමට පෙර ගෙන යා යුතු කළමනා සූදානම් කර ගතිමි. අනතුරුව සේවිකාව මට ඇඳ ගැනීමට උදව් වූවා ය. මගේ ගමන් මල්ල දුටු ඇගේ ඇස් උඩ ගියත් ඈ කිසිවක් නෑසුවා ය.

මම කණ්ණාඩිය ඉදිරිපස හිඳ සිටිමි. සේවිකාව මැණික් මාලයක් ගෙන මගේ ගෙලේ බඳින්නට සැරසෙත් ම එඩ්වඩ් ආවේ ය. ඔහු ලස්සනට සැරසී සිටී. මම ප්‍රහාරය ගැන කීමට යත් ම මගේ ගමන් මල්ල දුටු එඩ්වඩ් කළු වී ගියේ ය.

ඔහු සේවිකාව පිටතට යවා මා වෙත ආවේ ය.

"ජේන්, ඔයා මාව දාලා යනවද?"

"මට යන්න වෙලා තියනවා. මෙහෙ හරි ම භයානක දේවල් වෙන්නේ. ඔයාට ආදරේ නැති හින්දා යනවා නෙවෙයි. මේ ගේ මහ නපුරු තැනක්. මට මගෙයි දරුවගෙයි ජීවිත ගැන බයයි. මං යන්න ම ඕනෑ එඩ්වඩ්".

"පුදුමයි! ඔයාට මාව දාල යන්න පුළුවන්ද? මගෙන් අහන්නෙවත් නැතුව?"

"ඔයා අකැමති නැනෙ. මං ටික දවසකට ඩයනගෙ ගෙදර යනවා. අනික ඔයා ඇහුවෙවත් නැනෙ ඇයි මං යන්නෙ කියලා. මට හොඳ හේතු තියනවා. හිතනව ද මං ලේසියෙන් ඔයාව දාලා යයි කියලා? ඔයා මට මගේ ජීවිතේ තරම් ම වටිනවා"

"එහෙනම් ඇයි යන්නෙ?"

මම සියල්ල විස්තර කළෙමි.

"මට නම් අදහන්නත් බෑ! කවිද මේක කළේ?"

"කළුවරේ මට අඳුනගන්න බැරි වුණා"



එහෙත් මා පුදුමයට පත් කරමින් ඔහු මා සැක කළේ ය.

"ඔයාට හොඳට ම විශ්වාස ද ජේන්? ඔයා කළුවරේ කෝන් අත්තකවත් පැටලිලා බය වුණා ද?"

මම බෙරිහන් දුන්නෙමි.

"එඩ්වඩ් ඔයා මාව විශ්වාස කරන්න ඕනෑ. දැන් දෙපාරක් කව්රු හරි මාව මරන්න හැදුවා. ජේන්නැද්ද මට මේ ගේ කොච්චර වදයක් ද කියලා? තවත් මෙතන හිටියොත් මායි දරුවයි ජීවත් වෙන එකක් නෑ"

"මට මෙච්චර ලොකු කරදරයක් වෙලා තියෙද්දි මේක තවත් පාහරක්".

"මොකක්ද ඒ? ඔයා මට කියන්නැනෙ. ඔයා කියන්නැත්නම් මං කොහොමද උදව් කරන්නෙ? කොහොමද ඔයාව සනසන්නෙ? මොකක්ද ප්‍රශ්නෙ එඩ්වඩ්?"

"මගෙ බරත් ඔයාට පටවන එක මනුස්ස කමක් නොවෙයි. ඒත් මට ඕනෑ මං ඒවා දරා ගන්න අතරෙ ඔයා මා ළඟින් ම ඉන්න. මිනිහෙක් තමන්ගෙ බිරිඳගෙන් ඒ වගේ දෙයක් බලාපොරොත්තු වෙන එක අසාධාරණද?"

"අනේ එඩ්වඩ්, මට හරි බයයි"

"ඔයා හිතනවද මට ඔයාව පරිස්සම් කරන්න බෑ කියලා?"

"නෑ, නෑ, ඒත් ඔයා හැම තිස්සෙ ම මා ළඟ නැනෙ"

"අදින් පස්සෙ මං ඔයා ළඟ ම ඉන්නවා. මීට පස්සෙ අතුරුදහන් වෙන්නෑ. ඉතින් ජේන්, හොඳ ළමයනෙ. දැන් අපේ අමුත්තො එනවා. මේ අහන්න, සමහර වෙලාවට ඔයාගෙ මනසේ වෙනස් කම් වෙන්නත් පුළුවන්. ඔයාගෙ තත්වෙ ඉන්න අයට එහෙම වෙනවා. කොහොම වුණත් බය වෙන්න දෙයක් නෑ. මං ඔයා ළඟ ම ඉඳන් ඔයාව බලා ගන්නවා. ඔයාට මුකුත් වෙන්නෑ. හැබැයි ඔයාට මාව දාලා යන්න බෑ. ඔයා නැතුව මම පිස්සු වැටෙයි".



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 73

"හ්ම්, දැන් ඉතිං මේක දා ගන්න" මාලය ගෙන මගේ කරේ බැඳි ඔහු මා නැගිටුවී ය.

"ඔයා නැතුව මං කොහොමද ජීවත් වෙන්නෙ? ඔයා ඉන්න ම ඕනැ ජේන්" මා සිප සැනසූ ඔහු මගේ අත ගෙන පඩිපෙළ බසින්නට විය. ශාලාව පුරා සිටි සියලු අමුත්තෝ තොන්ෆීල්ඩ් ස්වාමියා සහ ස්වාමි දුව එන දෙස ප්‍රීතියෙන් බලා සිටියහ.

ප්‍රහාරයේ කම්පනයෙන් නොමිදුණත් එඩ්වඩ් ගේ ශක්තිමත් බව හමුවේ තොන්ෆීල්ඩ් වලින් පිට වීමේ තීරණය දුර්වල විය. කෙසේ වුවත් ප්‍රහාරය හිතළුවක් නොව සැබෑවක් බව මම දනිමි. එඩ්වඩ් රොචෙස්ටර් වැනි අහංකාර මිනිසකු, තමන් මෙතරම් ආදරය කරන වස්තුවකට කිසිවකු අත තබනු ඇතැයි විශ්වාස නොකරයි.

අප දෙදෙනා ශාලාව වෙත යත් ම තවත් යුවළ විස්සක් පමණ අපට එක් වූහ. සංගීතය ගලා ආවේ ය. නැටුම ඇරඹිණ.

කෑම වෙලාව ළං වත් ම මා වෙහෙස වී සිටි බව දුටු ජෝර්ජ් ලයින් මා කැඳවා ගෙන ගොස් කෑම ගැනීමට සැළැස්වී ය. මගේ ආගන්තුක සත්කාරයත් නිවස සරසා ඇති අයුරුත් ඔහු ගේ ප්‍රශංසාවට ලක් විය. එහෙත් මා ඔහුට සවන් දුන්නේ යන්තමිනි. ප්‍රහාරයත්, පිලිප්ගේ වචනත් මට එක්වර සිහි විය. සත්‍ය ඇත්තේ මේ ප්‍රීතිය දොරේ ගලා යන සාදය තුළ ද? එසේත් නැත්නම් අස්වාභාවික මරණයක් සහ ඒ හා සම්බන්ධ සිදුවීම් මාලාවක් මතද? ජෝර්ජ් ලයින් කතා කරන අතරේ, එඩ්වඩ් හා කතා කොට මේ සියල්ල විසඳා ගත යුතු යයි මම තීරණය කළෙමි. මගේ සිත මං මුළා වූවාක් බඳු ය.

මා එඩ්වඩ් වෙත ගෙන යන ලෙස ජෝර්ජ් ට කීමි. අප යන විට නැටුමක් ඇරඹී තිබුණි. ඇඩිලේ සහ එඩ්වඩ් සුන්දර ලෙස නටමින් සිටින අතරේ බ්ලාන්ච් සහ ජාගෝ ආර්යාව අතිනත් ගෙන මා අසළින් යන්නට ආහ. නැටුම දෙස බලා සිටි ඔවුහු මා හෝ සර් ජෝර්ජ් දුටුවේ නැත.



"රොචෙස්ටරුයි ඇඩිලේයි ලස්සන ජෝඩුව නේද? ඔයාගෙ පුතාට පරිස්සම් වෙන්න වෙයි. ජේනුත් අසනීපෙන් ඉන්නෙ. ළමයි හම්බ වෙන එකත් ලේසි නැනෙ. අවාසනාවට හරි එයා මැරුණොත් රොචෙස්ටර්ට ඇඩිලේව බඳින්න කිසි ම බාධාවක් නැනෙ. ඇඩිලේ එයාගෙ දුවත් නෙවෙයිනෙ. අනික ඇඩිලේ එඩ්වඩ්ට හරිම ආදරෙයි"

"මම නම් හිතන්නෙ ඕනැවට වඩා ආදරෙයි" ජාගෝ ආර්යාව පිළිතුරු දුන්නා ය.

කෙසේ වුවත් සිහිනෙන් මෙන් සිටි මට මේ වචන තදබල පහරක් නොවී ය. බ්ලාන්ච් එය කීවේ හුදෙක් කම්මැලිකම නැති කර ගැනීම සඳහා බව ද මට වැටහිණ.

සර් ජෝර්ජ් ට මෙය ඇසුණු බවක් නොපෙනේ.

"රොචෙස්ටර් නෝනා, ඔයා සනීපෙන් ද?"

"මට ටිකක් මහන්සියි. මං කන්තෝරු කාමරේට ගිහින් ටිකක් ඉඳගෙන ඉන්නම්"මට ඇවැසි වූයේ තනි වීමටයි.

ශාලාවෙන් පිට වත් ම ග්‍රෙස් පූල් අප වෙත ආවා ය.

"මිසිස් පූල් මාව බලා ගනී. සර් ජෝර්ජ්, ඔයා ගිහින් ටිකක් නටන්න".

ග්‍රෙස් පූල් මා පුස්තකාලයේ ඉන්දවූවා ය. මම පැය භාගයක් පමණ කල්පනාවේ නිමග්නව ඉන්නට ඇත. මා මේ නිවස අතහැර යා යුතු ය. එහෙත් එඩ්වඩ්ව දමා යන්නේ කෙසේද?

එක් වර ම සංගීතය පරයමින් මහා ඝෝෂාවක් ඇසිණි. සංගීතය නැවතිණි. ගැහැණු විලාප තියනු ඇසිණි. ඒ සමඟ ම මට දුම් ගඳක් දැණිනි.



UPLOADED BY ELIFE

WWW.EXPRESSLANKA.TK 74

# 28

මා සිතූ දෙය ම සිදු විය. කන්තෝරු කාමරයේ දොර ඇරගෙන මා එළියට එත් ම විශාල ගාලගෝට්ටියක් ඇසුණි. සාලය දුමින් පිරී ඇත. විවර වූ ඉදිරි දොරටුවෙන් ගැහැණු මිනිස්සු පිටතට දුවති. උඩ තට්ටුව හා පඩිපෙළ ගින්නෙන් වැසී ඇත.

මම දුම අතරින් දිව ගොස් මිදුලට පැන්නෙමි. ග්‍රේස් පූල් ජොනතන් ගේ අතින් අල්ලාගෙන සිටියා ය. ඇගේ දෑස් ගින්නෙන් දැවෙන උඩු මහල වෙත එල්ල වී ඇත. මා ජොනතන් වෙත නැවී ඔහු සනසත්ම මට ඇගේ වදන් ඇසිණ.

"එහෙනම් ඒක සිද්ධ වුණා"

පිරිමි පේළියට සිටගෙන ගින්නට වතුර දමන්නට වූහ. සර් ජෝර්ජ් අප ගණන් කරමින් සියලු දෙනා සිටින්නේ දැයි බලයි. එක් වර ම මට හල් ජාගෝ ගේ විලාපය ඇසුණි.

"ඇඩිලේ! කෝ ඇඩිලේ?"

ජොනතන් සේවිකාවකට බාර දුන් මම එඩ්වඩ් වෙතට දිව්වෙමි. වතුර කොතරම් දැම්මත් ගින්න තවමත් දල්වේ.

"එයා තාම ඇතුළෙ වෙන්නැති. අනේ දෙවියනේ! මම යනවා ඇතුළට"

"අනේ එපා එඩ්වඩ්. ඔක්කොම ගිනි ගන්නවා"

"මං වෙන මොනවා කරන්නද?"



එවිට ම විවර වූ දොරින් මට ඇඩිලේ පෙණුනි. සම්පූර්ණයෙන් ම ගිනි දලු වලින් වැසී පඩිපෙළ දිගේ මගක් පැමිණි ඇ මර ළතෝනි දුන්නා ය.

එඩ්වඩ් ගින්නෙන් දැවෙන නිවස තුළට දිව්වේ ය. ගිනි දලු අතරින් පඩිපෙළ නැගි ඔහු ඇඩිලේ කරට ගෙන පහළට ආවේ ය. මම ද ගිනි දලු අතරට දිව්වෙමි. පඩිපෙළ පාමුල දී එඩ්වඩ් ඇ බිමින් තැබුවා ය. අපි එක් වී ඇ පිටතට ඇද ගතිමු. ජාගෝ ආදිපාදවරයා ඔහුගේ කබායෙන් ඇඩිලේ වැසුවේ ගින්න නිවීමටය.

අප ඇ වෙත නැවෙත් ම ඇගේ පිළිස්සී මිට මෙළවුණු අතේ තිබී මට හමු වූයේ යතුරකි. එය පරණ කළු ගැසුණු යතුරකි.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 75

# 29

**මෙ**ලෙස මම මගේ කතාවේ අවසානය කරා ළඟා වී සිටිමි. මා මුලින් කියූ පරිදි මා හිඳ සිටින්නේ තෝන්ෆීල්ඩ් නිවසේ මගේ කාමරයේ ජනේලය අසලයි. මගේ පුංචි දියණිය මා අසළ තොටිල්ලේ සැපට නිදි. ඇගේ රන්වන් මුහුණත් හිස කෙසුත් දකින මම විස්මිත වෙමි. අඳුරු පැහැ මටත් එඩ්වඩ්ටත් මෙවන් රන්වන් දරුවන් ලැබෙතියි කෙසේ සිතන්නද? කලක් තිස්සේ අපේ ජීවිත වල පැවති දුක් වේදනා නිවා සැනසීමට මෙන් මේ සිඟිති දියණිය අප වෙත ආවා ය.

අප මෙහි ආවේ ඇය නැතිව ය. එහෙත් දැන් අප ආපසු යන්නේ ඇයත් සමගයි. අප දුප්පත්ව ඇති නිසා තෝන්ෆීල්ඩ් නිවස කුළියට දීමට සිදුව ඇත. අපි ආපසු ෆර්න්ඩීන් වෙත යන්නෙමු.

අප යාමට පෙර තෝන්ෆීල්ඩ්හි දී සිදු වූ දුක්ඛර කතා පුවත සම්පූර්ණ කළ යුතු ය.

අසරණ ඇඩිලේ දැන් ජීවතුන් අතර නැත. ගින්නෙන් දැවී තදබල වේදනා විඳිමින් ඈ ජීවත් වූයේ සතියක් පමණි.

ගින්නෙන් පසු මම ටොඩ් මහතාගේ නිවසට ගෙනයනු ලැබීමි. එහි සති කීපයක් විවේකයෙන් ගත කරමින් මාස ගණනක් තිස්සේ ක්ෂය වූ ශක්තිය නැවත ලබා ගැනීමට මට සිදු විය. මුල් දින වල එඩ්වඩ් නිතර ම මා ළඟ සිටියේ ය. ඔහු වෙන්ව ගියා නම් ඒ ඕල්ඩ් හවුස් හි ග්‍රේස් පූල් ගේ ප්‍රතිකාර ලබමින් සිටි ඇඩිලේ බැලීමට පමණි.



මා සිටි නිවස අසළ ම රෝලන්ඩ් නෝනා ඇඩිලේ නවතා ගැනීම එක් අතකට පුදුමයට කරුණකි. එය මට වේදනාකාරීදැයි එඩ්වඩ් වරක් මගෙන් ඇසී ය. එහෙත් රෝලන්ඩ් නෝනා ඇඩිලේ නවතා ගෙන ඇත්තේ සෙලින්ට තිබූ හිතවත්කම නිසා ය. මම මෙවේලේ ඇඩිලේට කාරුණික වීමි. ඈ වැඩිකල් ජීවත් නොවන බව අපි දැන සිටියෙමු.

"පරණ වෛර හැමදාම එක විදියට තියෙන් නෑනෙ. ඔයා තාම අසනීපෙන් නිසා ඔයාට කියන්න බැරි ගොඩක් ප්‍රශ්න තියෙනවා".

"මං දන්නවා අබිරහසක් තියන බව".

මම එයින් නිහඬ වීමි. මට සනීප වනතුරු නොව එඩ්වඩ් මා ගැන විශ්වාසය ඇති කර ගන්නා තුරු මා බලා සිටිය යුතුය. එහෙත් ඇඩිලේ මෙලොවින් සමුගත් ඒ මොහොත ප්‍රශ්න කිරීමට සුදුසු වෙලාව නොවේ.

ඇඩිලේ මිය ගිය රාත්‍රියේ මා දුටු දෙය තවමත් මා හැර කිසිවෙක් නොදනී. අස් රියක රෝද වල හඬ ඇසුණු නිසා මම ජනේලය අසළට ගොස් පිටත බැලීමි. හිසේ සිට කබායකින් වසා ගත් උස් කාන්තාවක් කරත්තයෙන් බසිනුත් රෝලන්ඩ් නෝනා ඈ වෙත දිව එනුත් සඳ එළියෙන් මට පෙණිනි. ආගන්තුක කාන්තාවගේ හිස් ආවරණය පහතට වැටුණි. ජීවිතයේ ප්‍රථම හා අවසන් වතාවට මම සෙලින් වැරන්ස් ගේ සුන්දර රුව ජීවමානව දුටුවෙමි.

රෝලන්ඩ් නෝනා ඇගේ අත ගෙන ගෙට කැඳවා ගෙන ගියා ය. සෙලින් ගැන මසිත පැවති හැඟීම් කුමක් වුවත් මෙවේලේ ඈ තුළ වූ දරු කැක්කුම මවක් වශයෙන් මට වටහා ගැනීම අපහසු නොවී ය. මා නින්දට ගියේ පාන්දර ඇය පිටව යන තෙක් අවදිව සිටීමෙන් පසුවයි.

ඇඩිලේ මිය ගිය බව උදෑසන එඩ්වඩ් මට කීවේ ය. රාත්‍රියේ ආ අමුත්තා ගැන කිසිවක් නොකීමට මම පරිස්සම් වීමි. මා කළ යුතු වන්නේ එඩ්වඩ් සැනසීමයි. ඔහුගේ ශෝකය දැඩි වුවත් ඇඩිලේ

UPLOADED BY ELIFE



WWW.EXPRESSLANKA.TK 76

මිය යාම වඩා හොඳ බව ඔහු කීය. ඔහු අදහස් කළේ ඇගේ පිළිස්සුම් තුවාල ගැනයි.

මා මවිත කරමින් එදා ම සේන්ට් ජෝන් ආවේ ය. එඩ්වඩ් සමග බොහෝ වේලා සාකච්ඡා කොට ඔහු මා වෙත ආවේ ය. ඒ අතර එඩ්වඩ් ඇඩිලේ ගේ අවමගුල් කටයුතු සූදානම් කරමින් සිටියේ ය. එඩ්වඩ් හා කතා කොට තීරණය කර ගත් පරිදි ජෝන් පැමිණ සිටියේ මා නොදන සිටි කතාවක් කීමටයි.

"මම කියන්න යන්නෙ ජේනස් ගැන. රෝලන්ඩ් නෝනා ඇවිල්ලා සල්ලි ඉල්ලලා කරදර කරන්න ගත්තහම එඩ්වඩ් හිතලා තියනවා ඉල්ලන ගාණක් දීල එයාව පිටත් කරන්න. ඒ සල්ලි ටික හොයා ගන්න තමයි මේ නැව් වැඩේට බැහැලා තියෙන්නෙ".

මැන්චෙස්ටර්හි ව්‍යාපාරික කොටස් විකුණා ඒ මුදල් වලින් ජේනස් නැවට බඩු පුරවා බටහිර ඉන්දීය දූපත් වලට යැවීම සිදු විය. ඔහු ඒ කාලය තුළ කෙතරම් පීඩනයෙන් සිටියත් මගේ රෝගී බව හා වෛද්‍ය උපදෙස් නිසා මේ කිසිවක් මට කියා නැත. ජෝන් මේ කතාව කියාගෙන යද්දී ඔහු එඩ්වඩ් ගේ චරිතය කෙතරම් හොඳින් වටහාගෙන ඇත්දැයි මට වැටහිණි.

"එතකොට නැවට මොකද වුණේ?"

මා අසත් ම කළු ඇඳුමින් සැරසුණු එඩ්වඩ් කාමරයට ආවේ ය.

"එහෙනම් ඔයා කතාවෙ ඉතුරු ටික කියනවද?"

"ස්තූතියි රිවර්ස්, මං වෙනුවෙන් කතාව පටන් ගත්තට. තව පොඩි උදව්වක් ඉල්ලන්න තියනවා. අපි හෙට ඇඩිලෙව වළලනවා. ඔයාට පුළුවන්ද පූජාව කරන්න?"

ඔහු ඊට කැමැත්ත පළ කරමින් පිටව ගියේ ය. දිවා ආහාරයෙන් පසු එඩ්වඩ් කතාවේ ඉතුරු කොටස කියන්නට විය.

"ජෝන් කියන්නැතිනෙ මුල ටික. ඉතිං මගෙ බිස්නස් එකේ කොටසුත් විකුණලා, වත්තෙ සල්ලිත් අරන් තමයි නැව ගත්තෙ. ඒ කියන්නෙ නැවේ සාර්ථකත්වය උඩ තමයි ඔක්කොම රැඳුනෙ. නැව



පිටත්වෙන්න කලින් මම කැප්ටන්ට කිව්වා ජැමෙයිකාවෙ කිංග්ස්ටන් වල නවත්තන්න එපා කියලා. මං බය වුණා මේසන්ලගෙන් කරදර වෙයි කියලා. අන්තිමේ ඇත්තට ම එහෙම වුණා ජේන්".

නැව කිංග්ස්ටන් හි නැවැත්වීමට සිදු වූ හැටිත් මේසන්වරු එය ගිනි තබා විනාශ කළ හැටිත් ඔහු විස්තර කළේ ය.

"මට ඕනෑ වුණේ රෝලන්ඩ් නෝනාට සල්ලි දීලා යවන්න. එතකොට එයා ඔයාට කරදර කරන්නැනෙ. අනික රොචෙස්ටර්ලගෙ නම කැත වුණොත් පුතාටත් හොඳ නැනෙ. එත් එයාලට ම සල්ලි දෙන්න යවපු නැව එයාලම විනාශ කළා".

"අපි තාම නැත්තට ම නැති වෙලා නැනෙ"

"ඔව්, ඒත් තෝන්ෆීල්ඩ් කුළියට දෙන්න වෙනවා. ඔයා ඒකට අකමැති ද ජේන්?"

"අපි දෙන්නා එකට ඉන්නවනම් මම ඔය එකක්වත් ගණන් ගන් නෑ"

මේ සිදුවීම් නිසා එඩ්වඩ් දැඩි පීඩනයෙන් සිටීම පුදුමයක් නොවේ. එහෙත් තවත් කිසියම් බරක් ඔහු මත ඇති බව මට වැටහිණි. තෝන්ෆීල්ඩ් වෙත ගොස් සිදු වී ඇති විනාශය ඇස්තමේන්තු කරමුදැයි මා ඇසුවේ ඒ රහස දැන ගන්නා අටියෙනි.

"ඉස්සෙල්ලා මට මගෙ දුවව වළදාන්න ඉඩ දෙන්න"

"හොඳයි එඩ්වඩ්".

ඔහුට තනි වීමට ඇවැසි බව දුටු මම නිවසින් පිටතට ගියෙමි. දේවස්ථානය වෙත ගොස් හිඳ ගන්නා විටත් එඩ්වඩ් ඇඩිලේට "දුව" යැයි ඇමතීම ගැන මම කම්පිතව සිටියෙමි. මට සෙලින් හා එඩ්වඩ්ගේ සබඳතාව සිහි විය. ඇඩිලේ යනු එඩ්වඩ් සෙලින්ගෙන් ලැබූ දරුවා ය. ඒ දරුවාගේ වියෝගය ඔවුන් දෙදෙනා නැවත සමීප කරයිද? එඩ්වඩ් මට ආදරේ බව මම දනිමි. එහෙත් මිනිසකුට එක වර ගැහැණුන් දෙදෙනෙකුට ආදරය කළ හැකි ය. පූජනීය ස්ථානයක සිටිය දී පවා මසිතේ ඊර්ෂ්‍යාවන්ත සිතිවිලි නැගී ආවේය.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 77

එහෙත් කිසියම් අදිසි බලවේගයක් විසින් මා සන්සුන් කරවිය. "රහස තියෙන්නෙ ඇඩ්ලේ ළඟ. එයා ගැන එඩ්වඩ්ගෙන් අහන්න" ඒ බලවේගය මට කීවේ ය.

පසුදින ඇඩ්ලේ වළ දමූ අපි තෝන්ෆීල්ඩ් වෙත ගියෙමු. මුළු ගෙය ම කළු ගැසී අපිරිසිදු වී ඇත. ජනෙල් කැඩී ගොසිනි. එඩ්වඩ් පඩිපෙළ දිගේ හැකි උපරිම දුරක් නැග උඩු මහල දෙස බලා සුසුම් ලමින් බිමට බසිනු මම දිටිමි. මුළු නිවස ම එකම අවුල් ජාලයකි.

"ඔයාගෙ ලස්සන ගේ ගැන දුක් වෙන්න එපා ජේන්"

"නෑ. ඔක්කොම ආපහු හදලා ගන්න පුළුවන්නෙ"

"ඔව්. උඩ තට්ටුවෙ නම් ගොඩක් වැඩ තියෙයි". ඔහු තුළ ඇති දුක්මුසු බව නිවසේ තත්වය නිසා ඇති වූවක් නොවන බව මට පෙණිනි.

"ගින්න පටන් ගත්තෙ උඩ තට්ටුවෙන් වගේ. අපි එළියට යමුද?"

උද්‍යානය දෙසට යත් ම මම සෙමින් කටහඬ අවදි කළෙමි.

"එඩ්වඩ්, මට කියන්න. මෙතන මොකක් හරි රහසක් තියනවා. ඔයා ඉන්නෙ හරියට ඔලුව උඩ මහ බරක් තියනවා වගේ. මං ඔයාගෙ නෝනා. ඇයි ඔය දුක මා එක්ක බෙදා ගන්න බැරි? මමත් ලේ, මස් වලින් හැදිච්ච මනුස්සයෙක්. මං ගැන විශ්වාසයක් තියන්න ඔයාට බැරි නම් මම කොහොමද ඒක ඉවසන්නෙ?"

ඔහු එකඟ කර ගැනීම අපහසු ය. මම තව තවත් බල කරන්නට වීමි.

"ඔයා ඔය හිතන්නෙ ඇඩ්ලෙ ගැන නේද? ගින්න පටන් ගත්ත වෙලාවෙ එයා උඩ තට්ටුවට වෙලා මොකද කළේ?"

"ඔයා නම් මගෙ හිත කියවන්න දන්නවා ජේන්".

"එඩ්වඩ්, ඇඩ්ලෙ නේද ගෙට ගිනි තිබ්බෙ? ඒකයි එයා උඩ තට්ටුවෙ හිටියෙ. ලොකු ම හානිය වෙලා තියෙන්නෙත් උඩ තට්ටුවට.



එඩ්වඩ්, කලින් පාර ගේ ගිනි තිබ්බෙත් ඇඩ්ලේද? අනේ මට කියන්න. කොහොමද බර්තා මැරුණෙ?"

ඔහු ගේ ස්වරය බාල විය.

"හොඳයි. දැන් ඔයා මාව නිකම්ම අල්ල ගත්තා. ඔයයි දරුවයි ගැන මට බයයි. ඒත් දැන් මේක නොකියා හිටියොත් ඔයාට ඊට වඩා හොඳ නෑ. අවුරුදු දහයකටත් වඩා මම මේ රහස තනියම රැකගෙන හිටියා"

"මේ දේවල් පටන් ගත්තෙ ඇඩ්ලෙට අවුරුදු අටේදි. ඔයා මෙහෙට එන්න ටික කාලෙකට ඉස්සෙල්ලා. ඒ කාලෙත් මේ ළමයා හරි කපටියි".

"එක දවසක් ඇඩ්ලේ මගෙන් ඇහුවා "පපා ඔයා මගෙ මමාව බැඳලා මෙහෙට එක්කන් එනවද? එතකොට තුන් දෙනාට එකට ඉන්න පුළුවන්" කියලා. ඒ පාර මං කිව්වා "එහෙම කරන්න බැනෙ ඇඩ්ලේ. මමා මැරිලනෙ" කියලා.

"ඒ පාර ඇඩ්ලෙ ඇහුවා මමා මැරිලා නැත්නම් මෙහෙට එක්කන් එනවද කියලා. කොහොම හරි ජේන් එතකොටත් මේ ළමයා දැන ගෙන හිටියා සෙලින් මැරිලා නෑ කියලා. ඒක සමහර විට පොඩි කාලෙට හිතින් මවා ගත්තු දෙයක් වෙන්නැති"

"ළමයින්ගෙ ප්‍රශ්න කව්ද ගණං ගන්නෙ. ඉතිං මං කිව්වා මමා හිටියත් මට එයාව බඳින්න බෑ කියලා. ඒත් මේ කතාව මම සුළුවට හිතුවට ඒකෙන් පස්සෙ තමයි ඇඩ්ලේ බර්තාව මරන්න ගෙට ගිනි තිබ්බෙ. කොහොම හරි ළමයා දැනගෙන තියනව උඩ තට්ටුවෙ ඉන්නෙ මගෙ නෝනා බව. කොහොම හරි මේ ළමයා හරි බුද්ධිමත්. එයා හිතන්නැති බර්තා මැරුණහම මට එයාගෙ මමාව බඳින්න පුළුවන් කියලා. බර්තා හිටි ගමන් කාමරෙන් එළියට පැනලා ගේ පුරා ම දුවනවා. ඇඩ්ලේ මේ හැම දෙයක් ම බලං ඉඳලා එයාගෙ සැළැස්ම හදාගන්නැති. එක දවසක් බර්තා ඒ වගේ කාමරෙන් පැනලා හැම තැන ම ඇවිදලා ආපහු කාමරේට ගියාට පස්සෙ ඇඩ්ලෙත් පස්සෙන් ගිහින්



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 78

බර්තාගේ කාමරේ යතුරුදාලා පල්ලෙහාට ඇවිල්ලා ගෙට ගිනි තියලා තියනවා".

"මුළු ගේ ම ගිනි ගන්න වෙලාවෙ ඇඩිලේ අනිත් අයත් එක්ක එළියෙ හිටියා. මාව දක්කම එයා කිව්වා බර්තා මැරුණහම පපාට මමාව බඳින්න පුළුවන් නේද කියලා. එයා ඒක කිව්ව භයානක විදිය! ජේන්, එයා එහෙම කියලා බර්තා ගේ කාමරේ යතුර පෙන්නුවා. හරියට තරහයකින් දිනලා ගත්ත කුසලානයක් පෙන්නනවා වගේ. මං යතුර උදුරලා අරගෙන ගෙට දිව්වා. එයාට හිතෙන්නැතුව ඇති මං එහෙම කරයි කියලා. පොඩි එකානෙ. කොහොම හරි මං ඇතුළට ගියාට පස්සෙ ඇඩිලෙත් මගෙ පස්සෙන් එන්න හදලා තියනවා"

"පස්සෙ මම ලෙඩ වෙලා හිටපු කාලෙ එක දවසක් ඇඩිලේ මා ගාවට ආවා. එයා කළ වැරැද්දට දුක් වෙන පාටක් තිබුණෙ නෑ. එයා නටබුන් අස්සෙ තිබිලා පරණ උණුවෙච්ච යතුරක් හොයාගෙන. එයා හිතුවා ඒක තමයි බර්තාගේ කාමරේ යතුර කියලා. එයා මට ඒක පෙන්නුවෙ නිධානයක් වගේ. හරියට ඒක අපේ ජයග්‍රහණයේ සංකේතය වගේ. දැන් මගෙ මමාව බඳිනවා නේද කියලා එයා ඇහුවා. මගෙ ම ලේ වලින් හැදිච්ච මේ ළමයා ගැන මං කොහොමද ලෝකෙට කියන්නෙ? එයාව ආරක්ෂා කරන්න ගිහින් මං ඔයාට කොච්චර දුකක් දුන්නද ජේන්!"

මම ඔහු ගේ අත ගත්තෙමි.

"ඔයා කළේ හොඳයි කියලා හිතපු දේනෙ. ඔයා හිතන්නැති එයා වෙනස් වෙයි කියලා. ඒක තනියම විඳ දරා ගන්න පුළුවන් බරක් නෙවෙයි".

"මට සතුටුයි දැන් ඒක ඉවර එක ගැන. දැන් ඔයා ඔක්කොම දන්නවනෙ. මම විතරයි මේක දැනං හිටියෙ. මං බලං හිටියෙ එයා වෙනස් වෙයි කියලා. මේ කිසි දෙයක් ෆර්න්ඩීන් වලදිවත් මට ඔයාට කියන්න බැරි වුණා".

"පව් ඇඩිලේ"



"ඔයා නම් දෙව් දුවක් ජේන්"

එසේ නොවන බව මම දනිමි. එහෙත් මේ කතාව ඇසීමෙන් මා සිටියාට වඩා යහපත් කෙනෙකු වී සිටිමි.

ආපසු එන අතරේ ඔහු දිගට ම කතා කළේ ය.

"එයා ආපහු තෝන්ෆීල්ඩ් ආවහම මං හිතුවා එයා වෙනස් වෙයි කියලා. ඒත් එයා හිටියටත් වඩා නරක් වෙලා තිබුණා. මං හිතුවා එයාට කරුණාවෙන් සැළකුවොත් එයා හොඳ වෙයි කියලා. මං හිතුවා එයාගෙ ලස්සන වෙස්මූණ පිටිපස්සෙ තිබුණු නපුරුකම ඔයා එක්ක ඉන්නකොට නැතිවෙයි කියලා. ඒකයි එදා කරත්තෙ ගෙනිච්ච එකටත් මං සමාව දුන්නෙ. කොහොම හරි මට මේ ඔක්කොම දරා ගන්න බැරි තැන මම ජෙරමිට දඬුවම් කළා"

"ජේන් මං දන්නවා, මං ආපහු සෙලින්ට ආදරේ කරනවා කියලා ඔයා බයෙන් හිටියෙ. ඒත් මං ඔයාට කොහොම කියන්නද? මං ගියේ ඇඩිලෙ ඇත්තට ම මගේ දරුවෙක් ද කියලා දැන ගන්න. මං දැනං හිටියෙ නෑ ඇඩිලෙ ඔයාව මරන්න හදපු බව. ඒ වුණාට මං එයාව සැක කළා. ඉතිං ජේන් ඔයා දරුවෙක් ලැබෙන්න අසනීපෙන් ඉඳිද්දි මං කොහොමද ඔයාට මේවා කියන්නෙ?"

"මං වැරන්ස් නෝනගෙන් ඇහුවා ඇඩිලේ මගෙ දරුවෙක් ද කියලා. එයා නිකං මාව මැඩෙව්වා විතරයි. මං කොච්චර මෝඩද? ලෙඩ වෙලා ඉඳිද්දිත් ඔයාව තනියම දාලා ගියා. ඔයා කොච්චර නිර්භීත විදියට ද ඒකට මූණ දුන්නෙ."

"එච්චර නිර්භීත විදියට නෙවෙයි". සෙලින්ගේ සුන්දරත්වය ගැන සිතමින් මා දුක් වූ හැටි සිතින් සිහි කරමින් මම කීවෙමි.

අපි ඇඩිලේ ගේ සොහොන වෙත ගියෙමු.

"ග්‍රේස් පූල් ඔක්කොම දැනං හිටියා"

"ආ.... ඒක ද ඔයා එයාව වැඩට ගත්තෙ?"

"ඔව්. මැන්චෙස්ටර් වලදි හම්බ වෙච්ච වෙලාවෙ එයා ඒක මගෙ කටින් අල්ල ගත්තා. මුලදි එයා හිතලා තියෙන්නෙ එයාගෙ



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 79

වැරැද්දෙන් ගින්න ඇති වුණා කියලයි. ඒත් පස්සෙ කාලෙක බීම නැවැත්තුවට පස්සෙ එයාට ඇත්ත තේරිලා තියනවා"

"බලන්න ජේන්. ඇඩ්ලේ මෙච්චර නපුරු වෙයි කියලා මං කොහොම හිතන්නද? එයාගෙ මමා වෙනුවෙන් එයා දෙන්නෙක්ගෙ ජීවිත නැති කරන්න හැදුවා. ඔයා කිව්වහම කව්ද පිහියෙන් අනින්න ආවා කියලා, මං හිතා ගත්තා ඇඩ්ලෙට දඬුවම් නොකර හරියන්නෑ කියලා".

"එයාට අමුතු පිස්සුවක් තිබුණෙ. ඔය වගේ අය මේ ලෝකෙ ඉන්නවා. ඔයා මොනවා කළත් වැඩක් නෑ එඩ්වඩ්. එයා වෙනස් වෙන්නෑ. ඉතිං ඔයා ඔයාටම දොස් කියා ගන්න එපා".

"ඇඩ්ලේව පරිස්සම් කරන්න ගිහින් මේසන්ලත් මාව සැක කළා. ඔක්කොම ප්‍රශ්න ඇති වුණේ ඒකෙන්".

"දැන් ඔක්කොම ඉවරයිනෙ. වෙච්ච දේවල් නිසා අපට තවත් අත්දැකීම් ලැබුණා".

"ඒකෙන් අපි තවත් ළං වුණා. ගෙට යමු නේද?"

"නෝර්ටන්ගෙ ගෙදර මිසිස් පූල්ට ඉන්න පුළුවන් වෙයි. එහෙ පාලිකාව විශ්‍රාම යනවලු"

"ෆර්න්ඩීන් වලදි අපට එයා ඕනැ නෑ. මිසිස් පූල්ගෙ අර අමුතු බැල්ම බ්ලාන්ච්ට නම් එපා වෙයි".

අවසන් අප්‍රසන්න සිදු වීමත් සිදු විය. මා තිවසේ තනිව සිටි මොහොතක රෝලන්ඩ් නෝනා ආවා ය. ඇය පිටත්ව යාමට සැරසී සිටී. කෙසේ වුවත් ඈ ඇඩ්ලේව බලා ගත් නිසා මා එයට කළ ගුණ සැළකිය යුතු ය.

"රොචෙස්ටර් නෝනා, මං දන්නවා ඔයා මට අකමැති බව. මං ආවෙ යන්න කලින් ඔයාට කතා කරලා යන්න".

"ඇඩ්ලේව බලා ගත්ත එකට මම ණය ගැතියි"

"ඒත් මං කළේ රොචෙස්ටර්ලා වෙනුවෙන් නෙවෙයි. සෙලින් වෙනුවෙන්"



"එහෙනම් ඉතිං අපට ආයුබෝවන් කියන එක විතරයි තියෙන්නෙ"

"නෑ. මම ආවෙ ඔයාට අවවාද කරන්න. රොචෙස්ටර් කිව්වෙ ඔක්කොම බොරු. අන්තිමට ඔක්කොම වැරදි අර මැරිච්ච ළමයගෙ පිට දැම්මා නේද? කොහොම වුණත් දැන් ඒ ළමයා මැරිලනෙ. දැන් එයාගෙන් අහන්න බැනෙ"

"බලන්න, බලන්න! රොචෙස්ටර් කියන කතාව කොහොම පිළිගන්නද? මේ හැම දේක ම සැළැස්මක් තියනවා. ඔයා මැරුණහම එයාට සෙලින්ව බඳින්න පුළුවන්. එයා ඒ ගැන සෙලින් එක්ක කතා කරලා තියනවා".

"තවත් මට මේවා අහන්න ඕන කමක් නෑ. යනවා යන්න". යන්නට ගිය ඇය ආපසු හැරුණා ය.

"මං ආවෙ ඔයාට කරදර කරන්න නෙවෙයි. ඇඩ්ලේ පණ අදිද්දි ම රොචෙස්ටර් මේවා කියන්න පටන් ගත්තා. මගෙ මැරිච්ච නංගිගෙ නාමෙන් මං මේ කියන්නෙ. රොචෙස්ටර් විශ්වාස කරන්න එපා".

ඇය යන්නට ගියා ය.

ඇගේ පැමිණීම ගැන මම එඩ්වඩ්ට නොකීමි.

අප තෝන්ෆීල්ඩ් හැර දමා ගියත් මට සම්පූර්ණයෙන්ම එය අත් හැරිය නොහැක. සේන්ට් ජෝන් ගේ සැළැස්මට අනුව ගමේ පාසලක් ඇරඹෙනු ඇත. රෙදි වියන කර්මාන්ත ශාලාවක් ද ඇරඹීමට නියමිත ය.

අප තෝන්ෆීල්ඩ් වල ගත කළ කාලය ශෝකාන්තයක් ම විය. එහෙත් අපි අසල්වාසීන් අත් නොහරිමු. අවාසනාව තුළින් වාසනාවක් උදා වන අවස්ථා ද ඇත. ජෝන වොඩ් මහතාගේ උප දේවගැති තනතුරට පත් වී, වොඩ් මහතා විශ්‍රාම ගිය පසු දේවගැති තනතුර ලබනු ඇත.



UPLOADED BY ELIFE
WWW.EXPRESSLANKA.TK 80

නොබෝ දිනකින් අපි නැවත ෆරන්ඩනයේ නිහඬ ජීවිතය වෙත යන්නෙමු. හදවතේ එක් කොණකින් තෝන්ෆීල්ඩ්හි රොචෙස්ටර් මැතිණිය යන නාමය අත් හැරීම ගැන මට දුකක් ඇතිවේ. එහෙත් හදවතේ විශාල කොටසකින් මම මගේ දරුවන් සහ මගේ ජීවිතයේ සතුට සහ මගේ ආත්මයේ කොටසක් වන ආදරණීය එඩ්වඩ් සමග ෆර්න්ඩීනයේ ගත කිරීමට යන ප්‍රීතිමත් ජීවිතය ගැන ඉත සිතින් සතුටු වෙමි.

SLU NOVELS

UPLOADED BY ELIFE